# 2

# ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම

## 2.1 සමස්ත නිරීක්ෂණ

**ශ්‍රී ලංකා ආර්ථිකය 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව සමස්තයක් වශයෙන් හිතකර රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති මෙන්ම යහපත් කාලගුණික තත්ත්වයක් පැවැතීම හේතුවෙන්, දේශීය මෙන්ම විදේශීය වශයෙන් වූ අභියෝග හමුවේ වුවද, 2015 වසරේ දී සියයට 4.8 කින් වර්ධනය විය.** දේශීය වශයෙන් ගත් කල, උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පැවැතීම මෙන්ම පොලී අනුපාතික ද අඛණ්ඩව අඩු මට්ටමක පැවැතීම ආර්ථික වර්ධනය සඳහා බෙහෙවින් උපකාරී විය. තවද, රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම සහ ඇතැම් භාණ්ඩවල පරිපාලිත මිල ගණන් පහත දැමීම වැනි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ද ඉල්ලුම කෙරෙහි ධනාත්මකව දායක විය. කෙසේ වුවද, පාලන කටයුතුවල පාරදෘශ්‍යභාවය වර්ධනය කිරීම උදෙසා සිදු කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ ඊට අනුරූපව මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති නැවත ඇගයීමට ලක්කිරීම මෙම වසර තුළ සමස්ත ආර්ථික වර්ධනය යම් පමණකට සීමා වීමට ද ආර්ථිකයේ ළඟාකර ගත හැකිව තිබූ නිෂ්පාදන ධාරිතාවයේ වර්ධනය යම් පමණකට පමා වීමට ද හේතු විය. විදේශීය අංශය ගත් කල, ලෝක ආර්ථිකයේ මන්දගාමී වර්ධනය දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද බලපාන ලදී. නිෂ්පාදන ප්‍රවේශයේ ඇස්තමේන්තු සලකන විට සමස්තයක් ලෙස සේවා, කර්මාන්ත හා කෘෂිකර්ම යන ක්‍රියාකාරකම් ආර්ථික වර්ධනයට ධනාත්මක දායකත්වයක් දක්වන ලදී. මෙහිදී ප්‍රධාන වශයෙන් 2015 වසරේ පැවැති අඩු පොලී අනුපාතික හේතුවෙන් ඉහළ වර්ධනයක් වාර්තා කරන ලද මූල්‍ය සේවා ද ඇතුළු සේවා ක්‍රියාකාරකම් සමස්ත ආර්ථික වර්ධනය සඳහා වැඩිම දායකත්වයක් දක්වන ලදී. කර්මාන්ත ක්‍රියාකාරකම් සාපේක්ෂව මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලද අතර, මහා පරිමාණ ඉදිකිරීම් මන්දගාමී වීම මේ සඳහා හේතු විය. මේ අතරතුර දී, පැවැති යහපත් කාලගුණික වාතාවරණය කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා බෙහෙවින් උපකාරී විය.

**වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තු සැලකීමේ දී පරිභෝජන වියදම් වර්ධනය කරමින් වසර තුළ දී ගෘහ ඒකකයන්හි වැය කළ හැකි ආදායම වැඩි වීම සමගම දේශීය ඉල්ලුම ඉහළ යෑම නාමික මෙන්ම මූර්ත වශයෙන් ද සමස්ත වියදම වර්ධනය වීම සඳහා ප්‍රධාන ලෙස හේතු විය.** ඉහළ තරගකාරිත්වයක් පැවැති මහ මැතිවරණය රාජ්‍ය ආයෝජන කෙරෙහි මෙන්ම ආයෝජකයන්ගේ ඉදිරි ආයෝජන සැලසුම් කෙරෙහි ද බලපෑම වැනි විවිධ හේතූන් මත ආයෝජන වියදම වසර තුළ දී මන්දගාමී විය. මේ අතර, මූර්ත වශයෙන් ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි අයහපත් තත්ත්වයක් දක්නට ලැබුණු අතර, අපනයනවලට සාපේක්ෂව ආනයන වැඩි වේගයකින් වර්ධනය වීම මේ සඳහා හේතු විය. ලෝක වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් අඩු මට්ටමක පැවැතීම සහ ණය පහසුකම් වර්ධනය වීම ආනයන ඉල්ලුම අඛණ්ඩව ඉහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, වසරේ අවසාන සමයේ දී රුපියල ක්‍රමිකව අවප්‍රමාණය වීම, පොලී අනුපාතික ඉහළ යෑම සහ

ඇතැම් ආනයන කාණ්ඩවලට අදාළ බදු සංශෝධනය කිරීම මෙම ආනයන වර්ධනය යම් තරමකට පාලනය වීමට ඉවහල් විය. තවද, සංවර්ධිත ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම සඳහා අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි කාලයක් ගතවීම, චීනයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ රුසියාව හා මැදපෙරදිග කලාපයේ අයහපත් ආර්ථික වාතාවරණයක් පැවැතීම අපනයන ඉල්ලුම කෙරෙහි අයහපත් ලෙස බලපාන ලදී. කෙසේ වුවද, වසර තුළ දී ආනයන මිල ගණන්වල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීමට සාපේක්ෂව අපනයන මිල ගණන් අඩු වේගයකින් පහත වැටුණු අතර, මේ බව වෙළඳ මිල අනුපාතයේ වර්ධනය තුළින් ද පිළිබිඹු වේ. මේ අතර, ශුද්ධ සේවා අපනයනය ද 2015 වසරේ දී වර්ධනය විය. ඒ අනුව, ශුද්ධ විදේශීය ඉල්ලුම නාමික වශයෙන් සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. රජයේ නිර්-ඉතුරුම් ඉහළ යෑම මෙන්ම

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (අ)(ආ)**
**(2010 ස්ථාවර මිල අනුව)**

| ආර්ථික කටයුතු | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි. හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2014(ඇ) | 2015 | 2014(ඇ) | 2015 | 2014(ඇ) | 2015 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **4.9** | **5.5** | **7.8** | **9.0** | **7.8** | **7.9** |
| ධාන්‍ය වගාව (වී හැර) | 4.3 | 1.0 | 0.2 | 0.0 | 0.2 | 0.2 |
| වී වගාව | - 7.0 | 23.3 | - 1.2 | 3.6 | 0.7 | 0.9 |
| එළවළු වගාව | 2.1 | 24.9 | 0.3 | 3.5 | 0.7 | 0.8 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | - 6.3 | - 14.5 | 0.0 | - 0.1 | 0.0 | 0.0 |
| පළතුරු වගාව | 9.4 | 16.5 | 0.9 | 1.7 | 0.5 | 0.6 |
| තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 20.1 | 5.1 | 2.8 | 0.8 | 0.8 | 0.8 |
| තේ වගාව | - 1.1 | - 2.6 | - 0.2 | - 0.5 | 0.9 | 0.8 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 16.4 | - 18.1 | 0.1 | - 0.1 | 0.0 | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 13.1 | 1.3 | 1.7 | 0.2 | 0.7 | 0.7 |
| රබර් වගාව | - 24.5 | - 10.1 | - 2.4 | - 0.7 | 0.3 | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 7.3 | 2.8 | 0.3 | 0.1 | 0.2 | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 31.0 | 8.0 | 3.0 | 1.0 | 0.6 | 0.6 |
| පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 6.4 | 0.1 | 0.2 | 0.0 | 0.1 | 0.1 |
| වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 10.2 | 1.9 | 1.2 | 0.2 | 0.6 | 0.6 |
| ධීවර කර්මාන්තය | 3.7 | - 2.7 | 1.1 | - 0.8 | 1.5 | 1.4 |
| **කර්මාන්ත** | **3.5** | **3.0** | **19.6** | **16.5** | **26.7** | **26.2** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.2 | - 0.9 | 1.2 | - 0.5 | 2.5 | 2.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 2.3 | 4.7 | 7.6 | 15.5 | 15.7 | 15.7 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 3.3 | 7.8 | 0.7 | 1.6 | 1.0 | 1.0 |
| ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 4.8 | 4.3 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 11.9 | 24.8 | 0.5 | 1.1 | 0.2 | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 6.6 | - 0.9 | 9.6 | - 1.3 | 7.2 | 6.8 |
| **සේවාවන්** | **5.2** | **5.3** | **59.9** | **62.6** | **56.3** | **56.6** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 4.0 | 4.6 | 19.3 | 22.5 | 23.3 | 23.2 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 11.6 | 12.5 | 1.2 | 1.4 | 0.5 | 0.6 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 8.1 | 12.3 | 18.6 | 29.6 | 11.5 | 12.3 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 4.3 | 1.3 | 11.0 | 3.3 | 12.2 | 11.8 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 5.5 | 3.2 | 9.8 | 5.8 | 8.8 | 8.7 |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **4.7** | **4.6** | **87.3** | **88.1** | **90.8** | **90.7** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 6.9 | 6.2 | 12.7 | 11.9 | 9.2 | 9.3 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **4.9** | **4.8** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -2.9 | -3.7 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **4.9** | **4.8** | | | | |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත


මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පෞද්ගලික ඉතුරුම් මන්දගාමී වීම හේතුවෙන් 2015 වසර තුළ දී දේශීය ඉතුරුම් අඩු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අතරතුර දී, විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම පෙර වසරට සාපේක්ෂව මන්දගාමී වූ අතර, ශුද්ධ ප්‍රාථමික ආදායම පහත වැටිණි. එබැවින් පෙර වසරට සාපේක්ෂව ජාතික ඉතුරුම් මන්දගාමී ලෙස වර්ධනය වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස ද පහත වැටිණි. කෙසේ වුවද, ජාතික ඉතුරුම්වලට සාපේක්ෂව ආයෝජන වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කිරීම හේතුවෙන් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2015 වසර තුළ දී රටෙහි ජාතික ඉතුරුම් හා ආයෝජන අතර පරතරය අඩු විය. ආදායම් ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව ආර්ථිකයේ ආදායම ජනනය කරන ප්‍රධාන සංරචකය වශයෙන් රටෙහි දළ මෙහෙයුම් අතිරික්තය හඳුනාගත හැකි අතර, ගෘහ ඒකක අංශය රටෙහි ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ ආයතනික අංශය ලෙස සඳහන් කළ හැක.

## 2.2 ද.දේ.නි., ඒක පුද්ගල ද.දේ.නි. සහ දළ ජාතික ආදායම (ද.ජා.ආ.)

**පවත්නා වෙළඳපොළ මිල අනුව සලකන විට ද.දේ.නි. 2014 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10,448.5 (එ.ජ.ඩොලර් බිලියන 80.0) ක වටිනාකමට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 11,183.2 (එ.ජ.ඩොලර් බිලියන 82.3) ක් දක්වා වර්ධනය විය.** ඒ අනුව, පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.9 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 7.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙම අඩු වර්ධනය ද.දේ.නි. හි මූර්ත වර්ධනය හා ගම්‍ය මිල අවධමනකයේ සිදු වූ මන්දගාමීත්වයේ සංයුක්ත ප්‍රතිඵලයකි. ද.දේ.නි.යේ මූර්ත අගය 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.8 කින් වර්ධනය විය. ඒ අනුව, 2014 වසරේ දී රුපියල් බිලියන 8,229.0 ක් වූ ස්ථාවර මිල අනුව ද.දේ.නි. 2015 වසරේ දී රුපියල් බිලියන 8,622.8 ක් දක්වා වර්ධනය විය. එසේම, ද.දේ.නි. ගම්‍ය අවධමනකය 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.9 සිට 2015 වසරේ දී සියයට 2.1 ක් දක්වා පහත වැටිණි.

**2.1 රූප සටහන** **වාර්ෂික වර්ධන අනුපාතිකය (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

**ඒක පුද්ගල ද.දේ.නි., 2014 වසරේ දී වාර්තා කළ රුපියල් 503,032 ට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් 533,398 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.** මෙය 2014 වසරේ දී වාර්තා කළ සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 6.0 ක වර්ධනයකි. මේ සඳහා, මධ්‍ය වාර්ෂික ජනගහනයෙහි වර්ධන අනුපාතය යම් ස්ථාවර මට්ටමක පවතින අතරතුර දී වුව ද ද.දේ.නි. නාමික ලෙස වර්ධනය වීම බෙහෙවින් දායක විය. එක්සත් ජනපද ඩොලර් අගය අනුව ගණනය කිරීමේ දී ද ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ද.දේ.නි. 2014 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් 3,853 සිට 2015 වසරේ දී එ.ජ.ඩොලර් 3,924 ක් දක්වා වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ද.දේ.නි. හි නාමික වටිනාකම අඩු වේගයකින් වර්ධනය වීම හේතුවෙන් ඒක පුද්ගල ද.දේ.නි.යෙහි එ.ජ.ඩොලර් අගය 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.7 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 1.8 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.

**ද.දේ.නි. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායමට ගලපා ඇස්තමේන්තු කරන ලද ද.ජා.ආ. 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.0 ක නාමික වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී රුපියල් බිලියන 10,932 ක් දක්වා සියයට 7.1 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් ඉක්මවා විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් සේවක වැටුප් හා ආයෝජන ආදායම්වලින් සමන්විත වන විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම තව දුරටත් සෘණ අගයක පැවැතුණි. මෙම ප්‍රාථමික ආදායමේ සෘණ වර්ධනය 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළ දී සේවක වැටුප් මෙන්ම ආයෝජන ආදායම් ද පහත වැටීමේ සංයුක්ත ප්‍රතිඵලයකි.

## 2.3 ආයතනික අංශයන්හි දායකත්වය

**නිෂ්පාදන ඇස්තමේන්තු යටතේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ආර්ථික ක්‍රියාකාරකම්වල දළ එකතු කළ අගය, මූල්‍ය නොවන ආයතන අංශය, මූල්‍ය ආයතන අංශය, රාජ්‍ය අංශය, ගෘහ ඒකක අංශය සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන වශයෙන් තවදුරටත් වර්ගීකරණය කළ හැකිය. ජාතික ගිණුම් ඇස්තමේන්තු**

**2.2 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගය (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | | | | 2015 | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. තො. ගෘ. සේ. ආ.* අංශය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. තො. ගෘ. සේ. ආ.* අංශය |
| කෘෂිකර්මාන්තය | 17.5 | - | - | 82.5 | 18.1 | - | - | 81.9 |
| කර්මාන්ත | 60.2 | - | 3.2 | 36.6 | 60.5 | - | 2.6 | 36.9 |
| සේවාවන් | 24.6 | 7.3 | 13.9 | 54.2 | 23.7 | 7.4 | 15.3 | 53.7 |
| මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය | 34.9 | 4.4 | 9.4 | 51.2 | 34.5 | 4.5 | 10.1 | 51.0 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
* ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කිරීමේ ක්‍රියාවලියේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන එක්ව සලකනු ලබයි. 2014 සහ 2015 වසර සඳහා වූ ආංශික ඇස්තමේන්තු සලකා බැලීමේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය ආර්ථිකය සඳහා විශාලතම දායකත්වය දක්වා ඇත. 2014 වසරේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය විසින් ආර්ථිකයට සියයට 51.2 ක දායකත්වයක් දක්වා ඇති අතර, 2015 වසරේ දී එම දායකත්වය සියයට 51.0 ක් විය. ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය නාමික වශයෙන් 2014 දී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.1 කින් වර්ධනය විය. මේ අතරතුර දී, ආර්ථිකයේ දෙවන විශාලතම අංශය වන මූල්‍ය නොවන ආයතන අංශය 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.5 ක නාමික වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.3 කින් වර්ධනය වෙමින් ආර්ථිකයට සියයට 34.5 ක දායකත්වයක් දක්වා ඇත. තවද, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය 2014 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 14.3 ක හා සියයට 13.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී පිළිවෙළින් සියයට 13.6 කින් හා සියයට 7.8 කින් වර්ධනය විය. ඒ අනුව, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය 2015 වසරේ දී පිළිවෙළින් ආර්ථිකයේ සියයට 10.1 කට හා සියයට 4.5 කට දායකත්වය දක්වා ඇත.

**2015 වසර තුළ දී කෘෂිකාර්මික මෙන්ම සේවා කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය දායකත්වය දක්වා ඇති අතර, කර්මාන්ත කටයුතු සඳහා මූල්‍ය නොවන ආයතන අංශය වැඩිම දායකත්වය දක්වා ඇත.** ඒ අනුව, 2015 වසරේ දී කෘෂිකාර්මික කටයුතුවල දළ එකතු කළ අගයෙන් සියයට 81.9 ක් ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය වෙතින් ජනනය වී ඇති අතර, සෙසු ප්‍රමාණය සඳහා මූල්‍ය නොවන ආයතන අංශය දායකත්වය දක්වා ඇත. බොහෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය දක්වන දායකත්වය, එම කටයුතු සඳහා මූල්‍ය නොවන ආයතන අංශය දක්වන දායකත්වයට වඩා වැඩිය. ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය විසින් කෘෂිකාර්මික කටයුතුවල කරදිය ධීවර කර්මාන්තය සඳහා වැඩිම දායකත්වයක් දක්වා ඇති අතර, මූල්‍ය නොවන ආයතන අංශය විසින් සත්ත්ව නිෂ්පාදනය හා තේ වගාව සඳහා ඉහළ දායකත්වයක් දක්වා ඇත. මේ අතරතුර දී, 2015 වසරේ කර්මාන්ත කටයුතුවල දළ එකතු කළ අගයෙන් සියයට 60.5 කට මූල්‍ය නොවන ආයතන අංශය දායකත්වය දක්වා ඇති අතර, සියයට 36.9 කට ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය විසින් හා සියයට 2.6 කට රාජ්‍ය අංශය විසින් දායකත්වය දක්වා ඇත. 2015 වසරේ දී කර්මාන්ත කටයුතු අතරින්, මූල්‍ය නොවන ආයතන අංශයේ මෙන්ම ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශයේ ද වැඩිම දායකත්වය ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදනය සඳහා වූ අතර, රාජ්‍ය අංශයේ දායකත්වය ඉදිකිරීම් කටයුතු සඳහා විය. මේ අතරතුර දී, සේවා කටයුතුවල දළ එකතු කළ අගයෙන් සියයට 53.7 කට ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන්

තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය විසින් දායකත්වය දක්වා ඇති අතර, මූල්‍ය නොවන ආයතන අංශය විසින් සියයට 23.7 කට දායකත්වය දක්වා ඇත. තවද, 2015 වසරේ දී සේවා අංශය සඳහා රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය විසින් පිළිවෙළින් සියයට 15.3 කට හා සියයට 7.4 කට දායකත්වය දක්වා ඇත. සේවා අංශය සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශයෙහි වැඩිම දායකත්වය ප්‍රවාහන කටයුතු තුළින් ජනනය වී ඇති අතර, මූල්‍ය නොවන ආයතන අංශය විසින් තොග හා සිල්ලර වෙළඳාම සඳහා වැඩිම දායකත්වය සපයා ඇත. රාජ්‍ය අංශය විසින් සිය ඉහළම දායකත්වය රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය සඳහා දක්වා ඇති අතර, මූල්‍ය ආයතන අංශය විසින් මූල්‍ය සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් සඳහා වැඩිම දායකත්වය දක්වා ඇත.

## 2.4 නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

### කෘෂිකර්මාන්තය

**කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ දී අත්කර ගත් සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.5 කින් වර්ධනය විය.** වසර තුළ දී ලද වාර්තාගත අස්වැන්න මගින් පිළිබිඹු වන වී වගාවේ සිදු වූ සැලකිය යුතු වර්ධනය සහ එළවළු වගාවෙන් ලැබුණු සැලකිය යුතු දායකත්වය කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා බෙහෙවින් දායක විය. තවද, පළතුරු වගාව, සත්ත්ව නිෂ්පාදනය සහ තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම්) ද මෙම වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. එසේම, වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන, කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව, වෙනත් බහුවාර්ෂික භෝග සහ ධාන්‍ය වගාව, පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්, කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. කෙසේ වුවද, ධීවර කර්මාන්තයේ මෙන්ම රබර්, තේ, උක්, දුම්කොළ ඇතුළු වෙනත් බහුවාර්ෂික නොවන භෝග සහ වෙනත් පානීය භෝග (කෝපි, කොකෝවා ආදී) වගා කටයුතුවල සිදු වූ පහත වැටීම කෘෂිකාර්මික කටයුතුවල සමස්ත වර්ධනයට අහිතකර ලෙස බලපාන ලදී.

**2.3 සංඛ්‍යා සටහන** **කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (2007-2010 = 100)**

| අයිතමය | 2014 (අ) | 2015 (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2013/14 | 2014/15 |
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 119.9 | 127.6 | -1.6 | 6.4 |
| 1. කෘෂිකාර්මික | 111.3 | 121.6 | -3.3 | 9.3 |
| 1.1 කෘෂිකාර්මික භෝග | 108.1 | 118.2 | -4.3 | 9.3 |
| වී | 90.4 | 128.9 | -26.9 | 42.6 |
| තේ | 108.5 | 105.6 | -0.5 | -2.7 |
| රබර් | 73.5 | 66.0 | -24.4 | -10.2 |
| පොල් | 101.3 | 107.9 | 14.2 | 6.5 |
| අනෙකුත් භෝග | 139.2 | 142.1 | 11.1 | 2.1 |
| එළවළු | 135.8 | 136.1 | 0.5 | 0.2 |
| පළතුරු | 139.7 | 152.8 | 22.0 | 9.4 |
| අනෙකුත් ක්ෂේත්‍ර භෝග | 140.5 | 144.6 | 8.4 | 2.9 |
| 1.2 පශු සම්පත් | 136.2 | 147.2 | 3.1 | 8.1 |
| 2. මත්ස්‍ය | 160.4 | 155.9 | 4.4 | -2.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

**කෘෂිකාර්මික හා මත්ස්‍ය අංශයේ නිෂ්පාදිතය මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය 2014 වසරේ දී වාර්තා වූ සියයට 1.6 ක පහත වැටීමට සාපේක්ෂව 2015 වසරේ දී, සියයට 6.4 කින් වර්ධනය විය.** කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකයේ උප දර්ශක වූ වී, පොල් සහ අනෙකුත් භෝග (පලතුරු, එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර භෝග) දර්ශක පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, තේ සහ රබර් යන උප දර්ශක පහත වැටුණි. දර්ශකය මගින් පෙන්නුම් කළ පරිදි, වසර තුළ දී පශු සම්පත් අංශයේ ක්‍රියාකාරකම් වර්ධනය වූ අතර, ධීවර කටයුතුවල අඩුවීමක් වාර්තා විය.

### වී

**හිතකර ප්‍රතිපත්ති සහ යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන්, 2015 වසර තුළ දී වී නිෂ්පාදනය මෙතෙක් වාර්තා වූ ඉහළම නිෂ්පාදන මට්ටම දක්වා වර්ධනය විය.** 2014 වසර තුළ දී අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ වී නිෂ්පාදනය 2015 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 4.8 ක් දක්වා සියයට 42.6 කින් වර්ධනය විය. වසර තුළ වගා කළ සහ අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයත් සමඟ සාමාන්‍ය ඵලදාව ද වැඩිවීම, ඉහළ නිෂ්පාදනයට දායක විය. 2015 වසර තුළ දී අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,088,374 ක් දක්වා සියයට 37.3 කින් වර්ධනය වූ අතර, වී ඵලදාව 2014 වසරේ පැවැති හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,264 ට

**2.4 සංඛ්‍යා සටහන** **වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන**


| අයිතමය | ඒකකය | 2014 (අ) | | | 2015 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 651 | 313 | 964 | 773 | 481 | 1,254 |
| අස්වැන්න නෙලාගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 580 | 301 | 881 | 735 | 476 | 1,211 |
| අස්වැන්න නෙලාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 521 | 272 | 793 | 659 | 429 | 1,088 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,236 | 1,145 | 3,381 | 2,877 | 1,942 | 4,819 |
| | බුසල් දහස් | 107,155 | 54,872 | 162,027 | 137,882 | 93,091 | 230,973 |
| සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,222 | 4,204 | 4,264 | 4,364 | 4,527 | 4,429 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 3,174 | 1,588 | 4,762 | 3,114 | 2,088 | 5,202 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 600 | - | - | 286 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 858 | - | - | 409 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,429 ක් දක්වා වර්ධනය විය. වගාකරන ලද කන්න ලෙස සැලකූ විට, 2014/15 මහ කන්නය තුළ වී නිෂ්පාදනය, වාර්ෂික සමස්ත නිෂ්පාදනයෙන් සියයට 60 කට දායකත්වය ලබා දෙමින් මෙට්‍රික් ටොන් මිලියන 2.9 ක් දක්වා සියයට 28.7 කින් වර්ධනය වූ අතර, 2015 වසරේ යල කන්නය තුළ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.9 ක් දක්වා සියයට 69.7 කින් වර්ධනය විය. වී මිලදී ගැනීමේ සහතික මිල, පොහොර සහනාධාරය සහ වී අලෙවි මණ්ඩලය මගින් තොග මිලදී ගැනීම ආදිය හරහා වූ රජයේ මැදිහත් වීම, 2015 වසරේ වී අංශයේ සැලකිය යුතු වර්ධනය සඳහා දායක විය. 2015 වසරේ දී වාර්ෂික වී නිෂ්පාදනය සහල් මෙට්‍රික් ටොන් මිලියන 3.3 කට සමාන වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, එය දළ වශයෙන් මාස 17 ක දේශීය සහල් පරිභෝජන අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් වනු ඇත. වැඩිදියුණු කළ ගබඩා පහසුකම් හරහා රටේ ආරක්ෂිත වී තොග පවත්වා ගැනීමේත්, අගය එකතු කළ සහල් නිෂ්පාදන සඳහා නිෂ්පාදකයන් දිරිමත් කිරීමේත්, අතිරික්ත සහල් නිෂ්පාදන අපනයනය කිරීමේ අවස්ථා සොයා බැලීමේත් වැදගත්කම, වසර තුළ දී ඉහළ ගිය වී අස්වැන්න හා පසුගිය වසර කිහිපය තුළ දක්නට ලැබුණු නිෂ්පාදනයන්ගේ විචලනයන් තුළින් මතුකර දක්වන ලදී.

**2.2 රූප සටහන** **සහල්: සැපයුම සහ ඉල්ලුම**




**ප්‍රතිපත්තිමය වෙනස්කම් හා වෙළඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2015 වසරේ දී වී සහ සහල් මිල ගණන් උච්චාවචනය විය.** 2015 වසරේ මුල් කාලයේ දී ඉහළ මට්ටමක පැවැති සහල් මිල, 2014/15 මහ කන්නයේ ඉහළ වී අස්වැන්න සහ වසරේ මුල් කාලයේ සහල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් ක්‍රමයෙන් අඩු විය. මේ අතර, 2015 වසරේ දී ලද ඉහළ අස්වැන්න හේතුවෙන් දේශීය මිල ස්ථාවර කිරීම හා ගොවීන්ට ඉහළ මිලක් ලබාදීමේ අරමුණෙන් රජය සහල් ආනයනය මත පනවා තිබූ බදු ඉහළ නංවන ලදී. රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී ගැනුම් මිල ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් ලෙස වී මිල ක්‍රමයෙන් වැඩිවීමෙන් වසරේ සිව්වන කාර්තුව තුළ සහල් මිල යළි ඉහළ ගියේය. ඒ අනුව, 2014 වසරේ රුපියල් 84.14 ක් වූ සම්බා කිලෝග්‍රෑමයක සාමාන්‍ය සිල්ලර මිල, 2015 වසරේ දී රුපියල් 91.20 ක් වූ අතර පෙර වසරේ රුපියල් 78.37 ක් වූ නාඩු සහල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල, 2015 වසරේ දී රුපියල් 77.95 ක් විය. මේ අතර ඉහළ ආනයන බදු හේතුවෙන් වසරේ දෙවන කාර්තුවේ සිට සහල් ආනයනය අඩු වූ අතර, 2015 වසරේ දී එය මෙට්‍රික් ටොන් 285,604 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 52.4 කින් පහළ ගියේය.

### තේ

**2015 වසරේ දී තේ නිෂ්පාදනය අඛණ්ඩව දෙවන වසරටත් පහළ ගියේය.** සැපයුම් සාධකවල බලපෑම මෙන්ම ඉල්ලුම් තත්ත්වය කෙරෙහි ප්‍රතිචාර දක්වමින් 2014 වසරේ පැවැති කිලෝග්‍රෑම් මිලියන 338 ක් වූ සමස්ත තේ නිෂ්පාදනය 2015 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 329 ක් දක්වා සියයට 2.7 කින් පහළ ගියේය. සැපයුම් අංශයෙන් සලකා බැලීමේ දී, වසරේ බොහෝ කාලවල පැවැති අහිතකර කාලගුණික තත්ත්වයත්, වතු සේවකයන් ඉහළ වැටුප් ලබා ගැනීම සඳහා ජුලි මස ක්‍රියාත්මක කළ "සෙමින් වැඩ කිරීමේ" වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයත්, තේ නිෂ්පාදනයට අහිතකර ලෙස බලපාන ලදී. ඉල්ලුම් තත්ත්වයන් සැලකීමේ දී ඛනිජ තෙල් මිල ගණන් අඩු වීමේ හා භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන අපනයන ගමනාන්ත වෙතින් තේ සඳහා වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් තේ නිෂ්පාදනය කෙරෙහි ගෝලීය තත්ත්වය යහපත් මට්ටමක නොපැවතුණි. 2015 වසරේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා සියයට 85 ක පමණ දායකත්වයක් ලබාදුන් උස්බිම් හා පහත්බිම් තේ නිෂ්පාදනය පිළිවෙළින් කිලෝග්‍රෑම් මිලියන 77 ක් හා කිලෝග්‍රෑම් මිලියන 202 ක් දක්වා සියයට 2.5 කින් හා සියයට 3.6 කින් අඩු විය. කෙසේ වුවද, මැදි බිම් තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 50 ක් දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් වැඩි විය. පෙර වසරවල දී මෙන්ම, 2015 වසරේ දී ද කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය සමස්ත නිෂ්පාදනයෙන් සියයට 73 කට වැඩි දායකත්වයක් ලබාදෙමින් තේ කර්මාන්තයේ ප්‍රධාන අංශය ලෙස අඛණ්ඩව පැවැතුණි.

**2014 වසරේ සැප්තැම්බර් මස සිට දක්නට ලැබුණු තේ මිල පහළ යෑමේ ප්‍රවණතාවය 2015 වසර මුළුල්ලේම අඛණ්ඩව පැවැතුණි.** 2015 වසරේ දී ප්‍රධාන තේ ආනයනකරුවන් වෙතින් පැවැති ඉල්ලුම අඩු වීම, තේ මිල ගණන් කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහත වැටීමෙන් බලපෑමට ලක් වූ මැද පෙරදිග ආර්ථිකයන්ගෙන් වූ අඩු ඉල්ලුම හා රුසියාව හා යුක්රේනය වැනි රටවල මුදල් තියුණු ලෙස අවප්‍රමාණය වීම, තේ මිල ගණන් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල, පෙර වසරේ පැවැති රුපියල් 459.01 හා සැසඳීමේ දී 2015 වසරේ දී රුපියල් 401.46 ක් දක්වා සියයට 12.5 කින් පහත වැටුණි. කොළඹ තේ වෙන්දේසියේ දී පෙර වසරට සාපේක්ෂව වැඩිම සාමාන්‍ය මිල අඩු වීම, සියයට 14.2 කින් මිල පහත වැටුණු පහත් බිම් තේ සඳහා වාර්තා වූ අතර, මැදි බිම් තේ මිල සියයට 11.3 කින් ද උස් බිම් තේ මිල සියයට 7.1 කින් ද පහළ ගියේය. 2015 වසරේ දී සාමාන්‍ය තේ අපනයන මිල ද (නැ.වි.ස.) 2014 වසරේ පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 649.44 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 593.08 ක් දක්වා සියයට 8.7 කින් පහත වැටුණි. කුඩා තේ වතු හිමියන්ට අමු තේ දළු කිලෝග්‍රෑමයක් සඳහා ලැබුණු සාමාන්‍ය මිල 2014 වසරේ පැවැති රුපියල් 67.54 සිට 2015 වසරේ දී රුපියල් 58.80 දක්වා පහළ ගියේය. වර්තමානයේ දී තේ කර්මාන්තයේ දැකිය හැකි ඉහළ නිෂ්පාදන පිරිවැය හා අඩු ඵලදායිතාව, තේ අංශයේ ලාභදායිත්වය හා තිරසාර පැවැත්ම කෙරෙහි අභියෝගයක් වී ඇති බැවින් ඉදිරි කාලයේ දී ඵලදායිතාවය හා එකතු කළ අගය ඉහළ නැංවීම සඳහා වූ යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. ඉදිරි කාලය සැලකීමේ දී, ශ්‍රී ලංකා තේ සඳහා වූ ප්‍රධානතම අපනයන ගමනාන්තයක් වන ඉරානය වෙත පනවා තිබූ සම්බාධක ඉවත් කිරීමත්, ගෝලීය ඉල්ලුම වර්ධනය වීමට ඇති හැකියාවත්, තේ මිල ස්ථාවර කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### රබර්

**ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2015 වසරේ දී රබර් නිෂ්පාදනය අඛණ්ඩව සිව් වන වසරටත් අඩු වීමක් පෙන්නුම් කළේය.** 2014 වසරේ මෙට්‍රික් ටොන් 98,573 ක් වූ රබර් නිෂ්පාදනය, 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 88,570 ක් දක්වා සියයට 10.1 කින් පහත වැටුණි. විශේෂයෙන්ම, අඩු මිල ගණන් හේතුවෙන් කුඩා වතු හිමියන්ගේ රබර් කිරි කැපීමේ කටයුතු මන්දගාමී විය. තවද, වසරේ දෙවන හා තෙවන කාර්තුවලදී පැවැති අයහපත් කාලගුණික තත්ත්වය, ඉහළ නිෂ්පාදන පිරිවැය, දුර්වල ක්ෂේත්‍ර කළමනාකරණය හා වයස ඉක්ම වූ රබර් ගස්, මෙම නිෂ්පාදනයේ පහළ යෑමට දායක විය. 2015 වසරේ දී සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 50 ක් වූ ෂීට් රබර් නිෂ්පාදනය, පසුගිය වසර හා සැසඳීමේ දී මෙට්‍රික් ටොන් 44,390 ක් දක්වා සියයට 8.5 කින් පහළ ගියේය. වසර තුළ දී ක්‍රේප් රබර් නිෂ්පාදනය ද සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 13 කට දායක වෙමින් මෙට්‍රික් ටොන් 11,091 ක් දක්වා සියයට 27.3 කින් සැලකිය යුතු ලෙස අඩු විය. අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 25,480 ක් දක්වා සියයට 6.2 කින් පහළ ගියේය. මේ අතර, ස්වභාවික රබර් සඳහා වූ අඩු මිල ගණන් හේතුවෙන් නව වගා කිරීම් හා නැවත වගා කිරීම් ද අඩු විය. කෙසේ වුවද, සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 950 ක් දක්වා සියයට 6.9 කින් ඉහළ ගියේය. ස්වභාවික රබර් මිල ගණන් අඛණ්ඩව පහත වැටීම, ප්‍රධාන රබර් නිපදවන රටවල කුඩා වතු හිමියන් අනෙකුත් කෘෂිකාර්මික කටයුතු වෙතට යොමු කිරීමට හේතු වූ අතර, එය ගෝලීය රබර් නිෂ්පාදනය අඩු වීමට හේතු විය.

ජාත්‍යන්තර වෙළඳපොළ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2015 වසරේ දී දේශීය වෙළඳපොළ තුළ ද රබර් මිල ගණන් අඛණ්ඩව අඩුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. ගෝලීය ආර්ථික තත්ත්වයන් හා ඛනිජ තෙල් මිල ගණන්වල බලපෑම මත ජාත්‍යන්තර වෙළඳපොළේ ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් එකක් සඳහා වූ මිල 2014 වසරේ පැවැති එ.ජ. ඩොලර් 1,960 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් 1,560 ක් දක්වා සියයට 20.4 කින් පහත වැටුණි. ගෝලීය වෙළඳපොළ තුළ පැවැති අඩු මිල ගණන්වලට ප්‍රතිචාර වශයෙන්, කොළඹ

**2.5 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂි භෝගවල උපනති**

| අයිතමය | ඒකකය | 2014 (අ) | 2015 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|---|
| | | | | 2013/14 | 2014/15 |
| 1. තේ | | | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 338.0 | 329.0 | -0.6 | -2.7 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 203 | 203 | -8.6 | - |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 195 | 195 | 6.0 | - |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 475.11 | 478.23 | 12.4 | 0.7 |
| 1.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 459.01 | 401.46 | 3.3 | -12.5 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 649.44 | 593.08 | 4.1 | -8.7 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,195 | 806 | -24.9 | -32.6 |
| 1.7 අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 401 | 479 | 52.5 | 19.5 |
| 1.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.9 | 0.8 | - | -11.1 |
| 2. රබර් | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 98.6 | 88.6 | -24.4 | -10.1 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 134 | 135 | - | 0.7 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 111 | 116 | 5.7 | 4.5 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 160.00 | 170.00 | 6.7 | 6.3 |
| 2.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.1) | රුපියල්/කි.ග්‍රෑ. | 286.05 | 248.17 | -24.1 | -13.2 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 362.83 | 342.03 | -6.9 | -5.7 |
| 2.6 නැවත වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 2,096 | 621 | 3.6 | -70.4 |
| 2.7 අළුතින් වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 1,428 | 769 | -52.1 | -46.1 |
| 2.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.3 | 0.3 | -40.0 | - |
| 3. පොල් | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,870 | 3,056 | 14.2 | 6.5 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 441 | 455 | 12.5 | 3.2 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 13.67 | 15.25 | 0.7 | 11.6 |
| 3.4 සාමාන්‍ය මිල | | | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 31.51 | 33.88 | 6.5 | 7.5 |
| - අපනයන (නැ.වි.ස.) (උ) | ගෙඩියක් රුපියල් | 39.08 | 54.54 | 33.1 | 39.6 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඌ) | හෙක්ටයාර | 5,796 | 4,919 | 27.6 | -15.1 |
| 3.6 අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 30,771 | 14,408 | 30.0 | -53.2 |
| 3.7 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.8 | 0.8 | 14.3 | - |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැල සංඛ්‍යාව අනුව අළුතින් වගා කල බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158 ක් සඳහා හෙක්ටයාර එකක් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රබර් වෙන්දේසියේ දුම්ගැසූ දාර ෂීට් රබර් නො.1 (RSS1) සඳහා වූ සාමාන්‍ය මිල 2014 වසරේ පැවැති කිලෝග්‍රෑමයට රුපියල් 286.05 සිට 2015 වසරේ දී කිලෝග්‍රෑමයට රුපියල් 248.17 ක් දක්වා සියයට 13.2 කින් අඩු විය. ගෝලීය වෙළඳපොළ මිල ගණන් අඩු වීම හා දේශීය නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී රබර් ආනයනය දෙගුණයකට වැඩි වේගයකින් වර්ධනය විය.

### පොල්

**2015 වසරේ පොල් නිෂ්පාදනය 2000 වසරින් පසු වාර්තා වූ ඉහළම අගය වාර්තා කරමින් ගෙඩි මිලියන 3,000 ඉක්මවා යැමට සමත් විය.** පොල් නිෂ්පාදනය පෙර වසරේ පැවැති ගෙඩි මිලියන 2,870 ට සාපේක්ෂව 2015 වසරේ දී ගෙඩි මිලියන 3,056 ක් දක්වා සියයට 6.5 කින් වර්ධනය විය. පොල් නිෂ්පාදනයේ මෙම වර්ධනයට 2014 වසරේ හා 2015 වසරේ මුල් භාගයේ පොල් වගා කරන ප්‍රදේශවල පැවැති හිතකර වර්ෂාපතනය හා වායුගෝලයේ උෂ්ණත්වය සුදුසු පරිදි පැවැතීම හේතු විය. තවද, නව වැඩිදියුණු වූ කෘෂිකාර්මික භාවිතයන් හා මනා කළමනාකරණය පොල් වගා අංශයේ මෙම සතුටුදායක ක්‍රියාකාරිත්වයට දායක විය. නිෂ්පාදනයේ වැඩිවීමත් සමග පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන ද සලකා බලනු ලබන කාලසීමාව තුළ ඉහළ ගොස් ඇත. විශේෂයෙන්ම, පොල් තෙල් නිෂ්පාදනය පසුගිය වසරේ පැවැති මෙට්‍රික් ටොන් 45,268 ට සාපේක්ෂව 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 52,790 ක් දක්වා සියයට 16.6 කින් ඉහළ ගියේය. අපනයන සඳහා හිමි වූ ඉහළ මිල හේතුකොට ගෙන ඇති වූ ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් ලෙස පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි හා දියර පොල් කිරි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,885 ක් දක්වා සියයට 29.0 කින් වර්ධනය විය. ගෝලීය වෙළඳපොළේ ඉහළ ඉල්ලුම හා සතුටුදායක අපනයන ක්‍රියාකාරිත්වය සමග නැවුම් පොල් තෙල් කර්මාන්තය නැගී එන කර්මාන්තයක් බවට පත්වෙමින් 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 13,765 ක නිෂ්පාදනයක් වාර්තා කරන ලදී. ඒ අනුව, නැවුම් පොල් තෙල් අපනයනය 2014 වසරේ වාර්තා වූ මෙට්‍රික් ටොන් 6,014 හා සැසඳීමේ දී 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 12,291 ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. ඊට වෙනස්ව යමින්, දිසිදි පොල් නිෂ්පාදනය, 2014 වසරේ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් 50,367 හා සැසඳීමේ දී 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 41,795 ක් දක්වා සියයට 17.0 ක පහත වැටීමක් වාර්තා කළ අතර, අඩු අපනයන ඉල්ලුම ඒ සඳහා හේතු විය.

**2015 වසරේ දී දේශීය වෙළඳපොළේ පොල් සැපයුම ඉහළ ගිය ද, පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ඉල්ලුමේ වර්ධනය පිළිබිඹු කරමින් පොල් ආශ්‍රිත නිෂ්පාදන මිල ගණන් ඉහළ මට්ටමක පැවැතිණි.** පොල් ගෙඩියක සාමාන්‍ය ගොවිපළ මිල 2014 වසරේ පැවැති රුපියල් 32.50 සිට 2015 වසරේ දී රුපියල් 34.00 ක් දක්වා ඉහළ ගිය අතර, පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල 2014 වසරේ පැවැති රුපියල් 45.50 සිට 2015 වසරේ දී රුපියල් 50.00 දක්වා ඉහළ ගියේය. මේ අතර, දිසිදි පොල් මිල ද වසර තුළ දී තවදුරටත් ඉහළ ගියේය. දිසිදි පොල්වල සාමාන්‍ය මිල 2014 වසරේ පැවැති කිලෝග්‍රෑමයට රුපියල් 254.50 සිට 2015 වසරේදී කිලෝග්‍රෑමයට රුපියල් 296.10 ක් දක්වා සියයට 16.4 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළඳපොළේ එළවළු තෙල් මිල ගණන් අඩු වීම මෙන්ම දේශීය පොල් තෙල් නිෂ්පාදනය වැඩිවීම හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී පොල් තෙල් මිල ගණන් පහත වැටුණි. ඒ අනුව, මිලි ලීටර් 750 ක පොල් තෙල් බෝතලයක සාමාන්‍ය සිල්ලර මිල 2014 වසරේ පැවැති රුපියල් 212.00 සිට 2015 වසරේ දී රුපියල් 206.50 ක් දක්වා අඩු විය. පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවල සාමාන්‍ය අපනයන මිල 2014 වසරේ දී වූ ගෙඩියක් රුපියල් 39.08 සිට 2015 වසරේ දී ගෙඩියක් රුපියල් 54.54 ක් දක්වා සියයට 39.6 කින් ඉහළ ගියේය. පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම 2014 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 46,517 සිට 2015 වසරේ දී රුපියල් මිලියන 47,745 ක් දක්වා සියයට 2.6 කින් වර්ධනය විය.

### සුළු අපනයන භෝග

**2015 වසරේ දී සුළු අපනයන භෝග අංශය සියයට 12.9 ක වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් විය.** වසර තුළ දී ගම්මිරිස්, කරාබු නැටි, කුරුඳු, කරදමුංගු හා පුවක් නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා වූ අතර, කෝපි, කොකෝවා හා සාදික්කා නිෂ්පාදනය පහළ ගියේය. මල් හා ඵල හටගන්නා කාලය තුළ පැවැති හිතකර කාලගුණික තත්ත්වය හා අස්වැන්න නෙලාගත් බිම් ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් ගම්මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,013 ක් දක්වා සියයට 66.2 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්වූ අතර, වසරක් හැර වසරක් ඉහළ අස්වැන්නක් ලබා දෙන චක්‍රීය අස්වනු රටාවන් හේතුවෙන් කරාබු නැටි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,253 ක් දක්වා සියයට 62.9 කින් වර්ධනය විය. වසර තුළ දී ගම්මිරිස් හා කරාබු නැටි අපනයන පරිමාවන් ද පිළිවෙළින් සියයට 103.8 කින් සහ සියයට 348.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කුරුඳු නිෂ්පාදනය 2014 වසරේ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් 17,600 සිට 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 17,707 ක් දක්වා සුළු

වශයෙන් වර්ධනය විය. පෙර වසරේ දී ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ පුවක් නිෂ්පාදනය 2015 වසරේ පළමු භාගයේ දී විශේෂයෙන් ඉන්දියාවෙන් ලද ඉහළ අපනයන ඉල්ලුම හේතුවෙන් වසර තුළ දී සියයට 5.1 කින් වර්ධනය විය. කෙසේ වුවද, කෝපි හා කොකෝවා නිෂ්පාදනය පිළිවෙළින් මෙට්‍රික් ටොන් 2,126 ක් හා මෙට්‍රික් ටොන් 457 ක් දක්වා සියයට 20.5 කින් හා සියයට 8.6 කින් පහළ ගියේය. වගා කරන ලද භූමි ප්‍රමාණය ඉහළ ගිය ද, මල් පිපෙන සමයේ ඇති වූ අනපේක්ෂිත වර්ෂාව හේතුවෙන් කජු මද නිෂ්පාදනය සියයට 33.3 කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, එය කජුවල ගොවිපළ මිල ගණන් ඉහළ යෑමට හේතු විය.

### වෙනත් ක්ෂේත්‍ර භෝග

**2015 වසර මුල පැවැති අධික වර්ෂාපතනය සහ ගංවතුර හේතුවෙන් වූ භෝග විනාශ වීම් මධ්‍යයේ වුව ද වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ඉහළ ගියේය.** සමස්තයක් ලෙස සැලකීමේ දී 2015 වසරේ දී වෙනත් ක්ෂේත්‍ර භෝග 2014 වසරේ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් 339,495 ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 362,452 ක් දක්වා සියයට 6.8 කින් ඉහළ ගියේය. මෙම වර්ධනය 2014/15 මහ කන්නයේ දී සියයට 5.6 කින් හා 2015 යල කන්නයේ දී සියයට 10.8 කින් වර්ධනය වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ප්‍රමාණවත් ජල සැපයුම හා වෙළඳපොළ මිල ගණන් ඉහළ මට්ටමක පැවැතීම, මෙම නිෂ්පාදනයේ වැඩි වීමට උපකාරී විය. පසුගිය වසර හා සැසඳීමේ දී 2015 වසරේ දී බඩඉරිඟු, කුරක්කන්, මුං ඇට, උඳු, සෝයා බෝංචි, රටකජු හා අර්තාපල් නිෂ්පාදනයේ වර්ධනයක් ද අතර, කව්පි, ලොකු ළූණු, රතු ළූණු හා මිරිස් නිෂ්පාදනය අඩු වීමක් ද එමගින් මෙම භෝග ආනයනය ඉහළ යෑමක් සිදු විය. වසර තුළ දී ලොකු ළූණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 89,323 ක් දක්වා සියයට 11.7 කින් අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලොකු ළූණු ආනයනය මෙට්‍රික් ටොන් 210,253 ක් දක්වා සියයට 39.7 කින් වැඩි විය. 2015 වසරේ දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 97,391 දක්වා සියයට 17.7 කින් ඉහළ ගිය ද, ගෝලීය වෙළඳපොළ තුළ අඩු මිල ගණන් පැවැතීම හා වසර තුළ පැවැති ඉහළ දේශීය ඉල්ලුම හේතුවෙන් අර්තාපල් ආනයනය ද සියයට 20.2 කින් ඉහළ ගියේය. මේ අතර, අතුරු කන්නයේ (තුන්වන කන්නය ලෙස) වගාවෙන් ලද අස්වැන්න හේතුවෙන් බඩඉරිඟු, කව්පි, රටකජු නිෂ්පාදනය 2015 වසරේ ඇස්තමේන්තුගත දේශීය අවශ්‍යතාවය ඉක්මවා යෑමට සමත්ව ඇතැයි අපේක්ෂිතය. ක්ෂේත්‍ර භෝගයන්ගේ ඉහළ ගිය දේශීය සැපයුම, එම භෝග අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන දේශීය කර්මාන්ත සඳහා උපකාරී වෙමින් ආනයන සඳහා වූ ඉල්ලුම අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, දේශීය ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා, අවාරයේ භෝග වගාව ප්‍රවර්ධනය කරමින් අනෙකුත් සියලු ක්ෂේත්‍ර භෝග සැපයුම ඉහළ නැංවීමට මෙන්ම, ගබඩා පහසුකම් පුළුල් කිරීමට හා පසු අස්වනු තාක්ෂණය හා බීජ නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීමට ද තවදුරටත් කටයුතු කිරීම අවශ්‍ය වේ.

### එළවළු

**2015 වසරේ දී එළවළු නිෂ්පාදනය සියයට 2.2 ක වර්ධනයක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 1,875,508 ක් දක්වා ඉහළ ගියේය.** 2014/15 මහ කන්නයේ දී වාර්තා වූ සියයට 2.4 ක වර්ධනය හා 2015 යල කන්නයේ දී වාර්තා වූ සියයට 1.8 ක වර්ධනය මේ සඳහා දායක විය. මේ අතර, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් එළවළු මිල ගණන් වසර පුරා දැඩි ලෙස උච්චාවචනය විය. 2014 වසර අවසාන කාලයේ දී වූ කාලගුණික විපර්යාසයන් හේතුවෙන් භෝග විනාශ වූ අතර, එමගින් වෙළඳපොළ සැපයුම අඩු වී 2015 මුල් කාලයේ දී බොහොමයක් එළවළු වර්ගවල මිල ගණන් ඉහළ මට්ටමක පැවැතුණි. ඉන්පසුව, යල මහ කන්න දෙකෙහිම අස්වැන්න වැඩි කාලයේ දී එළවළු සැපයුම ඉහළ යෑමෙන් මිල ගණන් පහත වැටුණි. වසර අවසානයේ දී සාමාන්‍ය සෘතුමය තත්ත්වයන් පෙන්නුම් කරමින් නැවතත් එළවළු මිල ගණන් ඉහළ ගියේය. පහතරට එළවළුවල සාමාන්‍ය මිල 2014 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 70.00 - රුපියල් 152.00 ක පරාසයක පැවැති අතර, 2015 වසරේ දී එය රුපියල් 70.00 - රුපියල් 256.00 ක පරාසයක පැවැතිණි. මේ අතර, උඩරට එළවළුවල සාමාන්‍ය මිල 2014 දී පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 93.00 - රුපියල් 229.00 පරාසයට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් 94.00 - රුපියල් 308.00 ක පරාසයක පැවැතිණි. 2015 වසර තුළ දී රුපියල් මිලියන 4,142 ක වටිනාකමින් යුතු එළවළු කිලෝග්‍රෑම් මිලියන 26 ක් අපනයනය කරන ලදී. මේ අතර, මෙම අංශයේ පසු අස්වනු හානි මුළු එළවළු නිෂ්පාදනයෙන් සියයට 30-40 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. එබැවින් නිෂ්පාදකයා හා පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමට මෙන්ම මෙම අංශයේ ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට මෙම ගැටලුවට විසඳුම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

### පලතුරු

**පලතුරු නිෂ්පාදනය 2015 වසරේදී ඉහළ ගිය අතර, ඒ සඳහා අලිගැටපේර, කොමඩු, කිලෝ පේර, රඹුටන් සහ අන්නාසි සැලකිය යුතු දායකත්වයක් ලබා දුණි.** 2015 වසරේ දී පලතුරු නිෂ්පාදනය 2014 වසරේ දී වාර්තා වූ සියයට 0.8 ක පහළ යෑමට සාපේක්ෂව සියයට

15.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. වසර තුළ දී රුපියල් මිලියන 5,173 ක වටිනාකමින් යුතු පලතුරු කිලෝග්‍රෑම් මිලියන 33 ක් අපනයනය කළ අතර, ඇපල්, මැන්ඩරින්, දොඩම් සහ මිදි ඇතුළුව රුපියල් මිලියන 5,637 ක වටිනාකමින් යුතු නැවුම් පලතුරු කිලෝග්‍රෑම් මිලියන 45 ක් ආනයනය කරන ලදී. මෙම අංශයේ පසු අස්වනු හානිය සියයට 30-40 ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

### සීනි

**2015 වසරේ දී සීනි නිෂ්පාදනය ඉහළ ගිය අතර, ඒ සඳහා හිතකර වර්ෂාපතනය, වගා කළ බිම් ප්‍රමාණය ඉහළ යෑම සහ උක් ගැනුම් මිල ඉහළ යෑම දායක විය.** 2015 වසරේ දී සීනි නිෂ්පාදන කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වය විවිධ වුවද, සමස්ත සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 55,982 ක් දක්වා සියයට 7.0 කින් වර්ධනය විය. මුළු දේශීය නිෂ්පාදනයෙන් අඩක් පමණ නිෂ්පාදනය කරන පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ නිමැවුම 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 27,612 ක් දක්වා සියයට 53.7 කින් ඉහළ ගිය අතර, සෙවනගල සහ ගල්ඔය සීනි කර්මාන්තශාලාවල සිදුකළ නිෂ්පාදනය පිළිවෙළින් මෙට්‍රික් ටොන් 14,377 ක් හා මෙට්‍රික් ටොන් 13,994 ක් දක්වා සියයට 0.3 කින් හා සියයට 29.8 කින් පහළ ගියේය. කන්තලේ සීනි කර්මාන්තශාලාව නුදුරු අනාගතයේ දී නැවතත් සීනි නිෂ්පාදනය ආරම්භ කිරීමේ අරමුණ පෙරදැරිව උක් වගා කිරීමෙහි නිරත විය. මේ අතර, ආංශික වශයෙන් ඵලදායිතාව නිරූපණය වන සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය, පෙර වසරේ වාර්තා වූ සියයට 8.0 සිට 2015 වසරේ දී සියයට 7.5 ක් දක්වා අඩු විය.[1] 2015 වසරේ දී දේශීය සීනි නිෂ්පාදනය රටෙහි සමස්ත සීනි අවශ්‍යතාවයෙන් සියයට 10 ක් පමණ සපුරා ගැනීමට ප්‍රමාණවත් බවට ඇස්තමේන්තු කර ඇත. ගෝලීය වෙළඳපොළ සීනි මිල ගණන් අඩු වීම සහ සීනි සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2015 වසරේ දී සීනි ආනයනය මෙට්‍රික් ටොන් 623,971 ක් දක්වා සියයට 20.1 කින් ඉහළ ගියේය. සීනි කර්මාන්තය පුළුල් කිරීමේ හැකියාව සහ සීනි ආනයනය කිරීමේ දී සැලකිය යුතු මට්ටමකින් වැය වන විදේශීය විනිමය සලකා බැලීමේ දී දියුණු කළ ප්‍රභේද, යහපත් කළමනාකරණ පුරුදු සහ නවීන තාක්ෂණය භාවිතා කිරීමෙන් සීනි කර්මාන්තය නැවත පණගැන්වීම අවශ්‍ය වන අතර, දැනට සිල්ලර මිලට වඩා ඉහළ අගයක පවතින නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට ද ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

1 සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක් දඬු ප්‍රමාණය}} \times 100$

### ධීවර

**2015 වසරේ දී ධීවර අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.** 2015 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 520,190 ක් දක්වා සියයට 2.8 කින් පහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 67,300 ක් දක්වා සියයට 11.2 කින් පහළ යෑමයි. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සැලකීමේ දී 2015 වසරේ මුල් කාලයේ දී ප්‍රධාන ජලාශවල වතුර මට්ටම ඉහළ යෑමෙන් මත්ස්‍ය දැල් දැමිය හැකි ප්‍රදේශ අඩු වීම සහ 2014 වසරේ දී මුදාහැරි මත්ස්‍ය පැටව් ප්‍රමාණය අඩු වීම හේතුවෙන් ජලාශවල මත්ස්‍ය නිෂ්පාදනය අඩු විය. කෙසේ වුවද, වසර තුළ දී ඉස්සන් වගාව සහ ජලජීවී වගාව තුළින් වූ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2015 වසරේ දී ප්‍රධාන වශයෙන් වෙරළාශ්‍රිත සහ කලපු ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 452,890 ක් දක්වා සියයට 1.4 කින් පහළ ගිය අතර, ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය සුළු වශයෙන් වර්ධනය විය. මත්ස්‍ය නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් වසර මුළුල්ලේම විශාල මත්ස්‍ය විශේෂයන්ගේ මෙන්ම කුඩා මත්ස්‍ය විශේෂයන්ගේ මිල ගණන් පෙර වසරට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවැතුණි. තවද, යුරෝපා සංගමය වෙත ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය තහනම් කිරීම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලද ආදායම රුපියල් මිලියන 22,130 ක් දක්වා සියයට 32.9 කින් අඩු විය. මේ අතර, ටින් මාළු ආනයනය කිරීමේ දී පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 102.00 සිට රුපියල් 50.00 දක්වා අඩු කිරීම හේතුවෙන් ටින් මාළු ආනයනය 2014 දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 19,591 සිට 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 49,016 ක් දක්වා සියයට 150.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**2.6 සංඛ්‍යා සටහන — මත්ස්‍ය නිෂ්පාදනය**

මෙ.ටො.දහස්

| උප අංශය | 2014 | 2015 (අ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2013/14 | 2014/15 |
| මුහුදු මත්ස්‍ය | 459 | 453 | 3.0 | -1.4 |
| වෙරළ හා කලපු ආශ්‍රිත | 279 | 269 | 4.1 | -3.5 |
| ගැඹුරු මුහුදු මත්ස්‍ය | 180 | 184 | 1.4 | 1.9 |
| මිරිදිය මත්ස්‍ය | 76 | 67 | 13.6 | -11.2 |
| මිරිදිය ජලාශ | 69 | 57 | 25.1 | -17.1 |
| ජලජීවී වගාව | 2 | 3 | -76.1 | 77.0 |
| ඉස්සන් වගාව | 5 | 7 | 16.3 | 37.7 |
| **එකතුව** | **535** | **520** | **4.3** | **-2.8** |

(අ) තාවකාලික

මූලය: ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

2

ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම

### පශු සම්පත්

**ජාතික කිරි නිෂ්පාදනය ඉහළ යෑමේ ප්‍රවණතාවය 2015 වසරේ දී තවදුරටත් දක්නට ලැබුණි.** කිරි සඳහා සතුටුදායක නිෂ්පාදන මිල ගණන් පැවැතීමත්, කර්මාන්තශාලාවල නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම හේතුවෙන් මහා පරිමාණ කිරි නිෂ්පාදන සමාගම් වෙතින් වූ කිරි ඉල්ලුම ඉහළ යෑමත් හේතුවෙන් 2015 වසරේ දී කිරි නිෂ්පාදනය 2014 වසරේ වාර්තා කළ සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව ලීටර මිලියන 374 ක් දක්වා සියයට 12.1 කින් වර්ධනය විය. එළකිරි නිෂ්පාදනය ලීටර මිලියන 305 ක් දක්වා සියයට 11.9 කින් වර්ධනය වූ අතර, මී කිරි නිෂ්පාදනය ලීටර මිලියන 69 ක් දක්වා සියයට 13.2 කින් වර්ධනය විය. කිරි ලබාගන්නා මුළු දෙනුන් සංඛ්‍යාව 392,710 දක්වා සියයට 2.1 කින් ඉහළ ගිය අතර, මෙයින් කිරි ලබා ගන්නා මී දෙනුන් සංඛ්‍යාව 91,570 දක්වා සියයට 1.5 කින් ඉහළ ගියේය. 2015 වසරේ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය 2014 වසරේ වාර්තා වූ ලීටර මිලියන 10.8 සිට ලීටර මිලියන 11 දක්වා ඉහළ ගිය අතර, මිල්කෝ (පුද්) සමාගමේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 62 ක් දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ රිදියගම ගොවිපළට ආනයනය කළ ගව දෙනුන් විසින් පැටවුන් බිහිකිරීම මෙම නිෂ්පාදනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 වසරේ දී රිදියගම ගොවිපළ වෙත ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද නුමුහුන් හා දෙමුහුන් ගවයන් පළමු කොටස ලැබීමත් සමග ආනයනික ගවයන් වැඩිදියුණු කරන ලද දැඩි කළමනාකරණ තත්ත්වයන් යටතේ ඇති කිරීමට හැකි නවීන ගොවිපළක් ලෙස එය පුළුල් කරන ලදී. මේ අතර, මහා පරිමාණ කිරි නිෂ්පාදකයන් විසින් එකතු කරන ලද කිරි ප්‍රමාණය 2015 වසරේ දී ලීටර මිලියන 219 දක්වා සියයට 1.5 කින් ඉහළ යන ලදී. මිල්කෝ ආයතනය සතු පොළොන්නරුව, දිගන හා අඹේවෙල කර්මාන්තශාලා නවීකරණය කිරීම, මෙම වර්ධනය සඳහා උපකාරී විය. ජාතික කිරි නිෂ්පාදනයේ සාමාන්‍ය නිපැයුම් පිරිවැය ලීටරයකට රුපියල් 32.42 ක් දක්වා රුපියල් 2.24 කින් පහළ යෑම සහ සාමාන්‍ය ගොවිපළ මිල, ලීටරයකට රුපියල් 62.00 ක් දක්වා රුපියල් 7.34 කින් වැඩි වීම මඟින් ගොවීන්ට ඉහළ ලාභයක් ලබාගත හැකි විය. තවද, 2015 වසරේ අයවැය මගින් කිරි සඳහා වූ සහතික මිල ලීටරයකට රුපියල් 60.0 ක් දක්වා ඉහළ නැංවූ අතර, 2015 ජූනි මස දී එය ලීටරයකට රුපියල් 70.00 ක් දක්වා තවදුරටත් ඉහළ දමන ලදී. මේ අතර, කිරිපිටි ආනයනය මෙට්‍රික් ටොන් 81,759 ක් දක්වා සියයට 21.7 කින් ඉහළ ගිය අතර, එහි වටිනාකම රුපියල් මිලියන 31,842 ක් විය. දේශීය කිරි නිෂ්පාදනය, ජාතික අවශ්‍යතාවයෙන් සියයට 40 ක් පමණක් සැපිරීමට ප්‍රමාණවත් බැවින්, නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පවතින බාධා හඳුනා ගෙන කිරි නිෂ්පාදනය තවදුරටත් දිරිමත් කිරීම ඉතා වැදගත් වේ. පසුගිය වසර ගණනාවෙහිම රජයේ ආයෝජන බහුතරයක් රට තුළ උසස් තත්ත්වයේ ගව සම්පතක් ඇති කර ගැනීම වෙත යොමු කරන ලදී. කෙසේ වුවද, ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැසිය හැකි ගව පැටවුන් අලෙවිය සඳහා වූ ඵලදායී වෙළඳපොළක් රට තුළ නොපවතී. මීට අමතරව, ජාත්‍යන්තර වෙළඳපොළ කිරිපිටි මිල ගණන් ඉහළ යන අවස්ථාවන්හිදී කුඩා පරිමාණ කිරි සැපයුම්කරුවන්ගේ නිෂ්පාදන ඉතා වැදගත් වන බැවින් ඔවුන් දිරිමත් කිරීම අවශ්‍ය වේ.

**2.7 සංඛ්‍යා සටහන — පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන**

| උප අංශය | 2014 (අ) | 2015 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2013/14 | 2014/15 |
| 1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.4 | 1.4 | -8.0 | -1.0 |
| එළගවයන් | 1.1 | 1.1 | -5.5 | -1.5 |
| මීගවයන් | 0.3 | 0.3 | -15.8 | 0.7 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 332.9 | 374.4 | 1.4 | 12.1 |
| එළ කිරි | 272.9 | 305.4 | 2.9 | 11.9 |
| මී කිරි | 60.9 | 69.1 | -4.8 | 13.2 |
| 3. කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) (ඇ) | 33.6 | 33.5 | 14.1 | -0.3 |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 54.7 | 62.0 | -8.7 | 13.4 |
| 5. බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,721.0 | 1,899.0 | 5.1 | 10.3 |
| 6. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 150.3 | 164.5 | 4.0 | 9.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ මිල්කෝ (පුද්) සමාගමේ නිෂ්පාදිත පමණක් ඇතුළත් වේ.

මූලයන්: ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
මිල්කෝ (පුද්) සමාගම

**2015 වසරේ දී කුකුළු මස් හා බිත්තර නිෂ්පාදන අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.** කුකුළු මස් නිෂ්පාදනය 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 164,450 ක් දක්වා සියයට 9.4 කින් වර්ධනය විය. 2015 වසරේ දී මස් පිණිස බ්‍රොයිලර් සතුන් නිපදවීම සඳහා අවශ්‍ය මාපිය සතුන් (Broiler Parents) නිෂ්පාදනය සියයට 8.3 කින් වර්ධනය වූ අතර, බ්‍රොයිලර් මාපිය සතුන් හා බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය මාපිය සතුන් (Layer Parents) ආනයනය පිළිවෙළින් සියයට 21.9 කින් හා සියයට 28.0 කින් අඩු විය. 2015 වසරේ දී කුකුළු මස් නිෂ්පාදනය වැඩි වුවද, කුකුළු මස් මිල ගණන් ඉහළ ගියේය. නැවුම් කුකුළු

මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල, පෙර වසරේ පැවැති රුපියල් 453.00 සිට 2015 වසරේ දී රුපියල් 508.00 දක්වා ඉහළ ගිය අතර, බ්‍රොයිලර් කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 380.00 ක් විය. කුකුළු මස් (හම නොගැසූ) කිලෝග්‍රෑමයක් සඳහා පිරිවැය ද 2014 වසරේ දී වූ රුපියල් 290.89 ක සිට 2015 වසරේ දී රුපියල් 291.16 ක් දක්වා ඉහළ ගොස් ඇත. ඌරු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 7,180 ක් දක්වා සියයට 1.4 කින් ද, එළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,350 ක් දක්වා සියයට 0.7 කින් ද ඉහළ ගිය අතර, හරක් මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 32,020 ක් දක්වා සියයට 5.4 කින් පහළ ගියේය. වසර තුළ දී ඌරු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 614.00 ක් දක්වා සියයට 13.4 කින් ද, එළු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 1,384.00 ක් දක්වා සියයට 8.6 කින් ද, හරක් මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 664.00 ක් දක්වා සියයට 14.9 කින් ද ඉහළ ගියේය. මේ අතර, බිත්තර නිෂ්පාදනය මිලියන 1,899 ක් දක්වා සියයට 10.3 කින් ඉහළ ගිය අතර, බිත්තරයක සාමාන්‍ය සිල්ලර මිල 2014 වසරේ වාර්තා වූ රුපියල් 12.75 ට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් 14.80 ක් දක්වා ඉහළ ගියේය. 2015 වසරේ දී බිත්තර අපනයනය පෙර වසරට සාපේක්ෂව සියයට 14.0 කින් පහළ ගියේය.

### වන සම්පත්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ වන ආවරණය හෙක්ටයාර් 1,951,472 ක් ලෙස පෙර වසරේ පැවැති මට්ටමේම නොවෙනස්ව පැවැතුණි.** වසර තුළ දී දැව ලබා ගැනීම සඳහා හෙක්ටයාර 422.6 ක වන ආවරණය හෙළි කළ අතර, හෙක්ටයාර 450 ක් නැවත වගා කරන ලදී. දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම අරමුණු කරගෙන, "වනහරණය සහ වනහායනය මගින් සිදු වන කාබන් විමෝචනය අඩු කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ වැඩසටහන" (UN-REDD) යටතේ ශ්‍රී ලංකාවේ වනහරණය සහ වනහායනය සඳහා වන ප්‍රධාන සාධක හඳුනා ගැනීම සඳහා මූලික වැඩකටයුතු සහ පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. වියළි සහ අතරමැදි කලාපවල දිස්ත්‍රික්ක 18 ක් ආවරණය කරමින් භූමි ප්‍රදේශ 167 ක ක්‍රියාත්මක වෙමින් පවතින ශ්‍රී ලංකා ප්‍රජා වන වැඩසටහන 2015 වසරේ දී නව භූමි ප්‍රදේශ 37 ක් වෙත ව්‍යාප්ත කරන ලදී. මෙම වැඩසටහන, වන සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගිත්වය සහ මිනිසුන් විසින් සිදු කරන වන විනාශය අවම කිරීම සඳහා වන ක්‍රියාකාරකම් වෙත යොමු වී ඇත. සාරවත් වගාවන් සහ ස්වාරක්ෂක කලාප වගාවන් වැනි ප්‍රජාව මූලිකව සිදු කරන වන සම්පත් වැඩසටහන් මගින්, 2015 වසරේ දී හෙක්ටයාර 1,000 ක පමණ වන භූමියක් ආරක්ෂා කර ගත හැකි වී ඇති අතර, ප්‍රජාව විසින් කිලෝමීටර 40 කට ආසන්න වන තීරයක් ගින්නෙන් ආරක්ෂා කිරීමේ ක්‍රම යොදා ගනිමින් සංවර්ධනය කර තිබේ. 2019 වසර වන විට ශ්‍රී ලංකාවේ වන ආවරණය මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 32 ක් බවට වර්ධනය කිරීමේ අරමුණ ඇතිව වනගහනය පුළුල් කිරීමේ වැඩසටහන 2014 වසරේ දී ආරම්භ කරන ලද අතර, 2015 වසරේ දී හානි වූ වනගහනය ප්‍රතිසංස්කරණය කිරීමේ හා නැවත වන වගා කිරීමේ කටයුතු සිදු කරන ලදී[2]. මේ අතර, පෞද්ගලික අංශය විසින් සිදු කරන නැවත වන වගා කිරීමේ වැඩසටහන යටතේ 2015 වසර අවසානයේ දී වාණිජ්‍ය මට්ටමේ පෞද්ගලික වන රෝපණය හෙක්ටයාර 437.9 ක් විය.

### කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ආයතනික සහාය

**2015 වසරේ දී කෘෂිකාර්මික ප්‍රතිපත්තිය, ආහාර සුරක්ෂිතතාවය, පාරිසරික තිරසාරත්වය තහවුරු කිරීම හා ආර්ථික අවස්ථා වර්ධනය කිරීම කෙරෙහි යොමු විය.** ශ්‍රී ලංකාවේ බලයට පත් විවිධ රජයන් විසින් රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම අරමුණු කරගෙන බොහෝ ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදී. වාරිමාර්ග යෝජනා ක්‍රම සහ කෘෂිකාර්මික පර්යේෂණ, විහිදුම් සහ අධ්‍යාපන සේවා වැනි උපකාරක සේවා ඇතුළත් යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර, පොහොර සහනාධාරය සහ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සහතික මිලක් ලබාදීම වැනි රාජ්‍ය මැදිහත්වීම් සහිත ප්‍රතිපත්ති ද ක්‍රියාත්මක කරන ලදී. රටේ ආහාර අවශ්‍යතාවයෙන් සියයට 75 ක ප්‍රමාණයක් පමණක් දේශීය කෘෂිකර්මාන්තය මගින් සපයා ගනු ලැබුව ද ධාන්‍ය වර්ග, අර්තාපල්, මිරිස් සහ ලොකු ළූණු වැනි දැනට ආනයන මගින් ඉතිරි අවශ්‍යතාවය සපුරා ගන්නා අනෙකුත් ක්ෂේත්‍ර භෝගවල මුළු අවශ්‍යතාවය රට තුළම නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව පවතී.

**2016 වසරේ දී කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කරන ලදී.** භෝග විවිධාංගීකරණය හා ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් 2018 වසර වන විට බඩඉරිඟු, සෝයා බෝංචි, වියළි මිරිස්, ලොකු ළූණු සහ අර්තාපල්වලින් ස්වයංපෝෂිත කිරීමටත්, යැපුම් කෘෂිකර්මාන්තයේ සිට කෘෂි නිෂ්පාදන ව්‍යාපාර දක්වා ක්‍රමයෙන් කෘෂි කර්මාන්තය ඉහළ තලයකට නැංවීමටත්, 2020 වන විට අපනයන වෙළඳපොළට ප්‍රවිශ්ට වීමටත් හැකි වන පරිදි රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමට යොමු වී ඇත. තවද,

2 නවතම දත්ත අනුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2010 වසරේ දී සිදු කරන ලද වන ආවරණ සිතියම්කරණයට අනුව ශ්‍රී ලංකාවේ වන ආවරණය සියයට 29.7 කි.

**2.8 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආහාර ද්‍රව්‍යන්ගේ ආහාර ශේෂ පත්‍රය**

| | අයිතමය | ඒකකය | 2010 | | | 2014 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) |
| 1. | සහල් (අ) | මෙ.ටො.දහස් | 3,011 | 126 | 152 | 2,367 | 600 | 143 | 3,373 | 286 | 175 |
| 2. | ඉරිඟු | මෙ.ටො.දහස් | 162 | 16 | 9 | 241 | 99 | 16 | 261 | 79 | 16 |
| 3. | තිරිඟු | මෙ.ටො.දහස් | - | 1,051 | 51 | - | 1,179 | 57 | - | 1,208 | 58 |
| 4. | ලොකු ළූණු | මෙ.ටො.දහස් | 59 | 158 | 10 | 101 | 151 | 12 | 89 | 210 | 14 |
| 5. | සීනි | මෙ.ටො.දහස් | 31 | 548 | 28 | 52 | 520 | 28 | 56 | 624 | 32 |
| 6. | අර්තාපල් | මෙ.ටො.දහස් | 52 | 130 | 9 | 83 | 118 | 10 | 97 | 142 | 11 |
| 7. | මාළු | මෙ.ටො.දහස් | 385 | 14 | 19 | 535 | 21 | 27 | 520 | 34 | 26 |
| 8. | එළකිරි | ලීටර් මිලියන | 192 | - | 9 | 273 | - | 13 | 305 | - | 15 |
| 9. | පොල්තෙල් | මෙ.ටො.දහස් | 65 | 3 | 3 | 45 | 6 | 2 | 53 | 6 | 3 |

(අ) වී මෙට්‍රික් ටොන් 1 ක්, සහල් මෙට්‍රික් ටොන් 0.7 කට සමාන වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන, ගෝලීය තරගකාරී මට්ටමක පවත්වා ගැනීම සඳහා, "ශ්‍රී ලංකාව - ගෝලීය ගෙවත්ත" යන තේමාව යටතේ කෘෂිකාර්මික සංවර්ධන මහා කලාප 23 ක් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. බස්නාහිර පළාත් මහානගර සැලසුමෙහි කොටසක් ලෙස වැව්ලි නගර හා වනාන්තර නගර ඇතුළත්ව සැලසුම් ප්‍රදේශ 13 ක් යෝජනා වී ඇත. අවිස්සාවේල්ල ආශ්‍රිතව කුඩා නේවාසික කලාප ද ඇතුළත්ව වතු ප්‍රදේශවලින් වැව්ලි නගරය සමන්විත වනු ඇති අතර, වනාන්තර නගරය මනාව සුරක්ෂිත කරන ලද කෘෂිකාර්මික හා වනාන්තර ප්‍රදේශ අතර, සුවිශේෂී නේවාසික හා සංචාරක කලාප සහිතව ඉදිකිරීමට ඉලක්ක කර ඇත. කෙසේ වුවද, මෙම අංශයේ පවතින අභියෝගවලට විසඳුම් සෙවීමේ දී කාර්යක්ෂම ජල කළමනාකරණය, ඉහළ ඵලදායිතාවකින් යුතු බීජ වර්ග හඳුන්වා දීම සහ නවීන තාක්ෂණය භාවිතා කිරීම සමඟ සාම්ප්‍රදායික අඩු වටිනාකමක් සහිත කෘෂිකර්මාන්තයේ සිට ඉහළ අගයක් සහිත කෘෂිකර්මාන්තය වෙත යොමු වීමට ක්‍රියාමාර්ග ගැනීම ඉතා වැදගත් වන අතර, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ආයෝජන ඉහළ නැංවීම ද කුඩා වතු හිමියන් සහ ගොවීන් සඳහා කෘෂි ණය ලබාගැනීම පහසුකරලීම ද අවශ්‍ය වේ.

**වී වගා අංශය දියුණු කිරීම සඳහා 2015 වසරේ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ඵලදාව හා වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට ගොවීන් දිරිමත් කිරීමේ අරමුණින් වී මිලදී ගැනීමේ සහතික මිල ඉහළ නංවන ලදී. 2015 වසරේ දී සම්බා වී කිලෝග්‍රෑමයක ගැනුම් මිල, 2014 වසරේ පැවැති රුපියල් 35 සිට රුපියල් 50 දක්වා ද, නාඩු වී කිලෝග්‍රෑමයක ගැනුම් මිල රුපියල් 32 සිට රුපියල් 45 දක්වා ද ඉහළ නංවන ලදී. ඉහළ ගිය වී අස්වැන්න හේතුවෙන් වී අලෙවි මණ්ඩලය විසින් 2014/15 මහ කන්නයෙන් මෙට්‍රික් ටොන් 160,000 ක් සහ 2015 යල කන්නයෙන් මෙට්‍රික් ටොන් 175,270 ක් ලෙස වී මෙට්‍රික් ටොන් 335,270 ක් මිලදී ගන්නා ලදී. වී අලෙවි මණ්ඩලය සතු ගබඩා පහසුකම් හා මූල්‍ය තත්ත්වයන් සීමිත වීම, වසර තුළ දී සහතික මිල ක්‍රමය යටතේ ගොවීන්ගෙන් වැඩිදුරටත් වී මිලදී ගැනීමට බාධා ඇති කරන ලදී. මේ අතර, 2016 අයවැය මගින් යෝජනා කළ පරිදි වෙළඳපොළ සහල් මිල ගණන් ස්ථායීව පවත්වා ගැනීම සඳහා කීරි සම්බා සහ සම්බා වී කිලෝග්‍රෑමයක ගැනුම් මිල පිළිවෙළින් රුපියල් 50 ක් සහ රුපියල් 41 ක් දක්වා ද නාඩු වී කිලෝග්‍රෑමයක ගැනුම් මිල රුපියල් 38 ක් දක්වා ද පහත දැමීමට කටයුතු කරන ලදී. විශාල අස්වැන්නක් වෙළඳපොළට පැමිණීමත් සමඟ සහල් ආනයනය අධෛර්යමත් කිරීම සඳහා සහල් කිලෝග්‍රෑමයක් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2014 වසරේ පැවැති රුපියල් 1 සිට 2015 ජනවාරි මස 22 වෙනි දින සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 ක් දක්වා ද 2015 මාර්තු මස 26 වෙනි දින සිට රුපියල් 40 ක් දක්වා ද ඉහළ නංවන ලදී. 2015 මැයි මස 6 වන දින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වෙනුවට කිලෝග්‍රෑමයකට රුපියල් 35 ක තීරුබද්දක් හා අනෙකුත් බදු පනවන ලදී. ඒ අතර, 2015 වසරේ දී පොහොර සහනාධාරය රුපියල් මිලියන 49,571 ක් දක්වා ඉහළ නංවන ලදී. එතෙක් පොහොර වශයෙන් ලබා දුන් සහනාධාරය වෙනුවට 2015 යල කන්නයේ සිට හෙක්ටයාර දෙකක උපරිමයකට යටත්ව හෙක්ටයාරයක් සඳහා වසරකට රුපියල් 25,000 ක මුදල් ප්‍රදානයක් ලබා දීමට මූලික කටයුතු සිදුකර ඇති අතර, ඒ හරහා ගොවීන්ට තම වගාවන් සඳහා අවශ්‍ය යෙදවුම් තීරණය කිරීමට වඩාත් නිදහසක් ලැබෙන බැවින් ඵලදාව ද වැඩිකරගත හැකිවනු ඇත. තවද, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරනු වස් කෘෂි

භෝග ගබඩා කිරීමේ දී හා අලෙවි කිරීමේ දී මතුවන ගැටලු විසඳීම සඳහා ගබඩා පහසුකම් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, රුපියල් මිලියන 260 ක වියදමක් දරමින් නවීන පහසුකම් සහිතව බුත්තල ඉදි කළ ගබඩා සංකීර්ණය 2016 ජනවාරි මස විවෘත කරන ලදී. එහි ධාන්‍ය මෙට්‍රික් ටොන් 20,000 ක් පමණ ගබඩා කළ හැකි බවට ඇස්තමේන්තු කර ඇති අතර, නවීන පහසුකම් යටතේ තොගවල කල් පැවැත්ම තහවුරු කිරීම සඳහා දැඩි තත්ත්ව පාලන ක්‍රියාවලීන්ට යටත් වනු ඇත. මේ අතර, පසු අස්වනු හානිය සීමා කිරීම සඳහා රජය විසින් මන්නාරම ගබඩා සංකීර්ණයේ ඉතිරි වැඩ කටයුතු කඩිනමින් නිම කරනු ඇති අතර, කිලිනොච්චිය, පොළොන්නරුව හා ඇඹිලිපිටිය යන ප්‍රදේශවල තවත් ගබඩා සංකීර්ණ තුනක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. අස්වනු නෙලන සමයේ ඇති වන අධි සැපයුම් තත්ත්වයන්හි දී තම වී හා අනෙකුත් ධාන්‍ය අස්වනු ගබඩා කර තැබීම සඳහා ගොවීන්ට මෙමගින් ඉහළ ගුණාත්මක බවකින් යුතු ගබඩා පහසුකම් සැපයෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, ගබඩා කරන ලද නිෂ්පාදන අවාරයේ දී ඉහළ මිලකට අලෙවි කර ගැනීමට ද එමගින් ගොවීන්ට අවස්ථාව සැලසෙනු ඇත. යැපුම් කෘෂිකර්මාන්තයෙන් ඉදිරියට සිතා බැලීමට ගොවීන්ට අවස්ථාව ලබාදීමටත්, නිෂ්පාදනය පුළුල් කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් වැඩි ආදායමක් ලබා ගැනීමට අවකාශ සැලසීමටත්, කෘෂිකාර්මික අලෙවි ක්‍රියාවලියේ දී ගබඩා පහසුකම් ප්‍රධාන අංගයක් වන හෙයින් ඒවායෙහි පිළිගත හැකි ප්‍රමිතීන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, වගා කටයුතු සඳහා අධික විෂ සහිත කෘෂි රසායන භාවිතය වැළැක්වීම අරමුණු කරගෙන 2016 මාර්තු මස මුල් කාලයේ දී "යහපත් කෘෂිකර්මාන්තයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් - වස විස නැති රටක්" යන තේමාව යටතේ තුන් අවුරුදු ජාතික වැඩසටහනක් දියත් කරන ලදී.

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය 2015 වසරේ දී ද තේ කර්මාන්තයේ ඵලදායිතාව, එකතු කළ අගය හා තරගකාරිත්වය ඉහළ නැංවීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරන ලදී.** පාංශු සාරවත්භාවය ඉහළ නැංවීමත් සමඟ වූ නැවත වගාව හා නව වගාව සඳහා වූ සහනාධාරය පිළිවෙළින් හෙක්ටයාරයකට රුපියල් 350,000 හා රුපියල් 250,000 සිට හෙක්ටයාරයකට රුපියල් 500,000 ක් හා රුපියල් 400,000 ක් දක්වා ඉහළ නංවන ලද අතර, පාංශු සාරවත්භාවය නැංවීමෙන් තොරව සිදු කෙරෙන නව වගාවන් සඳහා වූ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 195,000 සිට රුපියල් 310,000 ක් දක්වා ඉහළ නංවන ලදී. සහනාධාර ඉහළ නැංවීමට ප්‍රතිචාර දක්වමින් රුපියල් මිලියන 417 ක වියදමින් හෙක්ටයාර 806 ක පමණ නැවත වගාව සිදුවූ අතර, රුපියල් මිලියන 128 ක වියදමින් හෙක්ටයාර 479 ක් අලුතින් වගා කරන ලදී. මේ අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විශේෂයෙන්ම චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා තේ සඳහා වූ අවස්ථාවන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලද අතර, ලොව ප්‍රධාන විදේශීය ආහාර පාන වර්ග වෙළඳ ප්‍රදර්ශනයන්හි දී සිය සහනාධාර ක්‍රමය යටතේ නිපදවන, සිංහ ලාංඡනය සහිත තේ පැකට්ටු ප්‍රවර්ධනය කරන ලදී. තවද, CTC තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දැනට පවතින සාම්ප්‍රදායික තේ කර්මාන්තශාලාවල වෙන්කර ඇති ධාරිතාවන් තුළ CTC තේ නිෂ්පාදනයට වෙනම නිෂ්පාදන අංශයක් පිහිටුවීමට අවසර ලබාදෙන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන්, නියාමන කටයුතු ක්‍රියාත්මක කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම හරහා ඉහළ තත්ත්වයෙන් යුතු තේ දළු සාමාන්‍යය සියයට 33 ක මට්ටමේ සිට සියයට 60 ක මට්ටම දක්වා නැංවීමට "B Leaf 60" වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, එමගින් පසු අස්වනු හානිය අවම කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙම වැඩසටහන යටතේ, ගුණාත්මක තේ දළු සපයන කුඩා වතු හිමියන්ට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 80 ක් ලබාදීමේ සහනාධාර වැඩසටහනක් 2015 වසරේ මාර්තු මස සිට ආරම්භ කරන ලදී. තවද, තේ වෙන්දේසියේ මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඇති වූ මූල්‍ය අපහසුතාවන්ගෙන් පීඩාවට පත් ලියාපදිංචි වූ කර්මාන්තශාලා හිමියන්ට කුඩා වතු හිමියන් හා පවතින සිය මූල්‍ය බැඳීම් නිසි වේලාවට ඉටු කිරීමටත්, තේ වෙන්දේසියේ මිල ගණන් අඩු වීම නිසා ඇති වන මූල්‍ය අපහසුතා මගහරවා ගැනීමටත් හැකි වන පරිද්දෙන් රජය විසින් කෙටි කාලීන කාරක ප්‍රාග්ධන ණය වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමය තුළ සියයට 2 ක සහනාධාර පොලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙන ලදී.

**රබර් ක්ෂේත්‍රය සඳහා වූ සංවර්ධන උපායමාර්ග බොහෝ දුරට සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම හරහා ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි යොමු කරන ලදී.** රබර් නැවත වගාව සඳහා වන සහනාධාර වැඩසටහන (හෙක්ටයාරයකට රුපියල් 175,000) සහ නව වගාව සඳහා වන සහනාධාර වැඩසටහන (හෙක්ටයාරයකට රුපියල් 150,000) 2015 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, වසර තුළ දී රබර් නැවත වගාව හා නව වගාව සඳහා පිළිවෙළින් රුපියල් මිලියන 405 ක් හා රුපියල් මිලියන 190 ක්

පමණ ලබා දෙන ලදී. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව වගාවන් පිළිවෙළින් හෙක්ටයාර 219 ක් හා 172 ක් ලෙස වාර්තා විය. 2015 වසරේ දී වතු සමාගම් හා කුඩා වතු හිමියන්ගේ නව වගාබිම් ප්‍රමාණය පසුගිය වසර හා සැසඳීමේ දී හෙක්ටයාර 621 දක්වා සියයට 70.4 කින් පහත වැටුණි. මේ අතර, කොළඹ රබර් වෙන්දේසියේ දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් (RSS) කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල හා රජයේ සහතික මිල වන කිලෝග්‍රෑමයකට රුපියල් 350 අතර වෙනස කුඩා වතු හිමියන්ට ගෙවීමට 2015 මාර්තු මස සිට පියවර ගන්නා ලදී. වෙළඳපොළ මිල මට්ටම තරගකාරී සමතුලිත මට්ටමක පවත්වා ගැනීම හා එමගින් කුඩා වතු හිමියන් සඳහා වාසිදායක මිලක් ලබා දීම ඉන් අරමුණු කළ අතර, 2015 අගෝස්තු මස වන විට එම යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 1,409 ක් ලබා දී ඇත. තවද, රබර් පර්යේෂණ ආයතනය ලෝක වෙළඳපොළේ රබර් මිල ගණන් පහළ යෑම මධ්‍යයේ වුවද රබර් අංශයට සහාය දැක්වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, වැඩිදියුණු කරන ලද කැපුම් පිහි, බල කලාල හා එක්දින වියළීමේ පද්ධති වැනි නව වැඩිදියුණු කළ තාක්ෂණික උපක්‍රම සිය ප්‍රතිලාභීන් අතර, ප්‍රචලිත කිරීමට කටයුතු කළ අතර, ඉහළ ඵලදාවක් සහිත පැළ කුඩා වතු අංශයේ ප්‍රචලිත කිරීමට කටයුතු කරන ලදී. රබර් තවාන් සඳහා පොහොර සෙමින් මුදාහැරීමේ ක්‍රම හඳුන්වා දීම මගින් සාම්ප්‍රදායික පිළිවෙත් සමඟ සම්බන්ධ වූ ගැටලු නිරාකරණය කිරීමට අදාළ පියවර ගත් අතර, රබර් වගාකරුවන් සඳහා ලබාදෙන ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය අඛණ්ඩව පරීක්ෂා කිරීම සිදු කරන ලදී. තවද, තාක්ෂණය දියුණු කිරීමට ද උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමට සුදුසු ඉඩම් හඳුනා ගැනීමට ද පියවර ගන්නා ලදී. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට රබර් වගාව ව්‍යාප්ත කිරීම මගින් මධ්‍ය කාලීන රබර් නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, අතිරික්ත රබර් නිෂ්පාදනය අවශෝෂණය කර ගැනීමට දේශීය රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ.

**නැවත වගාව හා නව වගාව ප්‍රවර්ධනයට ද පොල් වගාව ආශ්‍රිත ආයතන හා පර්යේෂණ ආශ්‍රිත කටයුතු ප්‍රවර්ධනය සඳහා ද වැලිගම කොළ මැලවීමේ හා අතු හැකිළීමේ රෝගය ව්‍යාප්ත වීම මර්දනය කිරීමට ද පොල් වගා අංශයේ ආයතනික සහාය තවදුරටත් ශක්තිමත් කරන ලදී.** ආරක්ෂිත කලාප පවත්වා ගෙන යෑම හා පීඩාවට පත් ගොවීන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට පියවර ගනිමින් වැලිගම කොළ මැලවීමේ හා අතු හැකිළීමේ රෝගය පාලනය කිරීමේ වැඩසටහන හරහා එම රෝගය ව්‍යාප්තියට එරෙහිව පියවර ගන්නා ලදී. මේ අතර, පොල් නැවත වගාව හා නව වගාව සඳහා වූ සහනාධාර වැඩපිළිවෙළ යටතේ මෙම වසර තුළ දී රුපියල් මිලියන 123 ක් ලබා දෙන ලදී. ඒ අනුව, නැවත වගාව හා යටි වගාව සිදු කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 4,919 ක් වූ අතර, නව වගා භූමි ප්‍රමාණය හෙක්ටයාර 1,150 ක් විය. මේ අතර, 2014 වසරේ අග භාගය දක්වා දේශීය වෙළඳපොළ තුළ පැවැති ඇඩි පොල් හිඟය හේතුවෙන් 2014 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද පොල් ගෙඩි වශයෙන් අපනයනය කිරීම සඳහා වූ තහනම, පොල් අංශයේ සතුටුදායක ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගෙන 2015 ජූනි මස දී ඉවත් කිරීමට කටයුතු කළ නමුත් පොල් නිෂ්පාදිත ආනයනය හා අපනයනය මත පනවන ලද බදු බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, පොල් ගෙඩි අපනයනය මත ක්‍රියාත්මක බදු නොවන බාධක මගින් පොල් අපනයනය තවදුරටත් අධෛර්යමත් විය. මේ අතර, වසර තුළ දී පාම් තෙල් ආනයනය මත පනවා තිබූ තීරු බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 90.00 සිට රුපියල් 105.00 දක්වා ඉහළ නංවන ලද අතර, පිරිසිදු නොකළ පාම් තෙල් හා වෙනත් තෙල් සඳහා වූ බදු පිළිවෙළින් කිලෝග්‍රෑමයකට රුපියල් 110.00 ක් හා රුපියල් 125.00 ක් දක්වා ඉහළ නංවන ලදී. මෙම තීරු බදු සංශෝධන දේශීය පොල් තෙල් කර්මාන්තය මත යහපත් බලපෑමක් ඇති කිරීමට සමත් වුවද, 2015 වසරේ දී ගෝලීය වෙළඳපොළ තුළ ආහාරයට ගන්නා තෙල් වර්ග මිල ගණන් අඛණ්ඩව පහළ යමින් පොල් තෙල් මිල ගණන්වලට වඩා අඩු මට්ටමක පැවැතීම හේතුවෙන් එම තෙල් වර්ග ආනයනය ඉහළ ගියේය. මේ අතර, පොල් නිෂ්පාදන අංශයේ සංවර්ධනය සඳහා රජයේ ආයතන විසින් 2015 වසරේ දී සිදු කළ ප්‍රාග්ධන වියදම 2014 වසරේ දී වැය කළ රුපියල් මිලියන 767 ට සාපේක්ෂව රුපියල් මිලියන 663 ක් විය.

**2015 වසරේ දී දේශීය සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කරන ලදී.** වසර තුළ දී උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, බදුල්ල, කිලිනොච්චිය සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රදේශයන්හි උක් ආශ්‍රිත කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත ස්ථාපිත කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2015 වසරේ දී කන්තලේ සීනි කර්මාන්තශාලාව වැඩිදියුණු කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගනු ලැබුව ද කන්තලේ ප්‍රධාන උක් පැළ තවාන්වල කළු දුඹුලු රෝගය, ශල්ක පත්‍ර ප්‍රදාහය හා ශ්වේත පත්‍ර රෝගය ඇතිවීම හේතුවෙන් බොහෝ තවාන් විනාශ වූ අතර, වඩාත් හොඳ උක් වර්ග 6 ක් සහිතව හෙක්ටයාර 25 ක පමණ ප්‍රමාණයක අලුතෙන් තවාන් දමන ලදී. තවද,

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් කන්තලේ කර්මාන්තශාලාව නැවතත් ආරම්භ කිරීම සඳහා යෝග්‍ය ව්‍යවසායකයෙකු සෙවීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම කර්මාන්තය ඉහළ නැංවීම සඳහා පවතින බාධා ලෙස ස්ථිර ප්‍රතිපත්ති හා රෙගුලාසි හිඟ වීම, ඵලදායිතාව අඩු වීම සහ ගුණාත්මක උක් පැළ නිෂ්පාදන ක්‍රමයක් නොමැති වීම දැක්විය හැක. එම නිසා නිෂ්පාදන විවිධාංගීකරණය ඉහළ නැංවීම, උක් සඳහා ස්ථිර වෙළඳපොළක් ස්ථාපිත කිරීම සහ නව වැඩිදියුණු කළ උක් ප්‍රභේද, තාක්ෂණය සහ දැනුම හඳුන්වා දීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. තවද, ප්‍රධාන සීනි කර්මාන්තශාලාවල කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධ වී ඇති බැවින් සීනි කර්මාන්තය වර්ධනය කිරීමට පහසුකම් සැලසිය හැකි අයුරින් සීනි කර්මාන්තශාලා තුනම තනි අමාත්‍යාංශයක් යටතට ගෙන ඒම වඩාත් යෝග්‍ය වේ.

**වසර තුළ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, කෘෂිකාර්මික නිෂ්පාදනවල පවතින ඍතුමය අසමතුලිතතාවයන් කළමනාකරණය කරමින් විශේෂයෙන්ම දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීම සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවන ලදී.** 2015 වසරේ දී ඉහළ අනුවර්තතාවයකින් හා ඵලදායිතාවකින් යුතු නව වී ප්‍රභේදයක් දේශීය වගාවට හඳුන්වා දුන් අතර මිරිස්, රට කජු හා ඉරිඟු සඳහා නව ක්ෂේත්‍ර භෝග ප්‍රභේද තුනක් හඳුන්වා දෙන ලදී. ඒ අතරම, මාළු මිරිස්, කරවිල, තුඹ කරවිල, මෑ සහ බිම් මල් නව ප්‍රභේද ද වගා කටයුතු සඳහා නිකුත් කරන ලදී. තවද, දේශීය ලොකු ළූණු නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ ඉලක්කය ඇතිව අනුරාධපුර, හම්බන්තොට හා මන්නාරම යන දිස්ත්‍රික්කවල ගම්මාන තුනක් ලොකු ළූණු බීජ නිෂ්පාදන ආදර්ශ ගම්මාන ලෙස තෝරා ගන්නා ලදී. ඒ අනුව, "ශ්‍රී ලංකාවේ ලොකු ළූණු ප්‍රභේදයන්ගේ බීජ ගුණනය හා වගා තාක්ෂණ සංවර්ධනය" පිළිබඳ ව්‍යාපෘතිය යටතේ කොරියාවෙන් ආනයනය කරන ලද යෙදවුම් භාවිතා කරමින් එම ගම්මාන තුනෙහිම හෙක්ටයාර දෙකක භූමි ප්‍රමාණයක වැසි ආවරණ ඉදිකරන ලදී. තවද, මිලියන 2.2 ක පමණ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කර ඇති අතර, "පලතුරු ගම්මාන සංවර්ධන වැඩසටහන" යටතේ තෝරාගත් දිස්ත්‍රික්කවල පලතුරු ගම්මාන 54 ක් පිහිටුවීම සඳහා පැළ නිකුත් කරන ලදී. මේ අතර, මහනුවර, මාතලේ, කෑගල්ල, මුලතිව්, කිලිනොච්චි හා මන්නාරම යන දිස්ත්‍රික්ක අර්තාපල් වගාව සඳහා සුදුසු ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති අතර, නව ඉඩම් හෙක්ටයාර 500 ක් පමණ අර්තාපල් වගාව සඳහා යොදා ගත හැකි බවට ඇස්තමේන්තු කර ඇත. තවද, තෝරාගත් කෘෂිකාර්මික නිෂ්පාදිතවලින් ස්වයංපෝෂිත වීමේ හා ආහාර ද්‍රව්‍ය ආනයනය සීමා කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2015 ඔක්තෝබර් මාසයේ දී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණමඩුහි දී "ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන" සංවිධානය කරන ලදී. තරුණ ප්‍රජාව කෘෂිකර්මය වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් "තරුණ කෘෂි ව්‍යවසායකත්ව මෙහෙයුම් වැඩසටහන" අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර 2015 වසරේ දී තරුණ ව්‍යවසායකයින් 848 කට එම වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමිවිය. පසු අස්වනු කර්මාන්ත මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සඳහා 2015 වසරේදීත් පසු අස්වනු තාක්ෂණ ආයතනය සිය පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, වසර තුළ දී පර්යේෂණ ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කරන ලදී. තවද, පසු අස්වනු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික දැනුම බෙදා දීමේ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවක් වෙත ඵලදායි තාක්ෂණික දැනුම ලබාදීම සඳහා රට පුරා විවිධ දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 10 ක් පිහිටුවන ලදී. ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබුව ද, ලොකු ළූණු සම්බන්ධයෙන් ගත් කල, ගොවිපළ මට්ටමින් ළූණු ගබඩා කළ හැකි නිසි ක්‍රමවේදයක් තවමත් භාවිතයේ නොමැත. ගොවීන් බහුතරයක් අස්වනු නෙලන සමයේ දී ගොවිපළෙහිදීම සිය අස්වනු අඩු මිලකට ලබාදීම සිදු කිරීමෙන් අවාරයේදී මිල ගණන් ඉහළ යෑම සිදුවන බැවින් වෙළඳපොළ සැපයුම් තත්ත්වයන් හා මිල මට්ටම් මත ඇති වන අනවශ්‍ය පීඩනය වළක්වා ගැනීම සඳහා ගොවිපළ මට්ටමින් ළූණු ගබඩා කිරීමේ ක්‍රමවේදයක් සැකසීමේ ඇඩි අවශ්‍යතාවයක් පවතී. තවද, 2016 අයවැය මගින් ප්‍රධාන කෘෂි පර්යේෂණ ආයතනයන්හි පර්යේෂණ ශක්‍යතාවය වැඩිදියුණු කිරීමට අගය එකතු කරන ලද කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් යෝජනා කරන ලදී. මේ අතර, කුරුඳු අගය දාමය වර්තමානයේ විවිධ ආයතන යටතේ පැවැතීම, එහි වර්ධනය අඩාල කරනු ලබන බැවින් අගය දාමයේ සියලු ක්‍රියාකාරකම් එක් ආයතනයක් යටතට ගෙන ඒම සඳහා පෞද්ගලික අංශයේ ද සහභාගිත්වය ඇතිව කුරුඳු සංවර්ධන අධිකාරිය පිහිටුවීමට කටයුතු කරනු ඇත.

**රටේ වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් රජයේ ක්‍රියාකාරකම් 2015 වසරේ දී තවදුරටත් ක්‍රියාත්මක විය.** ජනගහනයේ හා ආර්ථික ක්‍රියාකාරකම්වල ඉහළ යෑමත් සමඟ, නියං තත්ත්වයන්ට හා කාලගුණික වෙනස්වීම් මගින් ඇතිවන බලපෑම්වලට මුහුණ දීම සඳහා ජලය එක්රැස් කර ගැනීම ඉහළ නංවා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගත් කල, 2015 වසරේ දී රුගම් කිතුල් ජලාශය හා බෙන්තර ගඟ

දකුණු ඇළ ජලාපවාහන සහ කරදිය බාධක යෝජනා ක්‍රමය යන නව වාරි ව්‍යාපෘති ද්විත්වය ආරම්භ කළ අතර, එමගින් පිළිවෙළින් හෙක්ටයාර 15,000 ක හා හෙක්ටයාර 810 ක භූමි ප්‍රමාණයකට පහසුකම් සැලසේ. මෙම ව්‍යාපෘති දෙක යටතේ පවුල් 3,450 ක් පමණ ප්‍රතිලාභ ලබනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර, වසර තුළ දී ලංකාවේ විශාලතම ජලාශ දෙකක් වන දැදුරු ඔය හා යාන් ඔය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 7,086 ක් වැය කරන ලදී. කෙසේ වුවද, ජලාශවල රොන්මඩ පිරීමත් සමඟ ජලය රඳවා ගැනීමේ හැකියාව සීමා වීමෙන් අඩු වර්ෂාපතනයක් සහිත කාලවලදී ගොවීන්ට වගා කටයුතු සඳහා බාධා ඇති වේ. එබැවින් ගංවතුර ඇතිවීම වළක්වා ගැනීමට හා ජලාශ තුළ රඳවාගත හැකි ජල ධාරිතාව වැඩි කිරීමට, නියමිත කාලවල දී ජලාශවල රොන්මඩ ඉවත් කිරීම සහතික කිරීම වැදගත් වේ. තවද වාරිමාර්ග ව්‍යාපෘති ඉදිකිරීම හා කළමනාකරණය, පාරිසරික උවදුරු අවම වන සේ කාර්යක්ෂමව සිදු කළ යුතුය. එසේම, ග්‍රාමීය කෘෂිකාර්මික කටයුතුවලට සහය වීම සඳහා කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් රුපියල් මිලියන 2,000 ක් වෙන් කිරීමට ද යෝජනා වී තිබේ.

**පශු සම්පත් අංශයේ සංවර්ධනය උදෙසා සකස් කළ ප්‍රධාන සැලැස්මට සමගාමීව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැඩසටහන් රැසක් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, රට තුළ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට උසස් තත්ත්වයේ ගවයින් ගහනය වැඩි කිරීමේ අරමුණින් පශු සම්පත් අභිජනන ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. මී ගව පැටවුන් පරීක්ෂා කිරීම හා තෘණ භූමි සංවර්ධනය කිරීම, මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. රටේ එළ ගව හා මී ගව ගහනය වැඩි දියුණු කිරීමට වසර තුළ දී කෘත්‍රිම සිංචන 227,108 ක් සිදු කරන ලදී. මේ අතර, කෘත්‍රිම සිංචන මගින් බිහිකර ගන්නා ලද ගැහැණු පැටවුන් පෝෂණය හා පාලනය කිරීම සඳහා ගොවීන්ට සහය ලබාදෙන "පැටවුන් වැඩි වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය" යටතේ පැටවුන් 33,152 ක් පමණ ලියපදිංචි කරන ලදී. තවද, පශු සම්පත් සංවර්ධනය සඳහා වන ආයතනික සහාය ශක්තිමත් කරමින්, "ක්ෂේත්‍ර පශු වෛද්‍ය සේවා සංවර්ධන වැඩසටහන" යටතේ පශු වෛද්‍ය පරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් දන්කොටුව හා ආගරපතන ප්‍රදේශවල ස්ථාපිත කරන ලදී. මනා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කරමින් 2016 වසරේදී ද පශු සම්පත් අංශය තවදුරටත් ශක්තිමත් කිරීම රජයේ අපේක්ෂාවයි. ඒ අනුව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ වාණිජ පරිමාණයේ කිරි නිෂ්පාදනය ශක්තිමත් කිරීමට රුපියල් මිලියන 25 ක අවම ආයෝජන සඳහා ප්‍රයෝජනයට නොගත් හෝ ඌන උපයෝජිත රජයේ ඉඩම් ලබාදීමට 2016 අයවැය යටතේ යෝජනා කරන ලදී. තවද, දේශීය කිරි නිෂ්පාදකයින් දිරිමත් කිරීම සඳහා දේශීයව නිපද වූ ග්‍රෑම් 400 ක කිරිපිටි පැකට්ටුවක උපරිම සිල්ලර මිල දැනට පවතින රුපියල් 325 ක සිට රුපියල් 295 ක් දක්වා පහත හෙළමින් කිරිපිටි පැකට්ටුවක් සඳහා රුපියල් 30 ක සහනාධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

**ධීවර අංශය සඳහා වූ ප්‍රතිපත්ති, ගැඹුරු මුහුදේ ධීවර කටයුතු ඉහළ නැංවීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි යොමු විය.** යුරෝපා සංගමයේ රටවල් වෙත මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීමට පනවා ඇති තහනම ඉවත් කරවා ගැනීම සඳහා අවශ්‍ය යුරෝපා සංගමය මගින් පැනවූ ප්‍රමිතීන් සපුරාලීමට අදාළ රෙගුලාසි ඉටු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පියවර රැසක් ගන්නා ලදී. උතුරු පළාතේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය පැටවුන් සම්පාදනය කිරීමේ අරමුණ ඇතිව ඉරණමඩු ප්‍රදේශයේ ජලජීවී සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවන ලද අතර, මඩකලපුවේ කාර්මික ජලජීවී උද්‍යානයක් පිහිටුවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇත. තවද, මිරිදිය ජලාශවල ඉස්සන් පැටවුන් ව්‍යාප්තිය මගින් නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන් යුතු නැවත මිලදී ගැනීමේ වැඩසටහනක් ස්ථාපිත කරන ලදී. මේ අතර, 2015 වසරේ දී මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉස්සන් වගා කටයුතු පුළුල් කිරීමට පියවර ගෙන ඇත. මිරිදිය මත්ස්‍ය වගාව සඳහා වාරි ජලාශ විශාල සංඛ්‍යාවක් යොදා ගැනීමට අමතරව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ප්‍රජා හා පුද්ගලික අංශයේ සහභාගිත්වයෙන් මෝදා මසුන් වගාව (sea bass), මුහුදු කූඩැල්ලන් වගාව (sea cucumber) හා මුහුදු පැළෑටි වගාව (sea weed) වැනි සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන් ප්‍රචලිත කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම සිදු කරන ලදී. වියට්නාමය හා ජාතික ජලජීවී වගා අධිකාරිය අතර, ඇතිකර ගන්නා ලද අවබෝධතා ගිවිසුම යටතේ, පෞද්ගලික අභිජනනාගාර තුළ මුහුදු කූඩැල්ලන් අභිජනන තාක්ෂණය හඳුන්වා දෙන ලද අතර, 2015 වසරේ දී මුහුදු කූඩැල්ලන් පැටවු 239,000 ක් නිෂ්පාදනය කරන ලදී. තවද, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ පෞද්ගලික අභිජනනාගාර තුළ මෝදා මත්ස්‍ය පැටවුන් 250,000 ක් නිපදවන ලදී. මුහුදු මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම සඳහා ධර්මපුරම්හි මුහුදු මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකිරීමට ද කටයුතු කරන ලදී. ජලජීවී වගා අංශයේ අගය දාමයේ ප්‍රමාණවත් නොවන සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනයේ දී ප්‍රබල බාධකයක්ව පවතින බැවින් ලෝක කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව ජලජීවී වගා අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ක්‍රමෝපාය සැලැස්මේ කෙටුම්පත පිළියෙළ කරන ලදී. මේ අතර, 2016 අයවැයෙන් යෝජනා කළ පරිදි දේශීය

ධීවර වරායන් අති නවීන තාක්ෂණික පහසුකම් සහිතව සංවර්ධනය කෙරෙනු ඇත. තවද, කෘෂි හා මත්ස්‍ය සැපයුම් සඳහා පහසුකම් සලසමින් කෘෂි, පශු සම්පත් හා මත්ස්‍ය සැකසුම් කලාපයක් අනුරාධපුර, වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්ක සම්බන්ධ කරමින් නිර්මාණය කෙරෙනු ඇත. මේ අතර, දේශීය මත්ස්‍ය කර්මාන්තය සුරැකීමේ අරමුණ ඇතිව මාළු ආනයනය මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 50.00 දක්වා ඉහළ නැංවූ අතර, මාළු දැල් සඳහා වන ආනයන බදු පහත හෙලන ලදී.


## කර්මාන්ත

**කර්මාන්ත කටයුතු තුළ පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය, ජලය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඉදිකිරීම් යන ක්‍රියාකාරකම් ඇතුළත් වේ.** මෙම ක්‍රියාකාරකම්වල සමස්ත එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 3.0 කින් වර්ධනය විය. මේ සඳහා නිෂ්පාදන කර්මාන්තවල සිදු වූ ඉහළ වර්ධනය ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, විදුලිය ආශ්‍රිත ක්‍රියාකාරකම්, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්, හා ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් ද කර්මාන්ත ක්‍රියාකාරකම්වල වර්ධනයට ධනාත්මක දායකත්වයක් සපයන ලදී. කෙසේ වුවද, පතල් හා කැණීම් සහ ඉදිකිරීම් කර්මාන්ත ආශ්‍රිතව 2015 වසර තුළ දී සිදු වූ පසු බැසීම කර්මාන්ත අංශයේ වර්ධනයට අයහපත් ලෙස බලපා ඇත.

## පතල් හා කැණීම්

**පතල් හා කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 2.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 0.9 ක පහත වැටීමක් වාර්තා කර ඇත.** මෙහිදී ඉදිකිරීම් කටයුතුවල දක්නට ලැබුණු දුර්වල ක්‍රියාකාරිත්වය පතල් හා කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා ද අයහපත් ලෙස බලපාන ලදී. ඛනිජ ද්‍රව්‍ය අපනයන පරිමා දර්ශකය 2014 වසරේ දී වාර්තා කළ සියයට 95.7 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 48.1 කින් පහත වැටී ඇත. එසේම, වසර තුළ දේශීය පොස්පේට් නිෂ්පාදනයේ ද පසුබැසීමක් වාර්තා වී ඇත. කෙසේ වුවද, ඉල්මනයිට් නිෂ්පාදනයේ සිදු වූ සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් මෙම වසර තුළ දී ඛනිජ වැලි නිෂ්පාදනය ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. තවද, වසර තුළ දී මිනිරන් නිෂ්පාදනයේ ද ප්‍රගතියක් වාර්තා වී ඇත.

**2.3 රූප සටහන** කර්මාන්තවල දළ එකතුකළ අගය (2010 ස්ථාවර මිල)




## නිෂ්පාදන කර්මාන්ත

**කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා ඉහළම දායකත්වය සපයන්නා වූ නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ දී වාර්තා කළ සියයට 2.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.7 කින් වර්ධනය විය.** මේ සඳහා 2014 වසරේ දී සියයට 1.3 කින් පමණ ඉහළ ගිය ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු 2015 වසරේ දී සියයට 5.6 කින් වර්ධනය වීම බෙහෙවින් දායක විය. තවද, වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය යන කර්මාන්ත ද, නිෂ්පාදන කර්මාන්තවල සිදු වූ වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. කෙසේ වුවද, ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදනය 2015 වසර තුළ දී සියයට 2.8 ක පහත වැටීමක් වාර්තා කර ඇත.

## කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය රටෙහි කර්මාන්ත අංශයේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන ප්‍රධානම දර්ශකයකි.**[3] මෙම දර්ශකය ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණයේ 4 වන සංශෝධනයට (ISIC Revision 4) අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 17 ක් ආවරණය කරයි.

**ඇතැම් ප්‍රධාන අංශයන්හි නිෂ්පාදනය සහ දේශීය ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2015 වසරේ දී කර්මාන්තශාලා නිෂ්පාදනය අඛණ්ඩ වර්ධනයක් පෙන්වීය.** කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය පසුගිය

3 එක් එක් කර්මාන්ත අංශය සඳහා කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ බරතැබීම් 2010 වසර පදනම් වර්ෂය ලෙස සලකමින් සිදු කර ඇත. අනතුරුව ආර්ථිකයේ දක්නා ලද සැලකිය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් සාපේක්ෂව ඉහළ බරතැබීමෙන් යුත් නැගී එන නව කර්මාන්ත ඇති වූ අතර, නියැදියේ දැනට පවතින ඇතැම් කර්මාන්තවල වැදගත්කම අඩු වී ඇත. එම කරුණු කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ මීළඟ සංශෝධනයේ දී සලකා බැලෙනු ඇත.

**2.9 සංඛ්‍යා සටහන**

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය**
**2010 = 100**

| කාණ්ඩය | 2014 (අ) | 2015 (ආ) | වාර්ෂික වෙනස්වීම % 2013/14 (අ) | වාර්ෂික වෙනස්වීම % 2014/15 (ආ) |
|---|---|---|---|---|
| 1. ආහාර නිෂ්පාදිත (23.7%) | 102.3 | 107.3 | -2.8 | 4.9 |
| 2. පාන වර්ග (8.1%) | 111.8 | 123.1 | 9.2 | 10.1 |
| 3. දුම්කොළ නිෂ්පාදිත (8.4%) | 87.6 | 95.4 | -9.3 | 8.9 |
| 4. රෙදිපිළි (1.6%) | 132.9 | 131.0 | 3.4 | -1.4 |
| 5. ඇඟලුම් (23.1%) | 149.5 | 173.4 | 19.7 | 16.0 |
| 6. සම් සහ ආශ්‍රිත නිෂ්පාදිත (0.8%) | 97.0 | 86.4 | -1.4 | -10.9 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව සහ දැව නිෂ්පාදිත (0.1%) | 108.9 | 121.7 | -4.9 | 11.7 |
| 8. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (0.1%) | 126.6 | 126.6 | 2.6 | 0.0 |
| 9. මුද්‍රණය සහ තැටි පිටපත් කිරීම (0.7%) | 112.4 | 112.4 | 1.9 | 0.0 |
| 10. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත (2.2%) | 86.0 | 82.6 | 3.1 | -3.9 |
| 11. රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත (6.3%) | 82.2 | 88.3 | 10.8 | 7.5 |
| 12. ඖෂධ, ඖෂධීය සහ උද්භිද විද්‍යාත්මක නිෂ්පාදිත (0.1%) | 142.8 | 142.2 | -22.9 | -0.4 |
| 13. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (10.5%) | 134.2 | 131.3 | 13.6 | -2.2 |
| 14. අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (7.2%) | 102.9 | 118.5 | -0.3 | 15.1 |
| 15. මූලික ලෝහ නිෂ්පාදිත (1.0%) | 112.9 | 115.0 | 10.3 | 1.8 |
| 16. යන්ත්‍රෝපකරණ සහ උපකරණ හැර, සකස් කළ ලෝහ නිෂ්පාදිත (3.8%) | 97.1 | 109.8 | -12.7 | 13.0 |
| 17. විදුලි උපකරණ (2.3%) | 99.5 | 130.6 | -7.6 | 31.3 |
| **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය** | **114.9** | **125.4** | **6.1** | **9.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : 1 කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ (2010=100) බර තැබීම වරහන් තුළ දක්වා ඇත.
2 කාර්මික නිෂ්පාදන දර්ශකය, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය ලෙස 2013 වසරේ දී නැවත නම් කරන ලදී.


වසරේ වාර්තා වූ සියයට 6.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 9.2 ක වර්ධනයක් පෙන්වීය. මෙම වර්ධනය සඳහා ආහාර, පාන වර්ග, ඇඟලුම්, දුම්කොළ නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත, මූලික ලෝහ, විදුලි උපකරණ සහ අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත උප අංශයන්හි යහපත් ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, රෙදිපිළි, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදිත උප අංශ තුළ පසුගිය වසරට වඩා පසුබෑමක් 2015 වසරේ දී වාර්තා විය.

කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන ආහාර නිෂ්පාදිත උප අංශය, 2015 වසරේ වැඩි කාලසීමාවක් තුළ ධනාත්මක ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර, 2014 වසරේ දී වාර්තා වූ සියයට 2.8 ක පසුබෑමට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.9 ක වාර්ෂික වර්ධනයක් අත්කර ගන්නා ලදී. කිරි එකතු කිරීම ඉහළ යෑම හේතුවෙන් කිරි නිෂ්පාදිත ඉහළ යෑම, සකස් කරන ලද ආහාර, බේකරි නිෂ්පාදිත, මැකරෝනි, නූඩ්ල්ස් සහ එවැනි නිෂ්පාදිත මෙන්ම සකස් කරන ලද සත්ත්ව ආහාර නිමැවුම ඉහළ යෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, වසර තුළ දී වර්ෂාපතනය යහපත් ලෙස පැවැතීම හේතුවෙන් උක් වගාව ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස සීනි නිෂ්පාදනය සියයට 34.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, වෙරළ හා කලපු ආශ්‍රිත මත්ස්‍ය කර්මාන්තයෙහි පහළ යෑම හේතුවෙන් මුහුදු මත්ස්‍ය කර්මාන්තයෙහි පසුබෑම සහ ප්‍රධාන වශයෙන් 2015 වසරේ පළමු භාගය තුළ පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පහළ යෑම, මාළු සැකසුම් හා සංරක්ෂණය සියයට 2.8 ක ඍණාත්මක වර්ධනයක් පෙන්වීම සඳහා හේතුවිය.


කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ ආහාර නිෂ්පාදන උප අංශය හා සමාන වැදගත්කමක් උසුලමින් රටේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන දායකත්වය සපයන ඇඟලුම් නිෂ්පාදිත අංශයෙහි සතුටුදායක ක්‍රියාකාරිත්වය 2015 වසර තුළ දී ද අඛණ්ඩව පැවතුණි. මෙම අංශයේ සමස්ත වර්ධනය, පසුගිය වසරේ වාර්තා වූ සියයට 19.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 16.0 ක තරමක අඩු වර්ධනයක් පෙන්වීය. ගෝලීය ප්‍රමිතීන් හා අනුගත වෙමින් ගුණාත්මකභාවය හා නවෝත්පාදන පවත්වා ගන්නා අතරතුර ඉතා ඉක්මනින් විශ්වාසවන්ත ලෙස

**2.4 රූප සටහන**

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය (2010 = 100)**



**2.5 රූප සටහන** **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතිය - 2015**




භාණ්ඩ සපයන්නකු ලෙස ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශය ලෝකයේ පිළිගැනීමට ලක්ව ඇත. තවද, ශ්‍රම කළමනාකරණය සහ පරිසර සංරක්ෂණය සඳහා ඇති යහපත් කර්මාන්ත පුරුදු, ශ්‍රී ලංකාව ශ්‍රමික ආචාරධර්ම සහ පාරිසරික තත්ත්වයන් පවත්වා ගනිමින් ඇඟලුම් නිෂ්පාදනය කරන ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කර ඇත. එමෙන්ම, විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) නැවත ස්ථාපිත වීමේ ප්‍රවණතාව සහ ස්වයංක්‍රීයකරණය ඉහළ නැංවීම මගින් ශ්‍රම ඵලදායීත්වය ඉහළ නැංවීම ආදිය නුදුරු අනාගතයේ දී ඇඟලුම් කර්මාන්තයට ධනාත්මකව බලපානු ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන අපනයන වෙළඳපොළ මගින් වෙළඳ සහනයක් ලබා ඇති අඩු පිරිවැය ඇඟලුම් නිෂ්පාදකයන්ගේ දැඩි තරගය හමුවේ, මිල තරගකාරිත්වය ඉහළ නැංවීම, සන්නාම අනන්‍යතාවය උපයෝගී කරගෙන නිශ්චිත වෙළඳ ස්ථානයන් හඳුනා ගැනීම සහ සාම්ප්‍රදායික නොවූ අපනයන වෙළඳපොළට වෙත පිවිසීම මගින් වෙළඳපොළ විවිධාංගීකරණය යනාදිය කෙරෙහි ඇඟලුම් කර්මාන්තය යොමු විය යුතු වේ.


**2015 වසරේ දී පාන වර්ග උප අංශය 2014 වසරේ දී පැවැති සියයට 9.2 ක වර්ධනය අභිබවමින් සියයට 10.1 ක සැලකිය යුතු වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය.** මෙම උප අංශය සඳහා විශාලතම දායකත්වය සපයන සැර මත්පැන් නිෂ්පාදනයේ ඉහළ යෑම මෙම වර්ධනය සඳහා මූලික විය. ඊට අමතරව, සිසිල් බීම නිෂ්පාදනය, ඛනිජ ලවණ අඩංගු පානීය ජලය සහ බෝතල් කළ පානීය ජලය සියයට 18.2 කින් සහ මෝල්ට් අඩංගු කිරි නිෂ්පාදිත සියයට 8.8 කින් වර්ධනය වීම ද පාන වර්ග උප අංශයේ සමස්ත වර්ධනයට හේතු විය. වසර තුළ දී සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යෑම, මෙම උප අංශයේ ප්‍රසාරණයට විශාල ලෙස හේතු විය.

**රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත උප අංශය 2014 වසරේ පැවැති සියයට 10.8 ක වර්ධනය හා සසඳන විට 2015 වසරේ දී සියයට 7.5 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය.** තීන්ත සහ වාර්නිෂ් නිමැවුම සියයට 53.9 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් ප්‍රසාරණය වීම මෙම උප අංශයේ ඉහළ ගිය ක්‍රියාකාරිත්වයට හේතු විය. තවදුරටත්, මෙම උප අංශයේ සමස්ත ක්‍රියාකාරිත්වයට උපකාරී වෙමින් සබන් සහ පවිත්‍රකාරක නිෂ්පාදනය ද සියයට 4.3 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම උප අංශයේ නිමැවුමට ප්‍රධාන දායකත්වයක් සපයන පොහොර නිෂ්පාදනය, වසර තුළ දී සියයට 0.8 කින් වර්ධනය විය.

**ප්‍රධාන වශයෙන් නැව් තැනීම් සහ අලුත්වැඩියා කිරීම්වලින් සමන්විත වන සකස් කළ ලෝහ නිෂ්පාදිත උප අංශය පසුගිය වසර තුළ දී ඇති වූ තියුණු පසුබෑමට සාපේක්ෂව මෙම වසර තුළ දී ධනාත්මක ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.** ප්‍රධාන ලෙසම තෙල් කැණීම සඳහා භාවිතා කරන අක්වෙරළ ආධාරක යාත්‍රා සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් කලාපීය තරගය හමුවේ වුවද, නැව් තැනීම් සහ අලුත්වැඩියා කටයුතු සියයට 20 කින් පමණ ඉහළ ගියේය. ඊට අමතරව, ජාත්‍යන්තර නැව් ගමනාගමන මාර්ගයේ සන්ධිස්ථානයක් වූ ශ්‍රී ලංකාවේ භූ-ගෝලීය පිහිටීම, නැව් ඉදිකිරීම හා අලුත්වැඩියාව සඳහා වූ ජාත්‍යන්තර ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම කර්මාන්තයට අවස්ථාව ලබා දෙන ලදී. කෙසේ වෙතත්, නැව් තැනීම් සිදු කරන කලාපීය රටවලින් එල්ල වන තරගයට මුහුණ දීම සඳහා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයක් සමග කර්මාන්තයෙහි තාක්ෂණය සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම තත්ත්වය තුළ අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින්, සංචාරක සහ මගී සේවා සඳහා භාවිතා කරන යාත්‍රා නිෂ්පාදනය තුළින් නිෂ්පාදන කටයුතු ව්‍යාප්ත කිරීමේ හැකියාව පිළිබඳව විමසා බැලිය යුතුව ඇත.

**අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත උප අංශය පසුගිය වසරේ දී වාර්තා කළ මන්දගාමී ක්‍රියාකාරිත්වය සමග සසඳන කල 2015 වසරේ දී සියයට 15.1 ක හිතකර වර්ධනයක් වාර්තා කරන ලදී.** ඉහළ පාරිභෝගික ඉල්ලුම හේතුවෙන් සිමෙන්ති, හුණු සහ බදාම නිෂ්පාදනය සියයට 21.1 කින් වර්ධනය වීම සහ කොන්ක්‍රීට්, සිමෙන්ති සහ බදාම ආශ්‍රිත නිෂ්පාදන සියයට 24.5 කින් වර්ධනය වීම මෙම උප අංශයේ නිමැවුම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ආනයනික නිෂ්පාදන වෙතින් පැවැති තරගකාරිත්වය හමුවේ වුවද, පිඟන් මැටි හා පෝසිලේන් නිෂ්පාදනය සියයට 2.4 කින් වර්ධනය විය. සෞඛ්‍ය හේතුන් මත, 2018 වසරේ සිට ඇස්බැස්ටස් නිෂ්පාදන තහනම් කිරීම

**2.6 රූප සටහන** **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික වර්ධනය**




සලකා බැලීමට රජය මෑතක දී ගනු ලැබූ තීරණය ඇස්බැස්ටස් ආශ්‍රිත නිෂ්පාදනවලට අවාසිදායක වුවද, මැටි ආශ්‍රිත ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයට හිතකර ලෙස බලපානු ඇත.

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සියයට 2.3 කට ආයක වන විදුලි උපකරණ නිෂ්පාදන උප අංශය පසුගිය වසරේ වාර්තා කළ සියයට 7.6 ක පසුබෑමට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 31.3 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.** දේශීය බලශක්ති අංශය මෙන්ම විදේශීය වෙළඳපොළ වෙතින් පැවැති ඉහළ ඉල්ලුම හේතුවෙන් පරිණාමක, විදුලි රැහැන් සහ විදුලි කෝෂ නිෂ්පාදනය ඉහළ යෑම මෙම උප අංශයේ වර්ධනයට හේතු විය.

**පසුගිය වසර තුන තුළ දී වාර්තා වූ මන්දගාමී ප්‍රවණතාවය ආපසු හරවමින්, දුම්කොළ නිෂ්පාදිත උප අංශය 2015 වසරේ දී සියයට 8.9 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය.** පසුගිය වසරට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් පුද්ගල ආදායම් ඉහළ යෑම හේතුවෙන් වසරේ පළමු භාගය තුළ දී දුම්කොළ නිෂ්පාදිත සඳහා ඉහළ ඉල්ලුමක් දැකගත හැකි විය. කෙසේ වුවද, 2015 වසරේ සිව්වන කාර්තුව තුළ දී මෙම උප අංශය සියයට 6.1 කින් පහත වැටුණු අතර, නිෂ්පාදන බදු වැඩි වීම හේතුවෙන් සිගරට් මිල ඉහළ යෑමත්, සිගරට් නිෂ්පාදන ඇසුරුම් මත සියයට 80 ක ප්‍රමාණයක් රූපමය අවවාද ප්‍රදර්ශනය අනිවාර්ය කිරීමට රජය නීති පැනවීමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**2014 වසරේදී සියයට 10.3 කින් වර්ධනය වූ මූලික ලෝහ නිෂ්පාදිත 2015 වසර තුළ දී සියයට 1.8 කින් වර්ධනය විය.** පසුබෑමකට ලක් වූ දේශීය ඉදිකිරීම් ක්‍රියාකාරකම් හේතුවෙන් මූලික ලෝහ හා වානේ නිෂ්පාදිත සඳහා ඉල්ලුම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස වසරේ පළමු භාගය තුළ දී නිෂ්පාදනය පහළ යෑම වසරේ මුල් කාලසීමාව තුළ දී නිමැවුම අඩු වීමට හේතු වූ ප්‍රධානතම සාධකය විය. කෙසේ වෙතත්, වසරේ අග භාගයේදී ඉහළ ගිය ඉල්ලුම මෙම අංශයේ සමස්ත වර්ධනයට උපකාරී විය.

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පිරිපහදු කරන ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් මුළුමනින්ම සමන්විත වන පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත උප අංශය 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 3.9 කින් පහත වැටුණි.** 2015 වසරේ මුල් භාගයේ දී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව නඩත්තු කටයුතු සඳහා වසා තැබීම හේතුවෙන් පිරිපහදු කටයුතු පහත වැටීම මෙම උප අංශයේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශය පසුගිය වසරට සාපේක්ෂව 2015 වසර මුළුල්ලේම මන්දගාමී ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය.** මෙම උප අංශය වසර තුළ දී සියයට 2.2 කින් පහත වැටුණි. මෙම උප අංශයේ නිමැවුම සඳහා වැඩි දායකත්වයක් දක්වන රබර් ටයර් සහ ටියුබ් නිමැවුම සියයට 4.1 කට වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටීම මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. මූලික වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපය වැනි ප්‍රධාන අපනයන වෙළඳපොළ වෙතින් පැවැති ඉල්ලුම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස අපනයන අඩු වීම මෙම අංශයේ නිෂ්පාදනය අඩු වීමට හේතු විය. මේ අතරම, බොර තෙල් මිල ගණන් අඩු වීම හේතුවෙන් කෘත්‍රිම රබර් මිල පහත වැටීමක් අපේක්ෂා කරන අතර, එය රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිමැවුමට අහිතකර බලපෑමක් ඇති කිරීමට මූලික වෙමින්, ස්වභාවික රබර් සඳහා ඉල්ලුමට තවදුරටත් අහිතකර ලෙස බලපානු ඇත. දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ඉල්ලුම ඉහළ යෑමෙන් සහ ස්වභාවික රබර් මිල ගණන් පහත වැටීම තුළින් ප්‍රතිලාභ ලද ප්ලාස්ටික් නිෂ්පාදිත සහ අත්වැසුම් වැනි වෙනත් රබර් නිෂ්පාදිත මනා ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින් පිළිවෙළින් සියයට 30.3 ක සහ 3.9 ක වර්ධනයන් වාර්තා කරන ලදී. විදේශ වෙළඳපොළ අවස්ථා රැසක් හිමි රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශයට තවදුරටත් වර්ධනය වීමේ හැකියාවක් ඇත. ශ්‍රී ලාංකීය ටයර් නිෂ්පාදකයින් ගෝලීය ඝන ටයර් ඉල්ලුමෙන් විශාල ප්‍රමාණයක් සපයන අතර, එම නිමැවුම් සඳහා ලොව විශිෂ්ටතම නිමැවුම් ලෙස පිළිගැනීමක් ද හිමිකරගෙන ඇත. වෛද්‍ය, කාර්මික සහ ගෘහස්ථ භාවිතය සඳහා වන අත්වැසුම්, ටියුබ්, රථවාහන හා ගුවන්යානා සඳහා භාවිතා කරන ටයර්

ඇතුළු පුළුල් පරාසයක අගය එකතු කළ නිෂ්පාදිතයන් ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදිත අතර වේ. කෙසේ වෙතත්, මෙම නිමැවුම් කාණ්ඩය 2015 වසරේ රටේ සමස්ත වෙළඳ අපනයනයන්ගෙන් සියයට 8 කට පමණක් දායක වී ඇත. එබැවින්, අගයෙන් ඉහළ නිෂ්පාදන සඳහා උපාංග නිෂ්පාදකයෙකු ලෙස ගෝලීය අගය දාමයට අනුගත වීමේ හැකියාව සමඟ ජාත්‍යන්තර මෙන්ම දේශීය වෙළඳපොළෙහි ද සැලකිය යුතු විභවතාවක් සහිත මෙම අංශය වෙත විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම පිණිස වැඩි අවධානයක් යොමු කළ යුතුය.

**රෙදිපිළි උප අංශය 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 1.4 ක අඩු වර්ධනයක් වාර්තා කරමින් මන්දගාමී විය.** ආනයනික රෙදිපිළි සහ රෙදිපිළි උපාංග සාපේක්ෂව අඩු මිලට ලබාගත හැකි වීම, දේශීය රෙදිපිළි නිෂ්පාදන උප අංශය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. එබැවින්, වෙළඳපොළ තරගයට මුහුණ දීම සඳහා මිල හෝ ගුණාත්මක බව අතින් තරගකාරී වාසියක් අත්පත් කර ගැනීමේ උපක්‍රම දේශීය නිෂ්පාදකයින් විසින් විමසා බැලිය යුතුය. මෙහිදී, රටේ පැරණිතම කර්මාන්තයන්ගෙන් එකක් වන දේශීය අත්යන්ත්‍ර නිෂ්පාදන අංශය දියුණු කිරීම සඳහා වන හැකියාව විපරම් කර බැලිය යුතුය. පරිසර හිතකාමී අත්කම් නිෂ්පාදන සඳහා වූ ඉහළ යන ඉල්ලුම හමුවේ මෙම අංශයට ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ අවස්ථාවක් ඇත.

**සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදිත උප අංශය 2015 වසරේදී ද මන්දගාමී ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය.** මෙම උප අංශය 2014 වසරේ දී වාර්තා කළ සියයට 1.4 ක අඩු වීමට සාපේක්ෂව 2015 වසරේ දී තවදුරටත් සියයට 10.9 ක අඩු වීමක් වාර්තා කළේය. පාවහන් නිෂ්පාදනයේ පහත වැටීම මෙම මන්දගාමී ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. සම් නිෂ්පාදන සඳහා ඉල්ලුම අඩු වීම සහ මිලෙන් අඩු ආනයනික කෘත්‍රිම නිෂ්පාදිත වෙතින් එල්ල වන තරගකාරිත්වය දේශීය පාවහන් නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ප්‍රධාන සාධක වේ.

### කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**රජය සිය අපනයන මූලික කරගත් ආර්ථික ප්‍රතිපත්ති සමඟ කාර්මික අංශය සමපාත කිරීමේ ප්‍රයත්නයන් මගින් කාර්මික අංශයේ සංවර්ධනය සඳහා අඛණ්ඩව පහසුකම් සලසන ලදී.** ඒ අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කාර්මික සංවර්ධන වැඩසටහන වසර තුළ දී තවදුරටත් පුළුල් කරන ලදී. ඉඩම් සංවර්ධන කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් අවසන් කර ඇති ත්‍රිකුණාමලය කාර්මික ජනපදයේ දෙවන අදියරේ සංවර්ධන කටයුතු 2015 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම කාර්මික ජනපදය වැඩිදුරටත් ව්‍යාප්ත කිරීමක් වශයෙන් යාබදව ඇති අක්කර 50 ක ප්‍රදේශයක තුන්වන අදියර ඇරඹීමට නියමිතව ඇත. මේ අතර, මඩකලපුව දිස්ත්‍රික්කයේ අක්කර 24 ක රජයේ ඉඩමක තිරයිමඩු කාර්මික ජනපදය පිහිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයන ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ නවගම්පුර කාර්මික ජනපදයේ යටිතල පහසුකම් ලබාදීම ඇතුළුව සංවර්ධන කටයුතු වසර තුළ දී අවසන් කරන ලද අතර, මේ වන විට මෙම කාර්මික ජනපදය තුළ කර්මාන්තශාලා 7 ක් ක්‍රියාත්මක වේ. උතුරු පළාතේ කර්මාන්ත ප්‍රචලිත කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ඇඟලුම් සහ ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා පහසුකම් සලසමින්, මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයේ කාර්මික ජනපදයක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, මෙම පළාතේ රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා මෙය උපකාරී වනු ඇත. මෙම ප්‍රදේශයේ කාර්මික නිෂ්පාදනය වැඩිදියුණු කිරීම තවදුරටත් දිරිමත් කරනු පිණිස මෙම ජනපදයේ කර්මාන්තශාලා ගොඩනැගිලි 3 ක් ඉදිකිරීමට ද අමාත්‍යාංශය තීරණය කර ඇති අතර, මෙම ඉදිකිරීම්වලට අදාළ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

**වසර තුළ දී, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ සංවර්ධන කටයුතු දිරිමත් කිරීම සඳහා මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ වෙත කාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ද අවශ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදී.** කාර්මික සංවර්ධන මණ්ඩලය, ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා පුහුණු සහ තාක්ෂණික හුවමාරු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. මෙම වැඩසටහන්වලින් බොහොමයක් ආහාර හා පානවර්ග සහ රසායන ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදිත අංශයේ කර්මාන්ත සඳහා විය. ආර්ථික සංවර්ධනය සඳහා කැපී පෙනෙන ලෙසින් දායක වන ගෝලීය වශයෙන් තරගකාරී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රචාරණය කිරීමේ අරමුණ පෙරදැරිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකසා ඇති අතර, දිස්ත්‍රික්ක 20 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක් ද මීට ඇතුළත්ය. මේ අතර, වෙළඳ නියෝජනයන්, පුහුණු වැඩසටහන් සහ වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳපොළේ දේශීය කාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය පහසුකම් සලසන ලදී. ශ්‍රී ලාංකීය පාවහන් සහ සම් නිෂ්පාදිතවල ප්‍රතිරූපය ජාත්‍යන්තර වශයෙන් ශක්තිමත් කිරීම පිණිස පාවහන්

සහ සම් භාණ්ඩ ප්‍රදර්ශනය 2015 වසරේ දී ද පවත්වන ලදී. ඇඟලුම් අංශයට අනතුරුව ඉහළ විභවයක් ඇති බලාපොරොත්තු තැබිය හැකි අපනයන අංශයක් ලෙස පාවහන් අංශය දැක්විය හැක. දේශීය මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සහ ශ්‍රී ලංකාව ලෝකයේ නිල් මැණික් සඳහා වන කේන්ද්‍රස්ථානය බවට පත්කිරීමේ අරමුණින් ජාත්‍යන්තර වර්ණ මැණික් සංගමයේ (International Colored Gemstone Association) 16 වන සම්මේලනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සම-සංවිධායකත්වය දරන ලදී. ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා බෝට්ටු නිෂ්පාදනය පිළිබඳව ශ්‍රී ලංකාවේ හැකියාව ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීමත්, ඇඟලුම් සඳහා නව ජාත්‍යන්තර වෙළඳපොළ පිළිබඳ අධ්‍යයනය කිරීම සහ ‘ශ්‍රී ලාංකික කුරුඳු’ නාමය ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීමට උපකාර කිරීමත්, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් වසර තුළ දී සිදු කරන ලද අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් අතුරින් කිහිපයකි. ඊට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය 2015 වසරේ දී, ජාත්‍යන්තර වෙළඳ සල්පිල් 22 කට වැඩි ප්‍රමාණයකට සහභාගී වීමට පහසුකම් සලසන ලද අතර, දේශීය වශයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 29 ක් පමණ සංවිධානය කරන ලදී. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, 2015 වසරේ දී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී. මැණික් හඳුනා ගැනීම සහ ප්‍රමිති සහතික කිරීම මෙන්ම තත්ත්ව පරීක්ෂාවට ලක් කිරීම සඳහා ද විද්‍යාගාරයක් ගාල්ලේ පිහිටුවනු ලබන අතර, එමගින් ස්වර්ණාභරණ ශිල්පීන්ට සිය ස්වර්ණාභරණ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නියමයන්ට අනුකූලව නිෂ්පාදනය කිරීමට මගපෙන්වීම මෙන්ම උපකාරී වීම සිදු කෙරේ. ඊට අමතරව, කර්මාන්තයේ යෙදී සිටින තාක්ෂණික ශිල්පීන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා පුහුණු සහ වෙනත් කුසලතා වර්ධන ශිල්ප ක්‍රම සැලසීම ද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් සිදු කරන ලදී.

**විද්‍යා, තාක්ෂණ සහ නව නිපැයුම් සඳහා වන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා විවිධ ක්ෂේත්‍රවල තාක්ෂණික උපදේශන සේවා සැපයීම මගින් විද්‍යා, තාක්ෂණ සහ නව නිපැයුම් පදනම් කරගත් ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා පහසුකම් සලසන ලදී.** විද්‍යා, තාක්ෂණය සහ නවෝත්පාදන සම්බන්ධව රටේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු සපයන “ශ්‍රී ලංකා නවෝත්පාදන ප්‍රගති පුවරුව” මේ වසර තුළ දී දියත් කරන ලදී. ප්‍රගති පුවරුවෙහි ප්‍රධාන අරමුණ විද්‍යුත් මාධ්‍ය මගින් අදාළ තොරතුරු සපයමින් ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්‍රියාකාරකම්වලට ආධාර කිරීම වේ. තවදුරටත්, ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා විද්‍යා, තාක්ෂණික සහ නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීම පිණිස නවෝත්පාදක වේගවත් කිරීමේ පසුතලයක් ඇති කිරීම (Innovation Accelerator), විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය තුළ ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ ශ්‍රී ලංකා නවෝත්පාදනකරුවන්ගේ කොමිසම හරහා තාක්ෂණ හා මූල්‍ය සහාය සපයමින් ජාත්‍යන්තර පේටන්ට් අයිතීන් හිමිකර ගැනීමට සහාය වීම, යනාදී වශයෙන් යෝජනා රැසක් 2016 අයවැය තුළින් ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, බස්නාහිර පළාත් මහ නගර සැලැස්ම යටතේ විද්‍යා හා තාක්ෂණ නගරයක් පිහිටුවීම සඳහා වන යෝජනාව, ආර්ථිකය, දැනුම පාදක කරගත් නවෝත්පාදන කෙරෙහි යොමු වූ ආර්ථිකයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක පරිවර්තනය සිදු කිරීමට උපකාරී වන ප්‍රධාන උපායමාර්ගයක් වේ. අපනයන මූලික කරගත් මහා පරිමාණ අධි-තාක්ෂණික නිෂ්පාදන සහ වාණිජ සේවා අංශයන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සැලසුම් එමගින් සකස් කරනු ඇත. තවදුරටත්, නම්‍ය වූ අරමුදල් ක්‍රම, යටිතල පහසුකම්, දැනුම උත්පාදනය සහ හුවමාරුවට සහාය වීම, පර්යේෂණ විද්‍යාඥයින්ගේ කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම සහ පර්යේෂණ සහ සංවර්ධනයට පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ දැමීම මගින් ජාතික විද්‍යා පදනම, දේශීය පර්යේෂණකරුවන් දිරිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත.

**ද්විපාර්ශ්වීය වෙළඳ සැසි හා ආයෝජන සංසද සංවිධානය කිරීම, වාණිජ පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රාදේශීය සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම මගින් වාණිජ හා කර්මාන්ත මණ්ඩල, කර්මාන්ත අංශයේ සංවර්ධනයට අඛණ්ඩව දායක විය.** මේ අනුව, ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණික සංවර්ධනයන් ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය “Pro Food/Pro Pack & AG-Biz 2015”, ආහාර පාන සහ ඇසුරුම් ප්‍රදර්ශනය සංවිධානය කළේය. ප්‍රාදේශීය වශයෙන් යහපත් සහභාගිත්වයක් පෙන් වූ මෙම ප්‍රදර්ශනයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ක්ෂුද්‍ර ආයතන විශාල ප්‍රමාණයකට ඔවුන්ගේ නිෂ්පාදිතයන් ප්‍රදර්ශනය කිරීමට සහාය ලබා දෙන ලදී. ඊට අමතරව, ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය, මෙම ආයතන සඳහා “ආහාර සුරක්ෂිතතාව සහ සනීපාරක්ෂාව” මත පාදක වූ පුහුණු වැඩසටහන් සහ දැනුම බෙදාගැනීමේ සැසි පවත්වන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර හා ඖෂධ පරිපාලන මණ්ඩලයට පුළුල් ලෙස සමගාමීව

ආහාර සහ පාන වර්ග සම්බන්ධ සියලු කටයුතු හැසිරවීම කේන්ද්‍රගත කිරීමට "ජාතික ආහාර අධිකාරියක්" පිහිටුවීමට ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය යෝජනා කර ඇත.

**වසර තුළ දී පෞද්ගලික අංශයේ කර්මාන්ත කාණ්ඩ විශාල ප්‍රමාණයක් සඳහා ණය ලබාදීමේ ප්‍රසාරණයක් දක්නට ලැබුණි.** 2015 වසරේ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබාදුන් ණයවලින් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් කාර්මික අංශයේ ණයවලින් සමන්විත විය. තවද, කාර්මික අංශයට ලබාදුන් ණය ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව සියයට 25 කින් පමණ ඉහළ යන ලදී. මුළු ණය ප්‍රමාණයෙන් සියයට 18.6 ක් පමණ ඉදිකිරීම් අංශයට ද සියයට 3.8 ක් රෙදිපිළි හා ඇඟලුම් අංශයට ද ලබා දෙන ලදී. නමුත්, රෙදිපිළි හා ඇඟලුම් අංශයට ලබාදුන් ණය සියයට 12.6 කින් පහළ ගිය අතර, අනෙකුත් අංශයන්ට ලබාදුන් ණයවල ඉහළ යෑමක් දක්නට ලැබුණි. ණය ලබාදුන් අනෙකුත් ප්‍රධාන අංශ වනුයේ සකස් කළ ලෝහ නිපැයුම්, යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණ (සියයට 3.6) සහ ආහාර හා පාන (සියයට 2.5) අංශයන්ය. තවද, රජය වාණිජ බැංකු මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ණය ලබාදීම දිරිගැන්වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහාම වෙන් වූ ඒකක හෝ මධ්‍යස්ථාන පවත්වා ගැනීමට උපදෙස් දීම, කාර්යක්ෂම සේවාවක් සඳහා අවම කඩදාසි භාවිතයේ අවශ්‍යතාවය ආදී වූ පොදු ක්‍රියාමාර්ග ගනු ලැබීය.

**කාර්මික අංශය අපේක්ෂිත දිශාව කරා යොමු කිරීම සඳහා සහාය වීමේ වැදගත්කම හඳුනා ගනිමින් 2016 අයවැය මගින් යෝජනා ගණනාවක් ප්‍රකාශයට පත් කරන ලදී.** පලතුරු හා එළවළු කර්මාන්තය වාණිජමය මට්ටමින් දියුණු කිරීම අරමුණු කර ගනිමින් පලතුරු විජලනය කොට ටින් කිරීමේ කර්මාන්තය සඳහා බැංකුවලින් ලබා දෙන ණය සඳහා අයකරන පොලියෙන් සියයට 50 ක් සඳහා සහනයක් ලබාදීමට යෝජනා කර ඇත. තවද, මෙම කර්මාන්තය සඳහා භාවිතා කරන්නා වූ යන්ත්‍රෝපකරණ, ආනයන තීරුබදුවලින් නිදහස් කරන ලදී. දේශීය රසකැවිලි නිෂ්පාදන කර්මාන්තය දිරිගැන්වීම සඳහා එළවළු මේද සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කිරීමට යෝජනා කරන ලදී. දේශීය වශයෙන් ටින් මාළු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ලක් සතොස සමාගම හරහා මිලදී ගැනීමේ යාන්ත්‍රණයක් නිර්දේශ කරන ලදී. දේශීය ඖෂධ කර්මාන්තය නැංවීම අරමුණු කර ගනිමින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව හරහා පෞද්ගලික අංශයට ඖෂධ නිෂ්පාදන කලාප පිහිටුවීම දිරිගැන්වීම සඳහා නිෂ්පාදිත ඖෂධ රජයේ අවශ්‍යතාවය පරිදි මිලදී ගැනීම සඳහා ගිවිසුම්වලට එළඹීම යෝජනා විය. ගොඩනැගිලි වහලවල් සඳහා පරිසර හිතකාමී ද්‍රව්‍යයන් සපයා දීම ඉලක්ක කරමින් ශ්‍රී ලංකාව 2018 වනවිට ඇස්බැස්ටස් භාවිතයෙන් තොර රටක් කිරීම සඳහා උළු නිෂ්පාදනය දිරිගැන්වීම පිණිස, එම කර්මාන්තයට වසර 3 ක කාලයක් සඳහා බදු විරාමයක් ලබා දීමට යෝජනා කර ඇත. ආර්ථික වශයෙන් සක්‍රීය අංශ විශේෂයෙන්ම ඉහළ අපනයන හැකියාවක් ඇති හා ව්‍යාපාරික කටයුතු බාහිර පාර්ශ්වයන්ට පැවරීමේ සංකල්පය (BPO), තොරතුරු තාක්ෂණය වැනි නැගී එන අංශ සඳහා ණය ගලා යෑම වැඩි කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. මේ සමඟම, ජාත්‍යන්තර අගය දාමයට ඇතුළත් වීමේ ඉහළ හැකියාවක් පෙන්වන කර්මාන්ත හෝ ආනයන ආදේශක ලෙස ආර්ථික ලාබ ලබාදෙන කර්මාන්ත ශක්තිමත් කළ යුතුය. එනිසා, බැංකුවල ණය කළඹ වැඩි වශයෙන් පරිභෝජනයට වඩා ආයෝජන දිශානති වූ ණය දෙසට යොමු කිරීමට ධෛර්යයමත් කරනු ලැබේ.

**ප්‍රදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා වව්නියාවේ නව ආර්ථික කලාපයක් ද, හම්බන්තොට, රයිගම, මහඔය හා ත්‍රිකුණාමලයේ කාර්මික සංවර්ධන කලාප සමඟ මහනුවර තොරතුරු තාක්ෂණ සහ කෘෂිකාර්මික කලාප පිහිටුවීමට 2016 අයවැයෙන් යෝජනා විය.** තවද, නැව් සෑදීමේ හා නැව් කොටස් කිරීමේ කර්මාන්තය සහ නැව් අලුත්වැඩියා කිරීමේ කටයුතු ධෛර්යයමත් කිරීම සඳහා හම්බන්තොට හා ත්‍රිකුණාමලය වරාය තුළ රජයේ ඉඩම් ලබාදීමට යෝජනා විය. මීට අමතරව, පවත්නා කාර්මික ජනපදවල පහසුකම් ඉහළ නැංවීමටද, බස්නාහිර පළාත් මහ නගර සැලසුමට අනුව මීරිගම හා හොරණ කාර්මික නගර ලෙස දියුණු කිරීමට ද නියමිතය. මීරිගම කාර්මික නගරය ප්‍රධාන වශයෙන් අපනයන අභිමුඛ ආහාර සකස් කිරීමේ විශේෂිත කලාපයක් ලෙස ද හොරණ කාර්මික නගරය ආනයන ආදේශන හා අපනයන සංවර්ධනය සඳහා දායක වන කලාපයේ විසිර පවත්නා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් එක්තැන් කිරීමේ නගරයක් ලෙස ද සංවර්ධනය කිරීමට යෝජිතය.

**රටේ ඉදිකිරීම් අංශය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම විදේශීය සමාගමක්ම දේශීය කොන්ත්‍රාත්කරුවකු සමඟ බද්ධ ව්‍යාපාරයකට එළඹිය යුතු බවට 2016 අයවැයෙන් යෝජනා විය.** මීට අමතරව, ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ඉවත් කිරීම, ගෙවීම සහතික ආරක්ෂක පනතක් හඳුන්වා දීම සහ ආනයනය කරනු ලබන ගැඹුරු මුහුදේ ඇති වැලි පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර, දොඹකර හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර සඳහා බදු සහන ලබාදීම තුළින් ගොඩනැගිලි ද්‍රව්‍ය අඩු මිලකට පවත්වා ගැනීම, යනාදී වශයෙන් දේශීය ඉදිකිරීම් අංශය ධෛර්යයමත් කිරීමේ සහන රැසක් ද යෝජනා විය.

**රජයේ සාර්ව සහභාගීත්ව ආර්ථික වර්ධන උපායමාර්ගයට අනුව ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මධ්‍යකාලීනව පුළුල්වීම දිරිගැන්වීම සඳහා යෝජනා කිහිපයක් ද ඇතුළත් වේ.** මෙම අංශයේ අරමුදල් පිළිබඳ ගැටලු අවම කිරීම සඳහා ව්‍යපාර ප්‍රාග්ධන ප්‍රවේශයක් තුළින් ස්කන්ධ ප්‍රාග්ධනය සැපයීම සඳහා "අරමුදල්වල අරමුදලක්" ලෙස අරමුදලක් ස්ථාපනය කිරීමට යෝජිතය. මෙම අරමුදල බැංකු, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල වැනි රාජ්‍ය අරමුදල් හා විදේශ අරමුදල් යනාදියෙන් සමන්විත වනු ඇත. මෙම ආයතන සඳහා අදාළ වන සාංගමික ආදායම් බදු වසර 5 ක කාලයක් සඳහා සියයට 50 කින් අඩු කිරීමට යෝජනා විය. තවද, ඉන්කියුබේටර් ලෙස කටයුතු කරන සුළු කාර්මික උද්‍යාන මොණරාගල, පුත්තලම, යාපනය, වන්නි සහ අම්පාර වැනි ප්‍රදේශවල ඉදිකිරීමට යෝජිතය. මෙහිදී ද, ලාභ උපයන වසරේ සිට වසර තුනක කාලයක් සඳහා අදාළ බදු අනුපාතය සියයට 50 කින් අඩු කිරීමට යෝජනා කරන ලදී.

### විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

**විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ ක්‍රියාකාරකම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 7.8 කින් වර්ධනය වී ඇත.** මෙම ප්‍රගතිය 2014 වසරේ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කළ විදුලි උත්පාදන කටයුතු 2015 වසරේ දී සියයට 6.0 කින් වර්ධනය වීම තුළින් ද පිළිබිඹු විය. 2014 වසරේ දී සියයට 39.4 කින් පහත වැටුණු ජල විදුලි බල උත්පාදනය, හිතකර වූ කාලගුණික තත්ත්වයක් පැවැතීම හේතුවෙන් මෙම වසරේ දී සියයට 35.1 කින් වර්ධනය වී ඇත. තවද, ගල් අඟුරු මගින් විදුලි උත්පාදනය 2014 වසරේ දී වාර්තා කළ සියයට 117.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 38.8 කින් වර්ධනය වූ අතර, 2014 වසරේ දී සියයට 32.1 කින් වර්ධනය වූ ඉන්ධන තෙල් මගින් විදුලි උත්පාදනය 2015 වසර තුළ දී සියයට 47.1 කින් පහත වැටිණි. මෙහිදී ඉන්ධන තෙල් මගින් විදුලි උත්පාදන කටයුතු පහත වැටීම සඳහා ජලය හා ගල් අඟුරු මගින් විදුලිය උත්පාදනය කිරීම ඉහළ යෑම හේතු විය. මේ අතර, ජලය පිරිසිදු කිරීමේ සහ බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල දළ එකතු කළ වටිනාකම 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.3 කින් වර්ධනය විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් බෙදා හරින ලද ජල පරිමාව 2014 වසරේ දී වාර්තා කරන ලද සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 5.8 ක වර්ධනයක් වාර්තා කර ඇත. එසේම, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 11.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 24.8 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

### ඉදිකිරීම්

**2014 වසරේ දී සියයට 6.6 ක වර්ධනයක් වාර්තා කරන ලද කර්මාන්ත ක්‍රියාකාරකම්වල දෙවන විශාලතම කාණ්ඩය වන ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් 2015 වසරේ දී සියයට 0.9 කින් පහත වැටී ඇත.** 2015 වසර තුළ දී ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සාපේක්ෂ පහත වැටීම සඳහා මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මන්දගාමී වීම හේතු වී ඇත. කෙසේ වුවද, 2014 වසරේ දී වර්ධනයක් නොපෙන්වන ලද සිමෙන්තිවල සුලභතාව 2015 වසරේ දී සියයට 5.8 ක වර්ධනයක් වාර්තා කළ අතර, මේ සඳහා සිමෙන්ති ආනයනය සුළු වශයෙන් පහත වැටීම හමුවේ වුවද දේශීය සිමෙන්ති නිෂ්පාදනයේ සිදු වූ සැලකිය යුතු වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2014 වසරේ දී සියයට 0.6 ක පහත වැටීමක් වාර්තා කළ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පරිමා දර්ශකය මෙම වසර තුළ දී සියයට 9.7 ක වර්ධනයක් වාර්තා කර ඇත. එසේම, ඉදිකිරීම් කටයුතු සඳහා පෞද්ගලික අංශයේ දායකත්වයේ වර්ධනය පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් ඉදිකිරීම් කටයුතු සඳහා පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය 2014 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී වාර්තා කළ සියයට 22.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට සියයට 36.1 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහිදී පුද්ගලික නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් ලබා දෙන ලද ණය වසර තුළ දී සියයට 35.3 කින් වර්ධනය වී ඇත.

### සේවා

**ආර්ථික වර්ධනය සඳහා ප්‍රමුඛතම දායකත්වය ලබා දෙන සේවා ක්‍රියාකාරකම්වල දළ එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 56.6 කට දායකත්වය සපයමින් සියයට 5.3 කින් වර්ධනය විය.** මේ සඳහා මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල සිදු වූ ඉහළ වර්ධනය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීමේ ක්‍රියාකාරකම්, නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් සහ තොග හා සිල්ලර වෙළඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය ද බෙහෙවින් ඉවහල් විය. තවද, රාජ්‍ය පරිපාලනය, වෙනත් පෞද්ගලික සේවාවන්, රක්ෂණය, සෞඛ්‍ය සේවාවන්, විදුලි සංදේශ සේවාවන්

සහ තොරතුරු තාක්ෂණ සේවාවන් ද සේවා අංශයේ වර්ධනයට දායකත්වය දක්වන ලදී. කෙසේ වුවද, 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළ දී වෘත්තීයමය සේවාවන්, අධ්‍යාපනය, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන් හා තැපැල් හා කුරියර් සේවාවන්හි දක්නට ලැබුණු පහත වැටීම සේවා ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනය සඳහා අයහපත් ලෙස බලපාන ලදී.

### තොග සහ සිල්ලර වෙළඳාම

**තොග සහ සිල්ලර වෙළඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** වෙළඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ඉහළ යෑම පෙන්නුම් කරමින් ආනයන පරිමා දර්ශකය 2014 වසර තුළ දී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 10.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහිදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය 2014 වසරේ දී වාර්තා කළ සියයට 20.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 24.1 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා වාහන ආනයනයේ ඉහළ වර්ධනය බෙහෙවින් බලපා ඇත. තවද, ආයෝජන භාණ්ඩ ආනයන පරිමා දර්ශකය ද 2014 වසරේ දී වාර්තා කළ සියයට 0.3 ක සුළු වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 13.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහිදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ඇතුළුව ආනයන පරිමා දර්ශකයෙහි උප දර්ශක සියල්ලකම සැලකිය යුතු වර්ධනයන් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, අන්තර් භාණ්ඩ ආනයන පරිමා දර්ශකය, 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී පසුබෑස්මක් වාර්තා කළ අතර, ඒ සඳහා ඛනිජ තෙල් ආනයනයේ සිදු වූ පහත වැටීම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. මේ අතර, අපනයන පරිමා දර්ශකය 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.6 කින් වර්ධනය විය. මෙහිදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන කාණ්ඩයේ සුළු පහත වැටීම හමුවේ වුවද, සමස්ත අපනයන සඳහා විශාලතම දායකත්වය සපයන කාර්මික භාණ්ඩ අපනයන පරිමාව සියයට 8.4 කින් වර්ධනය විය. එසේ වුවද, මෙම වසර තුළ දී තේ, රබර් සහ මුහුදු ආහාර අපනයනයේ වාර්තා වූ පහත වැටීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 7.4 ක පහත වැටීමක් වාර්තා කරන ලදී. මේ අතර, වසර තුළ දී කෘෂිකාර්මික නිෂ්පාදන හා නිෂ්පාදන කර්මාන්තයන්හි නිමැවුම වර්ධනය වීම දේශීය වෙළඳ කටයුතු කෙරෙහි හිතකර ලෙස දායක විය.

### ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

**මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීමේ ක්‍රියාකාරකම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** පෞද්ගලික බස් සේවාවන් සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් මෙහෙයවන ලද සමස්ත මගී කිලෝමීටර් ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා කළ පිළිවෙළින් සියයට 12.7 ක හා සියයට 2.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී පිළිවෙළින් සියයට 6.1 ක සහ සියයට 19.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී සියයට 8.3 කින් වර්ධනය වී ඇත. මේ අතර, 2014 වසරේ දී සියයට 2.7 කින් පහත වැටුණු ශ්‍රී ලංකන් සහ මිහින් ලංකා යන ගුවන් සේවා මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී සියයට 0.1 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. තවද, ශ්‍රී ලංකා වරායයන් මගින් හසුරුවන ලද බහාලුම් ප්‍රමාණය (අඩි විස්සට සමාන බහාලුම් ඒකකවලින්) සහ ටොන් නෞභාරය 2014 වසර තුළ දී වාර්තා කරන ලද පිළිවෙළින් සියයට 14.0 ක හා සියයට 12.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී පිළිවෙළින් සියයට 5.7 ක හා සියයට 4.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය 2015 වසර තුළ සියයට 2.3 කින් පහත වැටී ඇත. ශ්‍රී ලංකන් සහ මිහින් ලංකා ගුවන් සේවා මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය ද මෙම වසර තුළ දී තවදුරටත් පහත වැටිණි. මේ අතරතුර දී, තැපැල් හා කුරියර් සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 7.1 ක පහත වැටීමට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.6 කින් පහත වැටී ඇත. මෙහිදී තැපැල් දෙපාර්තමේන්තුව මගින් දේශීයව බෙදාහරින ලද ලිපි ප්‍රමාණය මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, පාර්සල් බෙදාහැරීම ද පහත වැටිණි. කෙසේ වුවද, තැපැල් දෙපාර්තමේන්තුව සිදු කළ විදේශීය ලිපි බෙදාහැරීමේ කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි.

### නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන්

**නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.0 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 1.3 කින් පහත වැටිණි.** මෙම ඇස්තමේන්තුගත අගය මූලික වශයෙන් ඇස්තමේන්තු සකසන අවස්ථාවේ දී තිබූ එකතු කළ අගය මත වූ බඳු දත්ත මත පදනම්ව ඇත. කෙසේ වුවද,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත ශ්‍රේණිගත හෝටල්වල කාමර උපයෝජන අනුපාතය 2014 වසරේ පැවැති සියයට 74.3 ක මට්ටමට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 74.5 ක් දක්වා වර්ධනය වී ඇත. සංචාරකයන්ගේ පැමිණීම 2014 වසරේ දී වාර්තා කළ සියයට 19.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 17.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී. කලාප වශයෙන් සැලකීමේ දී සංචාරකයින් බහුතරයක් බටහිර යුරෝපයෙන් මෙරටට පැමිණ ඇත. සංචාරක පැමිණීම, වාසය කරන රට අනුව සැලකීමේ දී චීනයේ සිට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, එය ඉන්දියාවට පමණක් දෙවැනි වී ඇත. 2015 වසර තුළ දී සිදු වූ සංචාරක ක්‍රියාකාරකම්වල වර්ධනය පිළිබිඹු කරමින්, ජාතික උද්භිද උද්‍යාන, පින්නවල අලි අනාථාගාරය සහ දෙහිවල ජාතික සත්වෝද්‍යානය නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රමාණය වසර තුළ දී ඉහළ අනුපාතයකින් වර්ධනය වී ඇත. තවද, සංචාරක අංශයේ ඉපැයීම් වසර තුළ දී එ.ජ.ඩොලර් මිලියන 2,980.7 ක් දක්වා සියයට 22.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

### තොරතුරු සහ සන්නිවේදනය

**තොරතුරු සහ සන්නිවේදනය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම 2014 වසරේ වාර්තා කළ සියයට 11.6 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 12.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මේ සඳහා, මෙම කාණ්ඩයේ ප්‍රධානතම උප ක්‍රියාකාරකම වන විදුලි සංදේශ සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 13.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 10.1 කින් වර්ධනය වීම බෙහෙවින් දායක වී ඇත. විදුලි සංදේශ සේවාවන්හි සිදු වූ වර්ධනය පිළිබඳ සැලකීමේ දී රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතාවන්හි දක්නට ලැබුණු පහත වැටීම මධ්‍යයේ වුවද, ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් සිදු වී ඇත. තවද, දත්ත සන්නිවේදන සේවාවන් සඳහා වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් වසර තුළ දී ජංගම පුළුල් පරාස සේවා ද ඇතුළුව අන්තර්ජාල සබඳතා ප්‍රසාරණය වී ඇත. මේ අතරතුර දී, පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 21.1 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. එසේම, ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.5 කින් වර්ධනය වී ඇත.

### මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

**මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම තවදුරටත් ඉහළ යමින්, 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 12.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම අඛණ්ඩ වර්ධනය සඳහා, මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 10.4 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 15.8 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල දළ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා කළ පිළිවෙළින් සියයට 13.7 ක හා සියයට 16.0 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී පිළිවෙළින් සියයට 21.1 ක හා සියයට 30.6 කින් වර්ධනය විය. ඒ අතරම, බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු 2014 වසරේ දී වාර්තා කරන ලද පිළිවෙළින් සියයට 12.4 ක හා සියයට 22.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී පිළිවෙළින් සියයට 15.3 ක හා සියයට 16.1 කින් වර්ධනය විය. එසේම, ව්‍යාපාර කටයුතුවල සිදු වූ ප්‍රසාරණය පිළිබිඹු කරමින් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු හා ණයවල එකතුව 2014 වසරේ දී වාර්තා කළ සියයට 13.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 18.7 ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2015 වසර තුළ දී බැංකු ක්ෂේත්‍රයේ බදු ගෙවූ පසු ලාභය සියයට 10.3 කින් වර්ධනය වූ අතර, බැංකු නොවන මූල්‍ය ආයතනවල බදු ගෙවූ පසු ලාභය සියයට 2.3 කින් වර්ධනය විය. මේ අතර, 2014 වසරේ දී සියයට 6.5 ක වර්ධනයක් වාර්තා කළ නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය මත වටිනාකම 2015 වසරේ දී සියයට 9.6 ක වර්ධනයක් අත්කර ගන්නා ලදී. තවද, රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් කළමනාකරණය ද 2014 වසරේ දී වාර්තා කළ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 9.3 කින් වර්ධනය විය. රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සිදු වූ වර්ධනය පිළිබිඹු කරමින් රක්ෂණ ක්ෂේත්‍රයේ වාරික ආදායම් සහ හිමිකම් ගෙවීම්වල එකතුව 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 16.6 කින් වර්ධනය විය.

### වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්

**වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවාවල එකතු කළ අගය මත වටිනාකම, 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 1.3 කින් වර්ධනය විය.** මෙම


## විශේෂ සටහන 3 — ව්‍යාපාරික මතය පිළිබිඹු කරන ව්‍යාපාර වාතාවරණය පිළිබඳ සමීක්ෂණ

ව්‍යාපාරික අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සහ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය වැනි ව්‍යාපාර වාතාවරණය පිළිබඳ සමීක්ෂණ මගින් ප්‍රතිපත්ති සම්පාදකයන් හට යාවත්කාලීන තොරතුරු රැස්කර ගැනීමට හැක. මෙම තොරතුරු තුළින් වෙළඳපොළ නියෝජිතයන්ගේ මතය අවබෝධ කර ගැනීමටත් එමගින් ආර්ථිකයෙහි උපනති හඳුනාගැනීමටත් හැක. ආර්ථිකයක නිල සංඛ්‍යාත්මක දත්ත ප්‍රකාශයට පත්කරනුයේ යම් කිසි කාල පමාවක් සහිතවය. නමුත්, මෙබඳු සමීක්ෂණ ආශ්‍රිතව රැස්කරගන්නා දත්ත නිල සංඛ්‍යාත්මක දත්තවලට සාපේක්ෂව වඩාත් යාවත්කාලීන වන අතර, ඉදිරි උපනති නිරූපණය කරනු ලබයි. එබැවින් මෙම සමීක්ෂණ තුළින්, නවතම ආර්ථික ප්‍රවණතා අවබෝධ කර ගැනීමට ද අවදානම් තත්ත්ව කලින් හඳුනාගැනීමට ද හැකිවන බැවින්, පූර්වාරක්ෂක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත. මෙවැනි කාලීන තොරතුරු රැස්කර ගැනීමේ වැදගත්කම අවබෝධකර ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව, ගුණාත්මක දත්ත තුළින් රටෙහි ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රවණතා ග්‍රහණය කර ගැනීම සඳහා 2014 වසරේ මැද භාගයෙහි සිට ව්‍යාපාරික මතය පිළිබඳ සමීක්ෂණයක් සහ 2015 වසරේ මැයි මාසයේ සිට නිෂ්පාදන සහ සේවා අංශයන්ට අදාළව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයක් ද හඳුන්වා දෙන ලදී. නිෂ්පාදන සහ සේවා කර්මාන්තයන්හි ගැනුම් කළමනාකරුවන් ඉලක්ක කොටගෙන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය සිදු කරනු ලැබේ. මෙහිදී නිෂ්පාදන හා සේවා අංශයන්හි විචල්‍යයන් පහ බැගින් සලකා බලන අතර, පෙර මාසයට සාපේක්ෂව සලකා බලන මාසයෙහි වෙනස අගයමින් උප දර්ශක ගණනය කරනු ලබයි. ඒ අනුව, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි උප දර්ශක, නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇනවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සහ ගැනුම් තොගය යන විචල්‍යයන්හි උපනති ආවරණය කරනු ලබන අතර, සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි උප දර්ශක මගින් නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂාවන් යන විචල්‍යයන්හි උපනති ආවරණය කරනු ලැබේ. ප්‍රමාණවත් පරිදි දීර්ඝ දත්ත ශ්‍රේණියක් ගොඩනගා ගැනීමෙන් පසුව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල මහජනතාවගේ දැනුම්වත් වීම සඳහා ප්‍රකාශයට පත්කිරීමට නියමිතය. මෙම සටහන ප්‍රධාන වශයෙන් දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සවිස්තරාත්මකව විග්‍රහ කෙරේ.

### ව්‍යාපාරික අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

ව්‍යාපාරික අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, ආර්ථික ක්‍රියාකාරකම්වල වර්තමාන සහ අපේක්ෂිත තත්ත්වයන් පිළිබඳ ව්‍යාපාරික ප්‍රජාවගේ ආකල්පයන් නිරූපනය කරනු ලබන මෙන්ම තත්කාලීන ආර්ථික ප්‍රවණතාවයන් පිළිබිඹු කරනු ලබන තොරතුරු මූලාශ්‍රයක් ද වේ. විවිධ ආර්ථික ක්‍රියාකාරකම් තක්සේරු කිරීම සඳහා ප්‍රමාණාත්මක අගයන් වෙනුවට ගුණාත්මක තොරතුරු සමීක්ෂණයට සහභාගිවන්නන්ගෙන් විමසා සිටින බැවින්, මෙම සමීක්ෂණය ආර්ථිකයක ගුණාත්මක දත්ත නියෝජනය කරනු ලබයි. උදාහරණයක් ලෙස, විකුණුම්හි උපනතිය තක්සේරු කරන අවස්ථාවක දී තොරතුරු ලබාදෙන්නන්ගෙන් අනුරූප කාලපරිච්ඡේදයක් හා සැසඳීමේ දී විකුණුම්හි උපනතිය ඉහළ යෑමක්, වෙනස් නොවීමක් හෝ පහළ යෑමක් ලෙස තක්සේරු කරන ලෙස ගුණාත්මක තොරතුරු මෙබඳු සමීක්ෂණ තුළින් විමසා සිටිනු ලබයි. නමුත් සාම්ප්‍රදායික සමීක්ෂණයන්හි දී තොරතුරු ලබාදෙන්නන්ගේ කාලය වැය කරමින් විකුණුම් වටිනාකම පිළිබඳව ප්‍රමාණාත්මක අගයක් විමසනු ලැබේ.

**රූප සටහන වි.ස. 3.1 — ව්‍යාපාර තත්ත්වය පිළිබඳ දර්ශකයෙහි උපනති**




### ව්‍යාපාරික අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයක වැදගත්කම

නූතන විශ්ලේෂණාත්මක තාක්ෂණික ක්‍රම භාවිතයෙන් වුව ද, ආර්ථික ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණාත්මක දත්ත පමණක් යොදාගැනීමෙන් කාලපරිච්ඡේදයක් තුළ දී සිදුවන සියලුම ප්‍රවණතා ග්‍රහණය කර ගැනීමට අසමත් විය හැක. තවද, එවැනි සංඛ්‍යාත්මක

දත්ත ලබාගත හැක්කේ සැලකිය යුතු කාල පමාවකින් බැවින් ආර්ථිකයෙහි ඉදිරි ප්‍රවණතා දැනගැනීම ප්‍රමාද විය හැක. එබැවින් සංඛ්‍යාත්මක දත්ත මත පමණක් විශ්වාසය තැබීමෙන් ආර්ථිකයක එක් පැතිකඩක් පමණක් ග්‍රහණය කරගත් පටු දැක්මක් කරා යොමුවිය හැක. එවැනි දුර්වලතා මගහැරීම සඳහා ආර්ථික නියෝජිතයන් සමග ඍජුව අදහස් හුවමාරු කර ගැනීම මගින් ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන ප්‍රවණතා සහ ව්‍යාපාරිකයන්ගේ මතය ග්‍රහණය කර ගැනීම ව්‍යාපාරික මතය පිළිබඳ සමීක්ෂණ මගින් සිදු වේ. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සංඛ්‍යාත්මක දත්ත ලබාගැනීමට හැකි වන තුරු කෙටිකාලීන ප්‍රවණතා පුරෝකථනය සහ වර්තමාන ව්‍යාපාර තත්ත්වය ක්ෂණිකව ඇගයීම සඳහා, නවතම සමීක්ෂණ ශිල්පීය ක්‍රම බොහෝ දුරට භාවිතා කළහැකි රටවල ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ සුලභව සිදු කෙරේ. මෙම සමීක්ෂණ, ව්‍යාපාර චක්‍රයෙහි හැරවුම් ලක්ෂ්‍ය පුරෝකථනය කිරීමට සහ වර්තමාන ආර්ථික තත්ත්වය අධීක්ෂණය කිරීමට ප්‍රයෝජනවත් බව සනාථ කර ඇත. මෙම සමීක්ෂණයෙන් ලබාගන්නා තොරතුරු මගින් ආර්ථික තත්ත්වය පිළිබඳ ආර්ථික නියෝජිතයන්ගේ තක්සේරු සහ බලාපොරොත්තු පිළිබිඹු වන අතර, එමගින් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල වෙනස්වීම පිළිබඳ පූර්ව දැනුම්දීමක් සිදු කරයි. ආර්ථික අර්බුද වැනි විචල්‍යතා හමුවේ අස්ථාවර විය හැකි විද්‍යාත්මක ආකෘති මගින් මෙවැනි වෙනස්වීම් ග්‍රහණය කර ගැනීමට නොහැකි විය හැක.

### ජාත්‍යන්තර පිළිගැනීම සහ අත්දැකීම්

කොරියානු මහ බැංකුව, මෙක්සිකානු මහ බැංකුව, තායිලන්ත මහ බැංකුව, කැනේඩියානු මහ බැංකුව, රික්ස් බැංකුව, ඇමරිකා එක්සත් ජනපදයෙහි ෆෙඩරල් සංචිත බැංකු පද්ධතිය වැනි ලොව වටා ඇති බොහෝ මහ බැංකු ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ සිදුකරයි. තවද, ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD), ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ සම්බන්ධයෙන් පොදු ක්‍රමවේදයක් පිළිපැදීම දිරිගැන්වීම තුළින් අන්තර් ජාතික සංසන්දනය පහසු කිරීම සඳහා අත්පොතක් ප්‍රකාශනය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වාගෙන යන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය ද මෙම අත්පොතෙහි යෝජිත ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදය අනුගමනය කොට ඇත.

ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පදනම් කොටගෙන සම්පාදනය කරනු ලබන දර්ශක කාල ශ්‍රේණි සහ ආර්ථික දත්ත අතර සහසම්බන්ධතාවයක් පවතින බව අන්තර්ජාතික අත්දැකීම් තුළින් පිළිබිඹු වේ. උදාහරණයක් ලෙස, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් මනිනු ලබන අනාගත විකුණුම් අපේක්ෂාවන් පිළිබඳ දර්ශකය සාමාන්‍යයෙන් ආර්ථික පසුබෑමකට පෙර පහළ යෑමක් පෙන්නුම් කරන අතර ආර්ථිකය නැවත යථා තත්ත්වයකට පත්වීමකට පෙර ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, ආර්ථික පසුබෑමකට පෙර ඇති වන ආයෝජක අපේක්ෂා පහළ යෑම පිළිබිඹු කරමින්, සාමාන්‍යයෙන් භාණ්ඩ තොග අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යෑමක් මෙම සමීක්ෂණය ආශ්‍රිතව රැස්කරගන්නා දත්ත මගින් ද පෙන්නුම් කරයි.

### ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ක්‍රමවේදය

කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන ආර්ථිකයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ඒකක ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වාගෙන යන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ඉලක්කගත සංගහණය වේ. දළ දේශීය නිෂ්පාදිතයට (ද.දේ.නි.) දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් විනිශ්චයාත්මක නියැදිකරණය මගින් සමීක්ෂණයේ නියැදිය තෝරාගන්නා ලදී. මෙහි දී සම්මත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් තොරතුරු ලබාදෙන්නන්ගේ අභිරුචිය පරිදි සම්මුඛ සාකච්ඡා, දුරකථන සංවාද හෝ විද්‍යුත් තැපැල මගින් දත්ත රැස්කරනු ලැබේ. මෙම සමීක්ෂණය, එක් එක් කාර්තුවේ අවසන් සතිය තුළ දී හා ඊළඟ කාර්තුවේ පළමු සතිය තුළ දී කාර්තුමය පදනමකින් පවත්වනු ලැබේ. සමීක්ෂණයෙහි ප්‍රතිඵල, ව්‍යාපාර තත්ත්වය, ලාභදායිත්වය, පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය, විකුණුම්, ධාරිතා උපයෝජනය සහ ඉල්ලුම යන ව්‍යාපාර මතය පිළිබඳ දර්ශක ගණනය කිරීමෙන් සාරාංශ ගත කරයි. ධනාත්මක ප්‍රතිචාරයක් සඳහා +1 ද නොවෙනස් ප්‍රතිචාරයක් සඳහා 0 ද ඍණාත්මක ප්‍රතිචාරයක් සඳහා -1 ද ආරෝපණය කිරීමෙන් මෙම දර්ශක ගණනය කරනු ලබයි. මෙම සංඛ්‍යාරූපිත අගයන්හි සාමාන්‍යය ගණනය කොට එම අගයන් සියයට අනුරූප කිරීමෙන් එක් එක් අංශය සඳහා දර්ශකයක් ගණනය කරනු ලබයි. පසුව ද.දේ.නි. ට දක්වන ආංශික දායකත්ව පදනම් කරගෙන අදාළ ආංශික දර්ශකය බර තැබීම මගින් සංයුක්ත දර්ශකයක් ගණනය කරනු ලබයි. ගණනය කරන ලද දර්ශකයන් 0 සිට 200 දක්වා ව්‍යාප්ත විය හැක. එම දර්ශකය සියයට සමාන නම් සලකා බලන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ව්‍යාපාරික මතය නොවෙනස් වී ඇති බවද, එම අගය සියයට වඩා විශාල නම් අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව ව්‍යාපාරික මතය යහපත් වී ඇති බවද, එය සියයට වඩා කුඩා අගයක් නම් අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව ව්‍යාපාර මතය පිරිහී ඇති බව ද අර්ථ නිරූපණය වේ.

**ව්‍යාපාර මතය පිළිබඳ දර්ශකයන්හි උපනති**

2014 දෙවන කාර්තුවේ සිට පවත්වන ලද ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයන්හි ප්‍රතිඵලවලට අනුව (රූප සටහන වි.ස. 3.1 සහ සංඛ්‍යා සටහන වි.ස. 3.1), 2015 දී ව්‍යාපාර තත්ත්වය පිළිබඳ දර්ශකය සියයට වඩා වැඩි අගයක පැවතීමෙන් සමස්ත ව්‍යාපාර තත්ත්වය පිළිබඳ මතය ධනාත්මකව පැවැතුණු බව පිළිබිඹු වේ. මේ අතර, ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ පූර්ව දැනුම්දීමේ දර්ශකයන් වන විකුණුම් සහ ඉල්ලුම් ද 2015 තුළ දී ධනාත්මකව පැවැතුණි. 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී දර්ශක අගයන්හි මට්ටම සලකාබලන විට ලාභදායීත්ව දර්ශකයෙහි පසුබෑමත් සමග සමස්ත ව්‍යාපාර තත්ත්වයෙහි පසුබෑමක් නිරීක්ෂණය කළ හැක. එනමුත් 2015 වසරේ අවසාන භාගයේ දී සමස්ත ව්‍යාපාර තත්ත්වයෙහි ක්‍රමානුකූල වැඩි දියුණුවීමක් දක්නට ඇත. තවද, සාමාන්‍යයක් ලෙස ගත් විට, 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී ඉල්ලුමෙහි වැඩිවීමත් සමග ධාරිතා උපයෝජනය ඉහළ නැංවීමට ඇති පීඩනය වැඩිවීමක් පෙන්නුම් කරයි. වැඩිවන ඉල්ලුම සපුරාලීමට ශ්‍රම හිඟය ප්‍රධාන බාධකයක් ලෙස මෙම සමීක්ෂණයෙහි තොරතුරු ලබාදෙන්නන් සඳහන් කර ඇත. මෙය පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතා දර්ශකයෙහි පසුබෑමෙන් ද පිළිබිඹු වේ. පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය සඳහා ශ්‍රමිකයන්ගේ නිපුණතා සහ රැකියා යෝජකයන් අපේක්ෂා කරන නිපුණතා අතර පවතින නොගැලපීම බාධකයක් ලෙස සමහර ආයතන සඳහන් කළ අතර, තවත් සමහරක් පුහුණු ශ්‍රම සංක්‍රමණය අභියෝගයක් ලෙස සඳහන් කරන ලදී.

2016 පළමුවන කාර්තුවේ දී අපේක්ෂිත ව්‍යාපාරික තත්ත්වය පිළිබඳ මතය ධනාත්මක තත්ත්වයක පවතියි. එසේ වුවද, සමීක්ෂණය සඳහා තොරතුරු ලබා දෙන්නන් විසින් විදේශ වෙළඳපොළ අයහපත් ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වන අතරම ස්ථාවර ප්‍රතිපත්තිවල අවශ්‍යතාවයද අවධාරණය කරන ලදී.

**ඉදිරි දැක්ම**

ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි සාර්ථකත්වය රඳා පවතිනුයේ දත්ත ලබාදෙන්නන්ගේ එනම් සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ගේ දායකත්වය මතය. ආර්ථික තත්ත්වය ගැන පූර්ව දැනුම් දීමේ දර්ශකයන් ගොඩනැගීම සඳහා ආර්ථික නියෝජිතයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර සන්නිවේදන මාර්ගයක් නිර්මාණය කිරීමට මෙම සමීක්ෂණයට හැකියාව ලැබී ඇත. තවද, මෙම සමීක්ෂණය තුළින් ප්‍රතිපත්ති සහ එහි දිශාව සම්බන්ධයෙන් ආර්ථික නියෝජිතයන්ගේ මතය පිරික්සීමට ද හැක. එබැවින්, ව්‍යාපාරික අපේක්ෂා අධ්‍යයනය තුළින් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රවණතා හඳුනාගැනීම සඳහා නිවැරදි තොරතුරු කලට වේලාවට ලබාදීම ඉතා වැදගත් වේ. මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ප්‍රතිඵල ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි කාර්තුමය පදනමින් ප්‍රකාශයට පත් කරයි. මෙම තොරතුරු සඳහා www.cbsl.gov.lk/htm/english/08_stat/s_8.html තුළින් ප්‍රවේශ විය හැක.

**සංඛ්‍යා සටහන වි.ස. 3.1**

**ව්‍යාපාර මතය පිළිබඳ දර්ශක (අ)**

| දර්ශකය | 2014 | | | 2015 | | | | 2016 |
|---|---|---|---|---|---|---|---|---|
| | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | Q1 අපේක්ෂා |
| ව්‍යාපාර තත්ත්වය | 120 | 136 | 126 | 107 | 111 | 111 | 122 | 121 |
| පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය (පෙර වසරට සාපේක්ෂව) | 73 | 101 | 90 | 102 | 84 | 100 | 76 | 86 |
| ඉල්ලුම (පෙර වසරට සාපේක්ෂව) | 131 | 137 | 136 | 122 | 139 | 129 | 146 | 137 |
| විකුණුම් (පෙර වසරට සාපේක්ෂව) | 134 | 127 | 140 | 123 | 145 | 142 | 142 | 138 |
| ධාරිතා උපයෝජනය (පෙර වසරට සාපේක්ෂව) | 128 | 122 | 138 | 131 | 134 | 138 | 124 | 126 |
| ලාභදායිත්වය (පෙර කාර්තුවට සාපේක්ෂව) | 85 | 120 | 117 | 97 | 97 | 106 | 112 | 100 |

(අ) 2014 දෙවන කාර්තුවෙහි සිට 2015 හතරවන කාර්තුව දක්වා පවත්වන ලද ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයන්හි ප්‍රතිඵල මත පදනම් වේ. නවතම ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය වන 2015 හතරවන කාර්තුව සඳහා වූ සමීක්ෂණය 2015 දෙසැම්බර් 21 සිට 2016 ජනවාරි 11 දක්වා සිදු කරන ලදී.

කාණ්ඩයේ විශාලතම ක්‍රියාකාරකම වන වෙනත් පෞද්ගලික සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.7 ක වර්ධනයට සාපේක්ෂව මන්දගාමී ලෙස වුවද, 2015 වසරේ දී සියයට 2.9 කින් ප්‍රසාරණය වීම මෙම ආර්ථික කටයුතුවල සමස්ත වර්ධනයට මූලික වශයෙන් දායක වී ඇත. මෙහිදී නිර්මාණාත්මක කලාවන් හා විනෝදාස්වාදය සැපයීමේ සේවා, ඡායාරූපකරණය, කේෂාලංකරණය හා වෙනත් රූපලාවණ්‍ය සත්කාර සේවා, රෙදිපිළි සේදීම් කටයුතු වැනි ක්‍රියාකාරකම්වල සාමූහික වර්ධනය වෙනත් පෞද්ගලික සේවාවන් යටතේ මූලිකව සලකා බලනු ලැබේ. කෙසේ වුවද, 2014 වසරේදී සියයට 2.8 ක වර්ධනයක් වාර්තා කළ වෘත්තීයමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා සහායක සේවා

ආශ්‍රිත ක්‍රියාකාරකම් 2015 වසරේ දී සියයට 7.1 කින් පහත වැටිණි. මෙහිදී ගෘහ නිර්මාණකරණය හා ඉංජිනේරු සේවා ක්‍රියාකාරකම්, තාක්ෂණික පරීක්ෂාවන් හා විශ්ලේෂණයන්, නීති හා ගිණුම්කරණ ක්‍රියාකාරකම්, විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධන කටයුතු මෙන්ම ප්‍රචාරණය හා වෙළඳපොළ පර්යේෂණ වැනි ඉහළ එකතු කළ අගයක් ජනනය කිරීමට විභවතාවයක් ඇති සේවාවන්වල ක්‍රියාකාරකම් පිළිබඳව සලකා බලනු ලැබේ.

### රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සමාජ සේවාවන්

රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, **සෞඛ්‍ය හා සමාජ සේවාවන් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම, 2014 වසරේ දී වාර්තා කළ සියයට 5.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 3.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම වර්ධනය සඳහා 2014 වසරේ දී සියයට 5.2 ක වර්ධනයක් වාර්තා කළ රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය ආශ්‍රිත ක්‍රියාකාරකම් 2015 වසරේ දී සියයට 6.9 කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක වී ඇත. එසේම, සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් හා සමාජ සේවාවන් 2014 වසරේ දී වාර්තා කළ සියයට 1.0 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.5 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වුවද, 2014 වසරේ දී සියයට 10.3 කින් වර්ධනය වූ අධ්‍යාපන කටයුතුවල දළ එකතු කළ අගය මත වටිනාකම 2015 වසරේ දී සියයට 7.5 කින් පහත වැටීම මෙම කාණ්ඩයේ සමස්ත වර්ධනයට අයහපත් ලෙස බලපා ඇත.

## 2.5 වියදම

දේශීය පරිභෝජනය සහ ආයෝජන වියදම **තුළින් ජනනය වන දළ දේශීය වියදම (ද.දේ.වි.) 2015 වසරේ දී නාමික වශයෙන් රුපියල් බිලියන 12,013.7 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** ඒ අනුව, ද.දේ.වි. 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.3 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.5 කින් වර්ධනය විය. මේ සඳහා මූලික වශයෙන් පරිභෝජන වියදමෙහි පැවැති වර්ධනය හේතු වූ අතර, ආයෝජන වියදම ද සුළු වශයෙන් වර්ධනය විය. මූර්ත වශයෙන් සැලකූ විට ද මූලික වශයෙන් පරිභෝජන වියදමේ වර්ධනය දායක කොටගෙන ද.දේ.වි. 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.3 කින් වර්ධනය වී ඇත. මේ අතර, රුපියල් වටිනාකම අනුව 2014 වසරේ දී සියයට 1.2 කින් පහත වැටුණු ශුද්ධ විදේශීය ඉල්ලුම, ආනයන සියයට 3.5 කින් වර්ධනය වන අතරතුර දී අපනයන සියයට 5.1 කින් වර්ධනය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස 2015 වසරේ දී සියයට 0.7 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ

**2.10 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම (අ)**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළඳපොළ මිල අනුව | | | 2010 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 (ආ) | 2015 (ආ) | 2013 | 2014 (ආ) | 2015 (ආ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 7,229,352 | 7,943,796 | 8,652,180 | 5,881,197 | 6,216,685 | 6,645,913 |
| (% වෙනස) | 13.7 | 9.9 | 8.9 | 7.0 | 5.7 | 6.9 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,189,326 | 3,341,174 | 3,361,546 | 2,597,115 | 2,782,904 | 2,920,219 |
| (% වෙනස) | -6.5 | 4.8 | 0.6 | -8.8 | 7.2 | 4.9 |
| **මුළු දේශීය ඉල්ලුම** | **10,418,678** | **11,284,971** | **12,013,727** | **8,478,312** | **8,999,589** | **9,566,132** |
| **(% වෙනස)** | **6.7** | **8.3** | **6.5** | **1.6** | **6.1** | **6.3** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 1,949,158 | 2,185,039 | 2,295,423 | 1,470,967 | 1,533,668 | 1,605,147 |
| (% වෙනස) | 12.6 | 12.1 | 5.1 | 6.6 | 4.3 | 4.7 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 2,775,711 | 3,021,530 | 3,125,930 | 2,103,077 | 2,304,271 | 2,548,455 |
| (% වෙනස) | 0.3 | 8.9 | 3.5 | -1.5 | 9.6 | 10.6 |
| **ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-826,553** | **-836,492** | **-830,507** | **-632,110** | **-770,603** | **-943,307** |
| **(% වෙනස)** | **20.2** | **-1.2** | **0.7** | **16.4** | **-21.9** | **-22.4** |
| **3. මුළු ඉල්ලුම** | **9,592,125** | **10,448,479** | **11,183,220** | **7,846,202** | **8,228,986** | **8,622,825** |
| **(% වෙනස)** | **9.8** | **8.9** | **7.0** | **3.4** | **4.9** | **4.8** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සඳහා විශේෂයෙන්ම ඛනිජ තෙල් ද ඇතුළුව වෙළඳ ද්‍රව්‍යවල ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් පහළ යෑම හේතුවෙන් අපනයන ද්‍රව්‍ය සඳහා වූ මිල ගණන්වලට වඩා වැඩි වේගයකින් ආනයන ද්‍රව්‍ය සඳහා වූ මිල ගණන් පහත වැටීම මෙන්ම ශුද්ධ සේවා අපනයනය නාමික වශයෙන් ඉහළ යෑම ද ඉවහල් විය. කෙසේ වුවද, වෙළඳපොළ මිල ගණන් පහත වැටීම සහ පාරිභෝගිකයන්ගේ වැය කළ හැකි ආදායම ඉහළ යෑම හේතුවෙන් ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉල්ලුම පහළ යෑමත් සමග අපනයන මන්දගාමී ලෙස වර්ධනය වීම, මූර්ත වශයෙන් සැලකූ විට ශුද්ධ අපනයනය පහත වැටීමට හේතු විය. විදේශීය ඉල්ලුමේ දක්නට ලැබුණු මෙම ප්‍රවණතාවය පිළිබිඹු කරමින් අපනයන පරිමා දර්ශකයට සාපේක්ෂව ඉහළ වේගයකින් ආනයන පරිමා දර්ශකය වර්ධනය වී ඇත. වටිනාකම අනුව මෙන්ම ප්‍රමාණය අනුව ද ආනයන වර්ධනය වීම සඳහා පාරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළ යෑම ප්‍රධාන ලෙස දායක විය. අන්තර් භාණ්ඩ ආනයනය ප්‍රමාණාත්මකව සැලකූ විට මන්දගාමී ලෙස වර්ධනය වූ අතර, වටිනාකම අනුව පහත වැටීමක් දක්නට ලැබුණි. මේ අතරතුර දී, වටිනාකම අනුව මෙන්ම ප්‍රමාණාත්මකව ද, කාර්මික භාණ්ඩ අපනයනය 2015 වසරේ දී වර්ධනය වූ අතර, කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය හා ඛනිජ ද්‍රව්‍ය අපනයනය පහත වැටිණි. ඒ අනුව, ද.දේ.වි. ශුද්ධ අපනයනවලට ගැලපීමෙන් ලැබෙන වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2015 වසරේ දී රුපියල් බිලියන 11,183.2 ක් දක්වා සියයට 7.0 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ද.දේ.නි. මූර්ත වශයෙන් සියයට 4.8 කින් වර්ධනය වීම මෙන්ම ද.දේ.නි. ගම්‍ය අවධමනකය සියයට 2.1 කින් වර්ධනය වීම දායක විය.

### පරිභෝජනය

ආර්ථිකයේ ප්‍රධානතම වියදම් සංරචකය වන **පරිභෝජන වියදම, 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 8,652.2 ක් දක්වා සියයට 8.9 කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 88.6 කට දායකත්වය දක්වන පෞද්ගලික පරිභෝජන වියදමෙහි වර්ධනය හේතු විය. ඒ අනුව, පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 8.4 කින් වර්ධනය විය. වැය කළ හැකි ආදායම ඉහළ යෑම, ලෝක වෙළඳපොළ මිල ගණන් පහළ යෑම මෙන්ම ඇතැම් බදු සංශෝධන ද පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ඉල්ලුම වර්ධනය වීමට හේතු විය. පරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු මෙම වර්ධනය පාරිභෝගික භාණ්ඩ ආනයන දර්ශකයේ ඉහළ වර්ධනය මඟින් ද පිළිබිඹු වූ අතර, මෙහිදී විශේෂයෙන්ම වාහන සහ සන්නිවේදන උපකරණ ආනයනයේ ඉහළ යෑමක්

**2.11 සංඛ්‍යා සටහන** — **පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)**

| | කාණ්ඩය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 (ආ) | 2015 (ආ) | 2014 (ආ) | 2015 (ආ) |
| 1. | ආහාරපාන සහ මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය | 26.3 | 25.6 | 26.8 | 6.2 | 13.6 |
| 2. | මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය | 1.9 | 1.9 | 1.9 | 8.7 | 10.3 |
| 3. | ඇඳුම්-පැළඳුම් සහ පාවහන් | 4.3 | 3.9 | 3.8 | -1.7 | 5.7 |
| 4. | නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් | 10.6 | 10.6 | 10.9 | 9.0 | 11.5 |
| 5. | ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන් | 1.3 | 1.3 | 1.2 | 10.2 | 0.9 |
| 6. | සෞඛ්‍යය | 2.8 | 2.6 | 2.9 | 1.3 | 22.1 |
| 7. | ප්‍රවාහනය | 20.9 | 21.9 | 22.3 | 14.5 | 10.3 |
| 8. | සන්නිවේදනය | 0.9 | 0.9 | 1.0 | 6.6 | 17.9 |
| 9. | ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු | 1.1 | 1.3 | 1.4 | 22.2 | 15.7 |
| 10. | අධ්‍යාපනය | 1.6 | 1.7 | 1.6 | 17.2 | -0.3 |
| 11. | හෝටල් සහ ආපනශාලා පහසුකම් | 4.4 | 4.3 | 4.0 | 7.3 | -1.1 |
| 12. | වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම | 24.8 | 26.1 | 24.9 | 14.6 | 3.6 |
| 13. | ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 2.5 | 2.5 | 2.7 | 7.3 | 16.5 |
| 14. | අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 3.5 | 4.5 | 5.3 | 42.7 | 27.4 |
| | **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **9.1** | **8.4** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දක්නට ලැබුණි. මේ අතර, රාජ්‍ය පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 16.6 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 13.4 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සඳහා වන රාජ්‍ය වියදම් ඇතුළත් වන රජයේ පුද්ගල පරිභෝජන වියදම් කාණ්ඩයේ වර්ධනය දායක වූ අතර, සාමාන්‍ය රජයේ සේවාවන් සඳහා වූ වියදම ඉහළ යෑම මූලික කොටගෙන රජයේ සමූහ පරිභෝජන වියදම ද ඉහළ යනු දක්නට ලැබුණි.

**පෞද්ගලික පරිභෝජන වියදම සඳහා ප්‍රධානතම දායකත්වය දක්වන ආහාරපාන සහ මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය කාණ්ඩය 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 13.6 කින් වර්ධනය විය.** මෙම කාණ්ඩයේ වියදම් ඉහළ යෑම කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (2006/07=100) ආහාර සඳහා වූ උද්ධමනය 2014 වසරේ දී වාර්තා කළ සියයට 3.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.9 ක් දක්වා ඉහළ යෑම තුළින් ද පිළිබිඹු විය. ඒ අනුව, පෞද්ගලික පරිභෝජන වියදම සඳහා මෙම කාණ්ඩයේ දායකත්වය 2014 වසරේ දී වාර්තා කළ සියයට 25.6 ක අගයේ සිට 2015 වසරේ දී සියයට 26.8 ක් දක්වා වර්ධනය වී ඇත.

**මේ අතරතුර දී, මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන හා වෙනත් මත්ද්‍රව්‍ය කාණ්ඩය සහ ඇඳුම් පැළඳුම් හා පාවහන් යන කාණ්ඩ පෞද්ගලික පරිභෝජන වියදම සඳහා දක්වන ලද දායකත්වය පහළ මට්ටමක පැවතුණි.** මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන හා වෙනත් මත්ද්‍රව්‍ය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.7 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 10.3 කින් ඉහළ ගියේය. තවද, 2014 වසරේ දී සියයට 1.7 කින් පහත වැටුණු ඇඳුම්-පැළඳුම් සහ පාවහන් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම් 2015 වසර තුළ දී සියයට 5.7 කින් වර්ධනය විය. 2015 වසර තුළ දී රෙදිපිළි හා උපාංග ආනයනය සැලකිය යුතු ලෙස වර්ධනය වීම තුළින් ද මෙම ප්‍රවණතාවය පිළිබිඹු විය.

**නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.0 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 11.5 කින් වර්ධනය විය.** 2014 වසරේ සැප්තැම්බර් මාසයේ දී සිදුකරන ලද විදුලිය ගාස්තු සංශෝධනයෙහි බලපෑම 2015 වසර සඳහා ද පැවැති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු විදුලි ඒකක ප්‍රමාණයක් පරිභෝජනය කරන පාරිභෝගිකයන් විදුලිය ඒකකයක් සඳහා දරන පිරිවැය පහළ යන ලදී. තවද, වසර තුළ දී විදුලිය පරිභෝජනයෙහි ඉහළ යෑමක් පෙන්නුම් කරමින් ගෘහස්ථ අංශය සඳහා වූ විදුලිබල අලෙවිය සියයට 9.7 කින් වර්ධනය විය. විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය ඉහළ යෑම සහ විදුලිය භාවිතා කළ යුතු විවිධාකාර ගෘහස්ථ පරිභෝජන ක්‍රියාකාරකම් ඉහළ යෑම ද මෙම වර්ධනය සඳහා හේතු විය. තවද, 2014 වසරේ නොවැම්බර් මාසයේ දී සිදු කරන ලද ජල ගාස්තු පහළ දැමීම 2015 වසරට සඳහා ද බලපාන ලද අතර, ජල පරිභෝජනය ද මෙම වසරේ දී තවදුරටත් පුළුල් විය. මේ අතරතුර දී, ඩීසල්, පෙට්‍රල් සහ ද්‍රව පෙට්‍රෝලියම්, ගෑස් වැනි සේවාවන්හි පාලිත මිල ගණන් අඩු කිරීම මෙම කාණ්ඩය සඳහා වූ පෞද්ගලික පරිභෝජන පිරිවැය අඩු කරමින් ඉල්ලුම වර්ධනය වීමට දායක විය.

**ප්‍රවාහන කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 14.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 10.3 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම කාණ්ඩය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම මන්දගාමී වීම කෙරෙහි 2015 වසරේ පෙබරවාරි මාසයේ දී මගී ප්‍රවාහන ගාස්තු සියයට 8.2 කින් පමණ පහත දැමීම හේතු විය. තවද, වසර තුළ දී ඉන්ධන මිල ගණන් අඩු කිරීම ද ප්‍රවාහන වියදම අඩු වීමට දායක විය. කෙසේ වුවද, වසර තුළ දී මෝටර් රථ සහ මෝටර් සයිකල් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, වසරේ අවසාන භාගය වන විට මෙම වර්ධනයේ යම් මන්දගාමීත්වයක් දක්නට ලැබුණි.

**2015 වසරේ දී සෞඛ්‍ය කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම සියයට 22.1 කින් ඉහළ ගිය අතර, අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික පරිභෝජන වියදම සියයට 0.3 කින් පහත වැටිණි.** රජය විසින් අධ්‍යාපනික සහ සෞඛ්‍ය සේවාවන් නොමිලයේ හෝ සහනදායී මිලට සැපයීම සඳහා සිය අවසන් පරිභෝජන වියදමෙන් සියයට 30 ක් පමණ පුද්ගල පරිභෝජන වියදම් යටතට ගැනෙන සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා සඳහා වාර්ෂිකව වැය කරයි. මෙය මෙම කාණ්ඩය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම ප්‍රතිශතයක් ලෙස අඩු අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම ප්‍රවණතාවය නිෂ්පාදන ඇස්තමේන්තුවල අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන්හි දළ එකතු කළ අගය සඳහා ප්‍රධානතම දායකත්වය රජය විසින් සැපයීම තුළින් ද පිළිබිඹු වේ.

**සන්නිවේදන කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 17.9 කින් වර්ධනය විය.** දුරකථන සහ අන්තර්ජාල සේවා සබඳතාවන්හි අඛණ්ඩ වර්ධනය තුළින් පිළිබිඹු වන විදුලි සංදේශ සේවා සඳහා ඇති ඉහළ ඉල්ලුම මෙම වර්ධනය සඳහා දායක විය. 2014 වසරේ අගෝස්තු මාසයේ

සිට තැපැල් ගාස්තු ඉහළ දැමීම, තැපැල් සේවාවන් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම ඉහළ යෑමට හේතු විය. රට තුළ සන්නිවේදන උපකරණ භාවිතය සඳහා ඇති ඉහළ ඉල්ලුම 2015 වසර තුළ දී සන්නිවේදන උපාංග සඳහා වූ ආනයන වටිනාකම් දර්ශකය සියයට 67.2 කින් ඉහළ යෑම තුළින් ද පිළිබිඹු වේ.

**ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 22.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 15.7 කින් වර්ධනය විය.** ජනතාවගේ වැය කළ හැකි ආදායම ඉහළ යෑම, ප්‍රවාහන පද්ධතියේ සහ මාර්ග පහසුකම්වල ප්‍රගමනය, ඉන්ධන මිල පහළ යෑම සමග පෞද්ගලික වාහන භාවිතය ඉහළ යෑම සහ රට තුළ පවතින සාමකාමී වාතාවරණය හේතුවෙන් ගමනා ගමන කටයුතු පහසු වීම යනාදිය විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැපයීමේ සේවාවන් සඳහා වූ ඉල්ලුම වර්ධනය වීමට හේතු විය.

**රජයේ පරිභෝජන වියදම, රජය විසින් මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා සමස්තයක් ලෙස දරනු ලබන රජයේ සමූහ පරිභෝජන වියදම සහ එක් එක් පුද්ගලයින්ගේ ප්‍රතිලාභය සඳහා රජය විසින් දරනු ලබන වියදම් වන රජයේ පුද්ගල පරිභෝජන වියදමෙන් සමන්විත වේ.** 2015 වසරේ දී රජයේ මුළු පරිභෝජන වියදමෙන් සියයට 67.6 කට දායකත්වය දක්වන ලද රජයේ සමූහ පරිභෝජන වියදම සඳහා සාමාන්‍ය රජයේ සේවාවන්, ආරක්ෂාව, නීතිය සහ සාමය, ආර්ථික කටයුතු, පරිසර ආරක්ෂාව, නිවාස හා පොදු පහසුකම්, ක්‍රීඩා, විනෝදාංශ, ආගමික හා සංස්කෘතික කටයුතු සහ සමාජ ආරක්ෂාව සඳහා වන වියදම් අන්තර්ගත වේ. රජයේ සමූහ පරිභෝජන වියදම 2014 වසර තුළ දී නාමික වශයෙන් වාර්තා කළ සියයට 17.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසර තුළ දී සියයට 9.5 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් 2015 වසරේ දී වැටුප් ද ඇතුළුව සාමාන්‍ය රජයේ සේවාවන් සඳහා වන රජයේ පරිභෝජන වියදම සියයට 33.6 කින් වර්ධනය වීම සහ සමාජ ආරක්ෂාව සඳහා වියදම සියයට 15.4 කින් වර්ධනය වීම දායක විය. කෙසේ වුවද, ආරක්ෂාව සහ නීතිය හා සාමය ආදී ප්‍රධාන රාජ්‍ය පරිභෝජන වියදම් කාණ්ඩ 2015 වසර තුළ දී අඩු වේගයකින් වර්ධනය වූ අතර, ආර්ථික කටයුතු සහ ක්‍රීඩා, විනෝදාංශ, ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා රජයේ වියදම පහත වැටෙනු දක්නට ලැබුණි. මේ අතරතුර දී, සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා වන වියදම්වලින් සමන්විත වන රජයේ පුද්ගල පරිභෝජන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 15.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 22.6 කින් වර්ධනය විය. ඒ අනුව, රජයේ පුද්ගල පරිභෝජන වියදම රජයේ මුළු පරිභෝජන වියදමෙන් සියයට 32.4 ක් නියෝජනය කරන ලදී. මේ සඳහා අධ්‍යාපනය සඳහා වූ රාජ්‍ය වියදම ප්‍රධාන දායකත්වය දක්වන ලදී. ඒ අනුව, 2014 වසරේ දී පිළිවෙළින් සියයට 12.5 ක හා සියයට 18.1 ක වර්ධනයන් වාර්තා කළ අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා වන රජයේ පරිභෝජන වියදම් 2015 වසරේ දී පිළිවෙළින් සියයට 28.4 කින් හා සියයට 16.1 කින් වර්ධනය විය.

## ආයෝජන

**පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයෝජනවලින් සමන්විත වන ආයෝජන වියදම 2014 වසරේ දී නාමික වශයෙන් වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 0.6 කින් වර්ධනය විය.** මෙහිදී යන්ත්‍රසූත්‍ර සහ යුධමය ආම්පන්න සඳහා වන වියදම 2014 වසරේ දී වාර්තා කළ සියයට 4.1 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.8 කින් වර්ධනය විය. 2015 වසර තුළ දී වටිනාකම අනුව යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන දර්ශකය යහපත් ප්‍රවණතාවයක් පෙන්වීම තුළින් ද මෙම වර්ධනය පිළිබිඹු විය. මේ අතරතුර දී, 2014 වසරේ දී සියයට 7.3 කින් පහත වැටුණු ඉදිකිරීම් සඳහා වූ වියදම 2015 වසරේ දී සියයට 2.3 කින් වර්ධනය විය. මෙහිදී 2014 වසරේ දී පහත වැටුණු ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය 2015 වසරේ දී යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. එසේම, වාණිජ බැංකු මගින් ඉදිකිරීම් කටයුතු සඳහා පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණය ප්‍රමාණය ද සැලකිය යුතු ලෙසින් ඉහළ යෑමෙන් පෞද්ගලික අංශය විසින් ඉදිකිරීම් කටයුතු සඳහා දක්වන අඛණ්ඩ දායකත්වය පිළිබිඹු වෙයි. කෙසේ වුවද, රාජ්‍ය ආයෝජන මත පදනම් වන ඇතැම් මහා පරිමාණ ඉදිකිරීම් කටයුතු ප්‍රතිඇගයීම් කිරීම 2015 වසරේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී වීමට බලපාන ලදී. මේ අතර, ප්‍රවාහන උපකරණ සඳහා වන ආයෝජන 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 1.0 කින් වර්ධනය විය. එසේම, තොරතුරු තාක්ෂණ උපකරණ, වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත් මෙන්ම බුද්ධිමය දේපළ යන අළුතෙන් අන්තර්ගත කරන ලද වියදම් කාණ්ඩ, ආයෝජන කටයුතු වර්ධනය සඳහා ධනාත්මකව දායක විය. කෙසේ වුවද, තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම් වසර තුළ දී නාමික වශයෙන් පහත වැටීම ආයෝජන වර්ධනය සඳහා අහිතකර ලෙස බලපාන ලදී.

**2.12 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 (අ) | 2015 (ආ) | 2014 (අ) | | | 2015 (ආ) | | | 2014 (අ) | 2015 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ)** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 214 | 233 | 229,235 | 172,544 | 401,780 | 186,252 | 243,054 | 429,305 | 34,216 | 34,275 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 187 | 217 | 217,041 | 172,207 | 389,247 | 184,409 | 241,688 | 426,096 | 30,938 | 33,502 |
| 16 වන වගන්තිය යටතේ | 27 | 16 | 12,195 | 338 | 12,533 | 1,843 | 1,366 | 3,209 | 3,278 | 773 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 152 | 150 | 98,942 | 164,627 | 263,569 | 147,510 | 135,122 | 282,632 | 25,476 | 22,516 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ) | 1,951 | 1,989 | 1,133,006 | 622,696 | 1,755,702 | 1,236,251 | 755,557 | 1,991,808 | 484,675 | ලැ.නො. |
| වාණිජ කටයුතු වල නිරතවූ ව්‍යාපෘති (ඈ) | 2,748 | 2,823 | 425,027 | 4,127,910 | 4,552,973 | 452,541 | 4,150,540 | 4,603,081 | 412,658 | 421,967 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 2,030 | 2,097 | 402,038 | 4,117,317 | 4,519,356 | 417,950 | 4,139,766 | 4,557,716 | 375,735 | 384,809 |
| 16 වන වගන්තිය යටතේ | 718 | 726 | 22,989 | 10,593 | 33,582 | 34,591 | 10,774 | 45,365 | 36,923 | 37,158 |
| **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය** ලියාපදිංචි වූ සමාගම් (ඈ) | 2,192 | 2,276 | - | - | 203,764 | - | - | 204,522 | 306,781 | 311,698 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත


සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධාන වලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත 2015 වසරේ දී ලැබුණු සමස්ත විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය, ණය ද ඇතුළත්ව එ.ජ. ඩොලර් මිලියන 969.7 ක් වූ අතර, එය 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,528.4 ට සාපේක්ෂව සියයට 36.6 ක පමණ පසුබෑමක් පෙන්නුම් කරයි.** යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ලැබීම් සියයට 33.6 කින් ද, සේවා අංශයේ කටයුතු සඳහා ලැබීම් සියයට 49.6 කින් ද පහළ යෑම මෙම කාලය තුළ දී ආයෝජන ලැබීම් පහත වැටීමට ප්‍රධාන හේතුව විය. නිෂ්පාදන කර්මාන්ත අංශය වෙත ලැබුණු විදේශීය සෘජු ආයෝජනයන් ද සියයට 23.0 කින් පහත වැටුණි. මෙම කාලය තුළ ලද විදේශීය සෘජු ආයෝජනවලින් බහුතරය නිවාස සහ දේපල සංවර්ධන කටයුතු ඇතුලත්ව යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති සඳහා වන අතර, එය සමස්ත විදේශීය සෘජු ආයෝජනයන්ගෙන් සියයට 46.8 ක් පමණ (එ.ජ. ඩොලර් මිලියන 453.4 ක්) වේ. 2015 වසරේ දී ලැබුණු සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින් සියයට 26.5 ක් පමණ නියෝජනය කරමින් නිෂ්පාදන කර්මාන්ත අංශයේ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 257.0 ක් වූ අතර, සේවා අංශයේ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින් සියයට 26.3 ක් (එ.ජ. ඩොලර් මිලියන 255.4 ක්) පමණ විය.

**2.7 රූප සටහන**

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායයන් හි විදේශීය සෘජු ආයෝජන (අ) (එ.ජ.ඩොලර් මිලියන)**





(අ) ණය ද ඇතුළත්ව

**ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වන වගන්ති යටතේ 2015 වසරේ දී අනුමත කළ ව්‍යාපෘති වෙත ලැබුණු සමස්ත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 429.3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** සේවා අංශය සහ ඇඟලුම් හා සම් නිෂ්පාදිත අංශයන් සඳහා අනුමත කරන ලද ආයෝජන වටිනාකම 2015 වසරේ දී සුළු වශයෙන් පහත වැටුණු අතර, ලෝහ නොවන


ඛනිජ නිෂ්පාදිත අංශයේ අනුමත ව්‍යාපෘති සඳහා වූ ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණය ද 2014 වසරට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමකින් පහත වැටුණි. කෙසේ වුවද, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත අංශවල ව්‍යාපෘතීන් සඳහා ලැබුණු ඇස්තමේන්තුගත ආයෝජන පසුගිය වසරට සාපේක්ෂව ඉහළ අගයක් වාර්තා කළේය. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 282.6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2014 වසරට සාපේක්ෂව සියයට 7.2 ක වර්ධනයකි. 2015 වසර අවසානය වන විට ආයෝජන මණ්ඩල පනතේ 16 වන සහ 17 වන වගන්ති යටතේ වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 4,603.1 ක් විය. ආයෝජන මණ්ඩලය යටතේ දැනට සිදු කර ඇති ආයෝජනවල සමුච්චිත අගය 2015 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,991.8 ක් විය.

**2.8 රූප සටහන** — **2015 වසරේ ආර්ථිකය (පවත්නා වෙළඳපොළ මිල අනුව)**

**භාණ්ඩ හා සේවා සැපයුම (අ) (රුපියල් බිලියන 14,309)**




**භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම (අ) (රුපියල් බිලියන 14,309)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

**2.13 සංඛ්‍යා සටහන** — **සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 |
| 1. සම්පත් | | | | |
| වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | 77.6 | 78.2 | 8.9 | 7.0 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 22.4 | 21.8 | 8.9 | 3.5 |
| **එකතුව** | **100.0** | **100.0** | **8.9** | **6.2** |
| 2. උපයෝජනය | | | | |
| පරිභෝජනය | 59.0 | 60.5 | 9.9 | 8.9 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 20.9 | 20.5 | 0.0 | 4.3 |
| තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම | 4.0 | 3.0 | 40.3 | -18.8 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 16.2 | 16.0 | 12.1 | 5.1 |
| **එකතුව** | **100.0** | **100.0** | **8.9** | **6.2** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## පවත්නා සම්පත් සහ උපයෝජනය

ආර්ථිකයේ පවත්නා සම්පත් ප්‍රමාණය, 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.2 කින් වර්ධනය වෙමින් නාමික වශයෙන් රුපියල් බිලියන 14,309.1 ක් දක්වා අඛණ්ඩව ඉහළ යන ලදී. මෙලෙස ආර්ථිකයේ පවත්නා සම්පත් ප්‍රමාණයේ වර්ධනය මන්දගාමී වීම 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළ දී ද.දේ.නි. මෙන්ම විදේශ සම්පත් ද නාමික වටිනාකම අනුව අඩු වේගයකින් වර්ධනය වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. දේශීය සම්පත්වල වර්ධනය සඳහා කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ආර්ථිකයේ සියලුම ප්‍රධාන නිෂ්පාදන කටයුතු ධනාත්මකව දායක විය. වටිනාකම අනුව ආනයන මන්දගාමී වීම කෙරෙහි ලෝක වෙළඳපොළ භාණ්ඩ මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන වැනි බොහෝ ප්‍රධාන ආනයන, වටිනාකම අනුව පහත වැටීම ද හේතු විය. මේ හේතුවෙන් ඉල්ලුම සපුරාලීම සඳහා නාමික වටිනාකම අනුව දේශීය සම්පත්වල දායකත්වය 2014 වසරේ වාර්තා කළ සියයට 77.6 සිට 2015 වසරේ දී සියයට 78.2 ක් දක්වා වර්ධනය විය. මූර්ත වශයෙන් ගත් කල, පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය 2014 වසර තුළ දී වාර්තා කළ සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 6.1 කින් වර්ධනය විය. මේ සඳහා මූර්ත වශයෙන් ද.දේ.නි. මෙන්ම විදේශීය සම්පත් වර්ධනය වීම ද දායක විය.

**පවත්නා සම්පත් ආර්ථිකයේ පරිභෝජන, ආයෝජන සහ අපනයන අවශ්‍යතා සපුරාලීම සඳහා උපයෝජනය කරන ලදී.** සමස්ත සම්පත් උපයෝජනයෙන් පරිභෝජන කටයුතු සඳහා සම්පත් උපයෝජනය 2014 වසරේ වාර්තා කළ සියයට 59.0 සිට 2015 වසරේ දී සියයට 60.5 ක් දක්වා වර්ධනය විය. මේ අතරතුර දී, අයෝජන අරමුණු සඳහා වූ සම්පත් උපයෝජනය 2015 වසරේ දී සියයට 23.5 ක් වූ අතර, එය 2014 වසරේ දී වාර්තා කළ සියයට 24.8 ක දායකත්වයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වීමකි. මේ සඳහා දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මෙන්ම තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් හා අත්හැරීම් සමස්තයක් ලෙස පහත වැටීම ද හේතු විය. කෙසේ වුවද, සමස්ත සම්පත් උපයෝජනයෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන 2014 වසරේ දී වාර්තා කළ සියයට 16.2 ක සිට 2015 වසරේ දී සියයට 16.0 ක් දක්වා පහත වැටිණි. මේ සඳහා මූලික වශයෙන් ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම හේතු විය.

### ඉතුරුම්

**දේශීය ඉතුරුම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 6.0 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 2,531.0 ක් දක්වා සියයට 1.1 කින් වර්ධනය විය.** දේශීය ඉතුරුම්වල වර්ධනය අඩු වීම සඳහා පෞද්ගලික ඉතුරුම් වර්ධනය මන්දගාමී වීම මෙන්ම රජයේ නිර්-ඉතුරුම් ඉහළ යෑම ද හේතු විය. රජයේ ආදායම් සාපේක්ෂව අඩු වර්ධනයක් පෙන්නුම් කරන අතර, පුනරාවර්තන වියදම් වැඩි වේගයකින් ඉහළ යෑම රජයේ නිර්-ඉතුරුම් පුළුල් වීමට හේතු විය. රජයේ ප්‍රධානතම පුනරාවර්තන වියදම් කාණ්ඩය වන වැටුප් හා වේතන, සැලකිය යුතු ලෙසින් වැඩි වීම රජයේ පුනරාවර්තන වියදම් වර්ධනය වීමට හේතු විය. මේ හේතුවෙන්, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී සියයට 24.0 ක් වූ දේශීය ඉතුරුම් 2015 වසර වන විට දී සියයට 22.6 දක්වා පහත වැටුණි.

**ජාතික ඉතුරුම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 7.5 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 3,113.2 ක් දක්වා සියයට 1.0 කින් වර්ධනය විය.** දේශීය ඉතුරුම් මන්දගාමී වීමට අමතරව වසර තුළ දී විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම අඩු වේගයකින් වර්ධනය වීම සහ විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම පහත වැටීම ද ජාතික ඉතුරුම් කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. ඒ අනුව, ජාතික ඉතුරුම් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී වාර්තා කළ සියයට 29.5 ක අනුපාතයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 27.8 ක් දක්වා පහත වැටිණි. කෙසේ වුවද, ආයෝජන වියදම්වල සැලකිය යුතු පහත වැටීම හේතුවෙන් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ඉතුරුම්-ආයෝජන පරතරය 2014 වසරේ දී වාර්තා කළ සියයට 2.5 ක අනුපාතයේ සිට 2015 වසරේ දී සියයට 2.2 ක් දක්වා පහත වැටිණි.

**2.14 සංඛ්‍යා සටහන** **පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| කාණ්ඩය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| 1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | 10,448,479 | 11,183,220 | 8.9 | 7.0 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 7,943,796 | 8,652,180 | 9.9 | 8.9 | 76.0 | 77.4 |
| පෞද්ගලික | 7,074,658 | 7,666,365 | 9.1 | 8.4 | 67.7 | 68.6 |
| රජය | 869,138 | 985,815 | 16.6 | 13.4 | 8.3 | 8.8 |
| 3. ආයෝජන | 3,341,174 | 3,361,546 | 4.8 | 0.6 | 32.0 | 30.1 |
| 4. දේශීය ඉතුරුම් | 2,504,682 | 2,531,040 | 6.0 | 1.1 | 24.0 | 22.6 |
| පෞද්ගලික | 2,632,374 | 2,777,819 | 8.3 | 5.5 | 25.2 | 24.8 |
| රජය | -127,692 | -246,779 | -88.5 | -93.3 | -1.2 | -2.2 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -836,492 | -830,507 | -1.2 | 0.7 | -8.0 | -7.4 |
| 6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -236,669(ඇ) | -251,288(ඇ) | -4.7 | -6.2 | -2.3 | -2.2 |
| 7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම | 813,128 | 833,498(ඇ) | 11.6 | 2.5 | 7.8 | 7.5 |
| 8. ජාතික ඉතුරුම් | 3,081,142 | 3,113,250 | 7.5 | 1.0 | 29.5 | 27.8 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයන්වලින් වෙනස් වනුයේ ගණනය කිරිමේදී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.15 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | | | | | 2015 | | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. නො. ගෘ. සේ. ආ.* අංශය | සමස්ත ආර්ථිකය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. නො. ගෘ. සේ. ආ.* අංශය | සමස්ත ආර්ථිකය |
| **සේවක ආදායම්** | **31.6** | **6.3** | **27.0** | **35.2** | **100.0** | **30.1** | **5.1** | **29.3** | **35.5** | **100.0** |
| **දළ මෙහෙයුම් අතිරික්තය** | **36.0** | **3.6** | **2.4** | **58.0** | **100.0** | **35.4** | **4.1** | **2.2** | **58.2** | **100.0** |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 40.1 | 4.3 | 1.3 | 54.3 | 100.0 | 39.6 | 4.9 | 1.1 | 54.4 | 100.0 |
| මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | 100.0 | - | - | - | 100.0 | 100.0 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 38.5 | 1.8 | 13.5 | 46.2 | 100.0 | 38.5 | 2.5 | 12.7 | 46.3 | 100.0 |
| **නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර)** | **91.3** | **8.4** | **-** | **0.3** | **100.0** | **92.0** | **7.8** | **-** | **0.3** | **100.0** |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **34.9** | **4.4** | **9.4** | **51.2** | **100.0** | **34.4** | **4.5** | **10.1** | **51.1** | **100.0** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
* ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.6 ආදායම

**ජාතික ගිණුම්කරණයේ ආදායම් ප්‍රවේශයේ ඇස්තමේන්තු මගින්, සලකන ලද කාලපරිච්ඡේදයක් තුළ දී රටේ ආර්ථිකය තුළ ආදායම් ජනනය කරන ලද සංරචක නිරූපණය කරයි.** සේවක ආදායම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදන ක්‍රියාවලිය මත වන සහනාධාර අඩු කරන ලද බදු එකතු කළ අගය මත වටිනාකමේ ආදායම් සංරචක ලෙස දැක්විය හැක. මෙම සංරචක අදාළ ආදායම් ජනනය කරන ආයතනික අංශවලට තවදුරටත් වර්ගීකරණය කළ හැක. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ශ්‍රමය සැපයීම වෙනුවෙන් පුද්ගලයන් හට හිමිවන්නා වූ ආදායම් සේවක ආදායම් මගින් නිරූපණය කරයි. ශ්‍රමය හැර අනෙකුත් නිෂ්පාදන සාධක මගින් ජනනය වන්නා වූ ආදායම දළ මෙහෙයුම් අතිරික්තය මගින් නිරූපණය වෙයි. එය ශුද්ධ මෙහෙයුම් අතිරික්තය, මිශ්‍ර ආදායම සහ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය යන සංරචකවලින් සමන්විත වේ. සලකා බලන කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා ලද ස්ථාවර ප්‍රාග්ධනයෙහි සිදු වූ වටිනාකමෙහි පහත වැටීම ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය මගින් නිරූපණය වන අතර, දළ මෙහෙයුම් අතිරික්තයෙන් මිශ්‍ර ආදායම සහ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩු කල විට ශුද්ධ මෙහෙයුම් අතිරික්තය ලබාගත හැකිය. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ගෘහස්ථ ශ්‍රමය උපයෝජනය කිරීම මගින් ගෘහ ඒකක අංශය ජනනය කරනු ලබන ආදායම මිශ්‍ර ආදායම වේ. එම නිසා, නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින ගෘහ ඒකක අංශය පමණක් මිශ්‍ර ආදායම ජනනය කරනු ලබයි. මුළු ආදායම සඳහා ආංශික දායකත්වය සලකා බැලූ විට, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය වැඩිම දායකත්වය දක්වන අතර, ඉන් අනතුරුව පිළිවෙළින් මූල්‍ය නොවන ආයතන, රාජ්‍ය සහ මූල්‍ය ආයතන යන අංශ සිය දායකත්වය ලබා දී ඇත.

**ආදායම සඳහා ප්‍රධාන දායකත්වය දළ මෙහෙයුම් අතිරික්තය මගින් ලබා දෙන ලද අතර, ඉන් අනතුරුව සේවක ආදායම් ප්‍රමුඛ දායකත්වයක් ලබාදෙන ලදී.** දළ මෙහෙයුම් අතිරික්තය 2014 වසරේ දී වාර්තා කළ සියයට 8.8 ක නාමික වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය විය. මෙම මන්දගාමී වර්ධනය සඳහා දළ මෙහෙයුම් අතිරික්තයෙහි ප්‍රධාන සංරචක වන ශුද්ධ මෙහෙයුම් අතිරික්තය හා ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 2014 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 9.3 ක හා සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 4.6 ක් හා සියයට 5.5 ක් ලෙස අඩු වේගයකින් වර්ධනය වීම හේතු විය. මේ අතර, මිශ්‍ර ආදායම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 8.5 කින් වර්ධනය විය. තවද, සේවක ආදායම් 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.4 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 8.4 කින් වර්ධනය විය. එසේම, නිෂ්පාදන ක්‍රියාවලිය මත වන සහනාධාර අඩු කරන ලද බදු ද ආදායම වර්ධනයට ධනාත්මක දායකත්වයක් දක්වන ලදී.

**2015 වසරේ දී ආර්ථිකයේ ආදායම ජනනය කිරීම සඳහා ප්‍රධානතම දායකත්වය ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය විසින් ලබා දෙන ලද අතර, දෙවනුව මූල්‍ය නොවන ආයතන අංශය දායක විය.** මෙහිදී දළ මෙහෙයුම් අතිරික්තය සඳහා සියයට 58.2 ක දායකත්වයක් ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය ලබා දී ඇති අතර, මූල්‍ය නොවන ආයතන අංශය සියයට 35.4 කට දායකත්වයක් ලබා දී ඇත. සේවක ආදායම් සැලකීමේ දී ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන සියයට 35.5 ක දායකත්වයක් සපයා ඇති අතර, මූල්‍ය නොවන ආයතන අංශය සියයට 30.1 කට දායකත්වය සපයා ඇත. තවද, රාජ්‍ය අංශය ද සේවක ආදායම් සඳහා සියයට 29.3 ක දායකත්වයක් ලබා දී ඇත. මේ අතරතුර දී, නිෂ්පාදන ක්‍රියාවලිය මත වන සහනාධාර අඩු කළ බදු සඳහා ඉහළ දායකත්වයක් මූල්‍ය නොවන ආයතන අංශය විසින් ලබා දී ඇත. මෙහිදී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය 2015 වසරේ දළ එකතු කළ අගය සඳහා සියයට 51.1 ක දායකත්වයක් දක්වා තිබුණ ද, මෙම අංශය නිෂ්පාදන ක්‍රියාවලිය මත වූ සහනාධාර අඩු කළ බදු ප්‍රමාණය සඳහා දක්වන දායකත්වය සියයට 0.3 ක් පමණක් විය.